# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## *WESTERN PROVINCE PROVINCIAL COUNCIL*

**2016 ජනවාරි 05** වන අඟහරුවාදා
2016 தை 05 செவ்வாய்க் கிழமை
Tuesday 05th January 2016

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை .ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.38 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.38 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.38 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලැබුවා වූ 2016 නව වසරේ පැවැත්වෙන පළමු සභා රැස්වීම් දිනය අදයි. සියලුම දෙනාට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනය කරනවා.

## නිවේදන
### ANNOUNCEMENTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"2015.12.31 දින සභා රැස්වීමේදී ගන්නා ලද තීරණයන්ට අනුව සභා සම්මත වී ඇති 2016 වර්ෂයේ මුදල් ප්‍රකාශය හා ඊට අදාළ 2015 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව ලබා දී ඇති බව ගරු ඔබතුමන්ලා වෙත දැනුම් දෙනවා."*

*ii*

*"අද දිනට යෙදී ඇති විශේෂ පොදු කටයුත්ත වනුයේ, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ "තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත" පිළිබඳව මෙම පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශනයක් ගරු ආණ්ඩුකාරතුමා මගින් අතිගරු ජනාධිපතිතුමාණන් වෙත ලබා දීමයි. 2015.12.22 දින මෙම සභාවේදී ගරු මන්ත්‍රීවරුන් කළ ඉල්ලීම අනුව, එම පනත් කෙටුම්පත පිළිබඳව සවිස්තරාත්මකව දැනුවත් කිරීමේ වැඩමුළුවක් ඊයේ 2016.01.04 වන දින පැවැත්වූවා.*

*ඒ වාගේම අද දින එම පොදු කටයුතු විෂයයේ වැඩ කටයුතු නියමානුකූලව නිමකර ගැනීමට හැකිවන පරිදි සභාවේ ගණපූරණය පවත්වා ගැනීමට ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීවරුන් කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වෙනවා."*

## කාරක සභා වාර්තා
### COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2015.12.23 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

## පෙත්සම්
### PETITIONS

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, රාජගිරිය, සපුමල් පෙදෙස, අංක 34 හි පදිංචි ලාල් හෙට්ටිආරච්චි යන අයගේ පෙත්සම සහ, කොළොන්නාව, සාලමුල්ල පාර, අංක 66/12 හි පදිංචි එච්.පී. ආර්. ජයසුන්දර යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මීට පෙර බණ්ඩාරගම, රයිගම, නිල්තුරු සෙවන අන්‍යෝන්‍යාධාර සමිතිය ඉදිරිපත් කළ පෙත්සමට අදාළව පෙත්සම් කාරක සභාව දුන් නියෝගය ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් වුණු ලිපියකුත් මේ සමඟ ඔබතුමාගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, වේවැල්දෙණිය, ඉහළගම, විජයසිරි හි පදිංචි අයි.එච්.ඩබ්ලිව්. විතාරණ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ ගරු අමාත්‍යතුමාට යොමු කිරීමේ අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභා ගර්භය තුළ නැහැ. ගරු ඇමතිතුමා, පිළිතුර තිබෙනවා නම් සභාගත කරන්න.

**ගරු ලලිත් වනිගරත්න** (ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Fisheries, Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි. පිළිතුර සභාගත කරනවා.

*** [සභාගත කරන ලද පිළිතුර]**
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

*අ. ග්‍රාමීය බැංකුවල ඇති රත්‍රං භාණ්ඩ වෙන්දේසි කිරීමේදී නියෝජිත ආයතන ලෙස කටයුතු කරන්නේ කුමන ආයතනද?*

***පිළිතුර :***

*අ. ශ්‍රී ලංකා ග්‍රාමීය බැංකු සංගමය. මහජන බැංකුව.*

***ප්‍රශ්නය :***

*ආ. ග්‍රාමීය බැංකු හා නියෝජිත ආයතන අතර ඇති බැඳීම හා වගකීම කුමක්ද? (වෙන්දේසියක් වන අවස්ථාවේදී)*

***පිළිතුර :***

*ආ. නියෝජිතත්වය දරන ආයතන විසින් ලිඛිතව නිකුත් කර ඇති වෙන්දේසි කිරීමේ ක්‍රමවේද හා ග්‍රාමීය බැංකු කාර්ය රීති සංග්‍රහයේ විධිවිධානයන්ට අනුව කටයුතු කිරීමේ වගකීම පැවරේ.*

***ප්‍රශ්නය :***

*ඇ. ඒ සඳහා බලපවත්වන නීති මාලාව කුමක්ද?*

***පිළිතුර :***

*ඇ. උකස් ආඥා පනත, නියෝජිත ආයතන විසින් වරින් වර නිකුත් කරනු ලබන කොන්දේසි, සමිතියේ ග්‍රාමීය බැංකු කාර්ය රීති සංග්‍රහය.*

***ප්‍රශ්නය :***

*ඈ. රත්‍රං භාණ්ඩ වෙන්දේසි සඳහා ඉදිරිපත් කළ පසු එහි අවසානාත්මක තීරණ බලය ඇත්තේ කාටද?*

***පිළිතුර :***

*ඈ. සමිතියේ ගරු අධ්‍යක්ෂ මණ්ඩලයට.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රයේ අංක 02 යටතේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමේ අවස්ථාව. දෙදෙනාම සභා ගර්භය තුළ නැහැ. ඒ නිසා ප්‍රශ්නය ඊළඟ සභාවට යොමු කරනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, මේ අවුරුද්දේ පළමුවැනි සභා රැස්වීමේදී අවස්ථාවක් ලබා දීම ගැන බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මහ ඇමතිතුමා ආසනයේ රැඳී සිටියා නම් මම සන්තෝෂ වෙනවා. නමුත් මම ඔබතුමා හරහා එතුමාව දැනුවත් කරන්න කැමැතියි. මේ වන කොට බස්නාහිර පළාතේ සියලුම පළාත් පාලන ආයතන අඩාල වෙමින් කඩාගෙන වැටෙමින් යන බව අපට පෙනෙනවා. ඊට හේතුව එහි පරිපාලන නිලධාරීන් දැන් කිසිම වගකීමකින් තොරව වැඩ කර ගෙන යන බවක් අපට පෙනෙනවා. එහෙම නම් මම ගරු සභාපතිතුමා හරහා අපේ මහ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ පරිපාලන ආයතන කඩාගෙන වැටීමේදී අපේ පොදු ජනතාවට විශේෂ පාඩුවක්, කරදරයක් ඇති වෙනවා. ඒ වාගේම ඔවුන් යම් අපහසුතාවයකට පත් වෙමින් පවතින අයුරු ගම්වල මිනිස්සු හරහා අඩෝවැඩියාවල් අපට එන ආකාරයක් තේරෙනවා. අපි හැකියාවක් තිබෙනවා නම්, ඒ සම්බන්ධව මේ පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට අධීක්ෂණ මන්ත්‍රීවරුන් ලෙස හෝ එහෙම නැත්නම් මොකක් හරි වගකීමක් භාර දීලා - දැන් අපි නගර සභාවට ගියාට අපට ගරු කිරීමක්, කිසිම සැලකිල්ලක් නැහැ. සේවකයෝ වුණත් අපි දිහා බලන්නේ නිකම් සාමාන්‍ය මනුස්සයෙක් වශයෙන්. නමුත් එය වෙනස් කරලා, ඡන්දය තියලා, සභාපතිවරු, නගරාධිපතිවරු පත් වෙන තෙක් හරි යම්කිසි ස්ථාවරයක් හදලා දෙන්නය කියලා පළමුවෙන්ම ඔබතුමා හරහා ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

දෙවනුව, ගරු සභාපතිතුමනි යෝජනාවක් වශයෙන් කරනවා. පළාත් පාලන අමාත්‍යාංශවල නිලධාරීන් විශේෂයෙන් කාර්මික නිලධාරීන් ඇතුළු යම්කිසි වගකීම් සම්භාරයක් තිබෙන නිලධාරීන්ව වර්ෂ පහකට වැඩිය කාලයක් එක ආයතනයක සේවයේ හිටුවන්න එපාය කියලා. මොකද, අපට ඒක මාරු කරන්න පුළුවන්. අපි දන්නවා, දැන් බස්නාහිර පළාතේ පාසල්වල ගුරුවරුන්ව අවුරුදු දහයෙන් දහයට අනිවාර්යයෙන්ම මාරු කරනවා. ඒක අනිවාර්යයනේම වෙනවා. ඇමතිතුමා අතගහන්නෙත් නැහැ. මන්ත්‍රීතුමා අතගහන්නෙත් නැහැ. බොහොම කාර්යක්ෂමව, බොහොම විනිවිදභාවයකින් ඒ දේ ඉෂ්ට වෙනවා. මම ගරු සභාපතිතුමා හරහා ඉල්ලීමක් කරනවා. මහ ඇමතිතුමාව දැනුවත් කරලා ඒක කරන්න. හැබැයි, ප්‍රාදේශීය සභා, නගර සභා හා මහ නගර සභා පළාත් පාලන ආයතනවල නිලධාරීන්ට අවුරුදු දහය කරන්න යන්න එපා. අවුරුදු පහක් හොඳටම ඇති. මේ පහෙන් පහට මාරු කිරීමේ වැඩ සටහනක් හදලා, මේ ක්‍රියාව බොහොම කාර්යක්ෂමව ඉෂ්ට සිද්ධ කර ගන්න පිළිවෙතක් අනුගමනය කරන්නත් කියලා ඉල්ලා සිටිනවා. දැන් මේ වෙලා තිබෙන අගතිය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා හරහා මහ ඇමතිතුමාගෙන් නිලධාරීන් ඉන්නවා නම්, - ලේකම්තුමිය නැහැ. ඒ අදාළ ආයතනවලට දැනුවත් වෙලා එය ඉෂ්ට කරලා දෙන්න කියන්නේ, අපේ ගම්වල ජීවත් වන ජනතාවට සේවය ලබා ගන්නයි කියන එක ගරු සභාපතිතුමා හරහා දැනුම් දෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මේ දවස්වල කොළඹ මහ නගර සභාවේ ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව මම විශ්වාස කරනවා, ගරු මහ ඇමතිතුමාගේ අවධානය විශේෂයෙන් යොමු වෙයි කියලා. ලොකු වංචා සහගත ක්‍රියාවක්, මහජන මුදල් වංචා සහගත ක්‍රියාවල යොදමින් සිටින අවස්ථාවක් තමයි මේ වෙලාවේ කොළඹ මහ නගර සභාවේ ක්‍රියා කලාපය. විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, පසුගිය සතියේ සිදු වුණු සිදුවීමක් පිළිබඳව මහත් ආන්දෝලනයකට ලක් වුණා. මොකක්ද? ලතින් ඇමරිකානු ගායක Enrique Iglesias ගේ ප්‍රධානත්වයෙන් පැවති සංදර්ශනය සම්බන්ධව. කොළඹ මහ නගර සභාවේ විශාල ගැටළුවක් ඇති වෙලා තිබෙනවා. රුපියල් මිලියන 29 ක වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා. ටිකට් පත් මගින් රුපියල් මිලියන 29 ක වංචාවක් සිද්ධ වෙලා තිබෙන්නේ. එතකොට ගරු සභාපතිතුමනි, රු. 35,000 ටිකට් ගහලා තිබෙන්නේ, 400 යි. නමුත් එවැනි තත්ත්වයක් තුළ 7,000 කාණ්ඩයේ ටිකට් පවා එම සංදර්ශනයේදී අලෙවි වෙලා තිබෙනවා. මේ හරහා ගරු සභාපතිතුමනි, කොළඹ මහ නගර සභාවට අහිමි වී ඇති ආදායම රුපියල් මිලියන 29 ක් බවට නගරාධිපතිවරයා විසින්ම ප්‍රකාශයට පත් කරන්නට යෙදුණා.

ගරු සභාපතිතුමනි, මෙම සංදර්ශනය සංවිධානය කළේ මහේල සහ සංගක්කාර නමැති ක්‍රිකට් ක්‍රීඩකයෝ දෙන්නා.

[ගරු සුනිල් වටගල]

නමුත් අපි ඔවුන්ට විවේචනයක් එල්ල කරන්නේ නැහැ. ඒකට හේතුව තමයි, ඔවුන් පිළිගත්තා මෙතැන ටිකට්වල කිසියම් ගැටළුවක් ඇති වෙලා තිබෙනවාය කියලා. ඒ අනුව තමයි ඔවුන් මහත්මා ගතියක් ලෙස ඔවුන්ගේ වෙබ් අඩවියේ අද වෙද්දී ඔවුන් සමාව භජනය කරලා, නිවේදනයක් නිකුත් කරලා තිබෙන්නේ.ඒකේ පළමුවැනි වාක්‍යයෙන් පෙනෙනවා, ඔවුන්ටත් දැනිලා තිබෙනවා කියලා මෙතැන කිසියම් ගැටළුවක් ඇති වෙලා තිබෙනවාය කියලා. ඒකෙන් ඔවුන් කියන්නේ, We wish to apologize to all of you, for your negative experience of recently concluded Enrique concept. එතකොට ඒගොල්ලෝ පිළිගන්නවා ගරු සභාපතිතුමනි, කිසියම් ගැටළුවක් ඇති වෙලා තිබෙනවා කියලා. මේකේ තිබෙන්නේ, සංගාට සහ මහේලට කරන විවේචනයක් නොවෙයි. මේ සංදර්ශනය ඇතුළේ සිදු වුණු මේ ටිකට්පත් මගඩියෙන් කොළඹ මහ නගර සභාවට රුපියල් මිලියන 29 ක් අහිමි වීමට අදාළ කාරණා.

ගරු සභාපතිතුමනි, මේ කාරණයට අමතරව ඔබතුමාගේ අවධානය තවත් කාරණයක් වෙත යොමු කරනවා. විශේෂයෙන් කොළඹ නගර සභාවේ මේ වෙද්දී අංක තහඩු 4”X6” අංක තහඩු ගෙවල් සහ කාර්යාල 120,000 කට දෙන්න සැලසුම් කරලා තිබෙනවා. ලක්ෂ 1,466 ක්. ඒ කියන්නේ, කෝටි 14 කට ආසන්න මුදලක්. හැබැයි, මෙතැන වෙලා තිබෙන්නේ. ඔබතුමා මගින් ගරු මහ ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කරනවා, මෙන්න මේ කාරණයට. 2030 වන තුරු මේ අංක තහඩු දෙන සමාගම කොළඹ මහ නගර සභාවට පොරොන්දු වෙලා තිබෙනවා. කෝටි 14 අත්හැර දාන්න. අපි කම්පැනිය විධියට ඒක දරන්නම්. හැබැයි, 2030 වන තෙක් අර විශාල නාම පුවරු ටෙන්ඩර් කිරීමකින් තොරව ඒගොල්ලන්ට ඕනෑය කියලා. ගරු සභාපතිතුමනි, මම අහනවා, මොන Procurement Guide Line එකේද තිබෙන්නේ? ටෙන්ඩර් කිරීමකින් තොරව 2030 වන තෙක් දෙන්න කොළඹ මහ නගර සභාවට මොකක්ද? තිබෙන අයිතිය. එතකොට මෙන්න මෙවැනි වංචා සහගත ක්‍රියාවන් රාශියක් - ගරු මහ ඇමතිතුමනි, මේ වෙලාවේ මෙන්න මේ සංදර්ශනය හරහාත් - ඒ විතරක් නොවෙයි, මෙන්න මේ අංක තහඩු හරහාත් මෙවැනි ක්‍රියාවන් මේ වෙද්දී සිද්ධ වෙනවා. මම හිතනවා, විශේෂ අවධානයක් මේ කොළඹ මහ නගර සභාව සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු වෙයි කියලා. මේක අර ලිහා දාපු ගව රංචුවක් වාගේ ඔහේ මේක තුළ තිබෙනවා කොළඹ මහ නගර සභාවට - අන්ධයාගේ බූදලය වාගේ. ඕනෑතරම් සල්ලි එනවා. ඒක වියදම් කරන ක්‍රමයක් දන්නේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, රටේ මහජනතාවගේ මුදල්. මොන තරම් සල්ලි තිබුණත් අපි දන්නවා. කොළඹ මහ නගර සභා සීමාවේ මිනිස්සුන් ජීවිත ගත කරන විධිය. වතුවල මිනිස්සු ජීවිත ගත කරන විධිය පිළිබඳව අපට අවබෝධයක් තිබෙනවා. වේලක් ඇර වේලක් කාලා පිරිමහගන්න බැරි තත්ත්වයට ඇවිල්ලා තිබෙන්නේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ වතුවල ජීවත් වන මිනිස්සු. හැබැයි, කෝටි ගණන් මුදල් වංචාවක් සිද්ධ වෙනවා. ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් මේ කරුණු දෙක සම්බන්ධව ගරු මහ අමැතිතුමාගේ විශේෂ අවධානය යොමු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බස්නාහිර පළාතේ සංචාරක ව්‍යාපාරය පිළිබඳව ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර් ගරු මන්ත්‍රීමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, 2016 වසර ඔබතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ට සාමය, සතුට, සෞභාග්‍ය පිරි නව වසරක් වේවායි පළමුවෙන්ම ප්‍රාර්ථනා කරනවා. සංචාරක කර්මාන්තය පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්න කාලය ඉල්ලුවත් විනාඩි භාගයක කෙටි කාලයක් ගරු අධ්‍යාපන ඇමතිතුමාගේත් අවධානය යොමු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, මම දන්නේ නැහැ මොන චක්‍රලේඛ, නීති තිබෙනවාද කියලා. මේවා වෙනස් වෙලා හරි පාසල් ගුරුවරුන් මාසයකට වඩා කාලයක් පඩි රහිතව නිවාඩු ගන්නවා නම්, ඒ ගුරුවරයාව අධ්‍යාපන කලාපයට අරගෙන ඒ පන්තියේ සිටින දරුවන්ට ගුරුවරයෙක් ලබා දීමට වගකීම දැරිය යුතුයි කියන එක, කලාපයට දැනුවත් කළ යුතුයි. හේතුව, බේරුවල, බෞද්ධ කනිෂ්ට විද්‍යාලයේ පහේ ශිෂ්‍යත්වය කරන දරුවන්ගේ ගුරුවරයා පසුගිය මාස හතරක්, පහක් පඩි රහිත නිවාඩු ගිහිල්ලා. අලුතෙන් ගුරුවරයෙක් දා ගන්නවත් අවස්ථාවක් නැහැ. ක්‍රමවේදයක් නැහැ. ඒ නිසා ඒ චක්‍රලේඛ, නීති රෙගුලාසි වෙනස් කරලා හරි ඒක ලබා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා.

මම හිතනවා, සංචාරක අමාත්‍යාංශය ගරු ප්‍රධාන අමාත්‍යතුමා භාරව තිබෙන අමාත්‍යාංශයක්. බස්නාහිර පළාතේ, විශේෂයෙන්ම බේරුවල ලංකාවේ ගෝල්ඩන් මයිල් කියන කලාපයේ ජීවත් වන මන්ත්‍රීවරයකු හැටියට බේරුවල මොරගල්ල සිට බෙන්තර දක්වා ලංකාවේ ගෝල්ඩන් මයිල් කියලා සංචාරක කලාපයක් හඳුන්වා දෙන කලාපය, වැස්සක් ආවොත් යට වන කලාපයක් හැටියට පරිවර්තනය වෙලා තිබෙනවා. හෝටල් නිසා වතුර බහින කාණු පද්ධති වැහිලා ගිහිල්ලා තිබෙනවා. ඒවා සකස් කරලා දිය යුතුයි. ඒ පොඩි කාරණාවත්, සංවර්ධන කමිටුවට ඉල්ලීමක් ලෙස ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් මහා පරිමාණ සංචාරක ව්‍යාපාරිකයින්ගේ ආයතන, මේ ලංකාවේ සංචාරක කර්මාන්තය තමන්ගේ ග්‍රහණයට නතු කර ගන්න ක්‍රමවේදයක් හැටියට තමයි අද ලංකාවේ මුළු සංචාරක කර්මාන්තය පත් වෙලා තිබෙන කනගාටුදායක තත්ත්වය වන්නේ. ඒ නිසා මේක මහ ඇමතිතුමා බොහොම වැදගත්ව දැනුවත් කළ යුතු කාරණාවක් වෙනවා. මේ රටටම බලපාන ප්‍රශ්නයක් හැටියට. මහා පරිමාණ සංචාරකයින් මේ රටට ගොඩ බැස්සාම කටුනායක ගුවන් තොටුපලේදීම බස් එකට නග්ගලා ඒ සංචාරක මග පෙන්වන්නන් ලංකාව ගැන බොහොම හොඳ හඳුන්වා දීමක් කරනවා. ඒ හඳුන්වාදීම මමත් අහගෙන හිටියා. ඒ හඳුන්වාදීම මම හිතන්නේ, මුළු රටටම බෙල්ලේ වැල දා ගන්නවා වාගේ හඳුන්වාදීමක් කරන්නේ.

නමුත් ඒ ආයතනය හිතනවා ඇති මේ කරන ක්‍රියාව තමන්ගේ ආයතනයට සත් ක්‍රියාවක් වෙන්න පුළුවන් කියලා. නමුත් මේ රටේ ජනතාව හොරුන් හැටියට හඳුන්වා දීලා, මේ රටේ අනෙකුත් ව්‍යාපාරිකයින්ව මංකොල්ලකරුවන්, වස පොවන්නන් හැටියට තමයි ඒ හඳුන්වා දීම කරන්නේ. සංචාරකයෝ බස් එකට ගෙනැල්ලා කියනවා, ත්‍රී රෝද රථයකට නගින්න එපා. තමන්ගේ පර්ස් එක පරිස්සම් කර ගන්න. තැඹිලි කඩයකට ගිහිල්ලා තැඹිලි බොන්න එපා. හෝටලයකට ගිහිල්ලා කන්න එපා. ජුවෙලරි සාප්පුවලට ගිහිල්ලා බඩු ගන්න එපා. ඔක්කොම හොර සහතික එක්ක ඉදිරිපත් කරන්නේ. කඩයකට ගියා නම්, මිල වැඩියෙන් විකුණන්න උත්සාහ කරනවා. මේ නිසා මේ ආයතනවලට යන්න එපා. තමුන්නාන්සේලාට අවශ්‍ය නම් අපෙන් ඉල්ලන්න කොහේටද යන්න ඕනෑ කියලා. ඒවා අපි ගිහිල්ලා අරන් දෙන්නම් කියලා තමයි මේ මග පෙන්වන්නන් ලංකාවට ගොඩ බැස්සාම මේ රට ගැන හඳුන්වාදීම කරන්නේ. මහා පරිමාණ ආයතන තමයි මේවා කරන්නේ. සාමාන්‍ය සංචාරක හෝටලයක් කරන අය එහෙම කරන්නේ නැහැ. ඒ නිසා සුදු විදේශිකයින් මේ රටට ගොඩ බැස්සාම මේ රටේ සියලු දෙනාව දකින්නේ හොරුන් විධියට. කඩේකට යන්නේ නැහැ. තැඹිලි ගෙඩියක්, එහෙම නැත්නම් අඹ ගෙඩියක් කන්න කඩේකට යන්න බැහැ. තවත් කඩ සාප්පුවලට ගිහිල්ලා බඩු ගන්න බැරි තත්ත්වයකට පත් කරන තත්ත්වයකට මේ රට මග පෙන්වන්නන් විසින් - අපි කතාවට කියනවා මේ සුන්දර දේශය. හොඳ පරිසරය.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

සුද්දෝ වූන් පාන් කන්නේ.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

වෙන්න පුළුවන්. ඒ වූන් පාන් කන සුද්දෝ ගෙන්වලා තිබෙන්නේ, මෙහේ විවාහ වෙලා අර අවුරුදු ගණනක් ලංකාවට එන විදේශිකයන් ගැන. ඒ අය මම හිතන්නේ, හෝටලයකටවත් ගිහිල්ලා කීයක්වත් වියදම් කරන්නේ නැහැ. අපි මේ සංචාරකයෝ ලක්ෂ ගණන් කියලා පෙන්නුවාට, මේ වීන අවන්හල්වල කෝකියෝ. පිඟන් හෝදනවා. සංචාරකයෝ අපෙන් හම්බ කරන් යන්න එන සංචාරකයෝ. ඒ නිසා අපි සංචාරක කර්මාන්තය දියුණු කළ යුතුයි. ඒ නිසා ඒ අවස්ථාව මහ ඇමතිතුමා හැටියට, සංචාරක අමාත්‍යතුමා හැටියට වගබලා ගන්නය කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ඉසුර දේවප්‍රිය**(ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ සහ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Governmentand Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs&Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

සංචාරක මණ්ඩලයට සභාපතිවරයෙක් පත් කරලා තිබෙනවා. මම එතුමාට විස්තර ටික දෙන්නම්. මහාචාර්ය කීර්ති දිසානායක මැතිතුමා. එතුමාත් එක්ක සම්බන්ධ වෙන්නය කියලා මම දැනුවත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට මැද කොළඹ ප්‍රදේශයේ රෝහල් පද්ධතිය පිළිබඳව අදහස් දැක්වීමට එම්.එස්.එම්. ෆයිරෝස් මැතිතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, 2016 අලුත් අවුරුද්ද පළමුවැනි -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මෙතුමාගේ ඉස්කෝලයටත් විසඳුමක් දුන්නා. ගරු ඇමතිතුමා කිව්වා ඔබතුමාට කථා කරන්නය කියලා. මෙතුමාටත් විසඳුමක් දීලා තිබෙන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, මම මගේ කථාව පටන් ගන්නද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පටන් ගන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, 2016 අලුත් අවුරුද්ද වෙනුවෙන් මේ සභාවේ ඉන්න මගේ සහෝදර මන්ත්‍රීවරුන්ට සුභ අලුත් අවුරුද්දක් වේවායි කියලා මම පළමුවෙන්ම ප්‍රාර්ථනා කරනවා. ඇත්ත වශයෙන්ම අද මම රෝහල් ගැන කථා කරන්න නැගිට්ටේ, මැද කොළඹ රෝහලේ තිබෙන තත්ත්වය ගැන බලලයි. මම හිතනවා, අද අපේ මහ ඇමතිතුමා තමයි සෞඛ්‍ය ඇමතිකම භාර අරන් තිබෙන්නේ. ඊළඟට ඇමතිවරයෙක් දාන්න කලින්වත් ගරු මහ ඇමතිතුමා මේ ගැන ඇහුම්කන් දුන්නොත් හොඳයි. ගරු සභාපතිතුමනි, මැද කොළඹ ආසනයේ කොළඹ මහ නගර සභා සීමාව තුළ තිබෙන බස්නාහිර පළාත් සභාවට අයිති එකම රෝහල වන්නේ, හිටපු ජනාධිපති ගරු රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ හදපු මැද කොළඹ රෝහලයි. එතැන ගෙවල් 2000 ක් විතර හදලා එතැනට ඉස්පිරිතාලයක් ඕනෑය කියලා, ආර්. ප්‍රේමදාස ගුණානුස්මරණ මැද කොළඹ රෝහල කියලා රෝහලක් පටන් ගත්තා. එහි භූමි ප්‍රමාණය අක්කරයක්. අද මාළිගාවත්ත කියන මැද කොළඹ ඒ තිබෙන තැන පර්චස් එකක් කෝටියක් වටිනවා. අද අක්කරයක භූමි ප්‍රමාණයක් තිබෙන ඉඩමේ අද ඒ රෝහල තිබෙන තත්ත්වය බලන කොට හරි භයානකයි. මම හිතන්නේ රෝහලේ ලෙඩ්ඩුන්ට ඇඳවල් තිබෙනවා. මෙට්ට්‍රස් නැහැ. ඒකට දවසට බාහිර රෝගීන් 550 ක් 600 ක් පමණ එනවා චෙක් කරන්න.

ගරු සභාපතිතුමනි, මීට කලින් හිටපු සෞඛ්‍ය ඇමතිවරු දෙදෙනාගෙන්ම මම ඉල්ලීමක් කළා. පොඩ්ඩක් ඇවිල්ලා අපේ ඉස්පිරිතාලය බලන්න කියලා. මමත් අවුරුදු 12 ක් විතර මේ බස්නාහිර පළාත් සභාවේ ඉන්නවා. හැම අයවැයකදීම මම මේ ගැන ප්‍රශ්න කරලා තිබෙනවා. මම මේ ගැන කියලත් තිබෙනවා. මීට කලින් අපේ හිටපු ගරු අමාත්‍ය, සහෝදර මන්ත්‍රී නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මැතිතුමාට මම ලිපියකුත් භාර දුන්නා. පොඩ්ඩක් ඇවිල්ලා බලන්නය කියලා. හිටපු අමාත්‍ය ජගත් අංගගේ මැතිතුමාටත් මම ඒ ගැන කියලා තිබෙනවා. මොකද, මම කියන්නේ මේක අපේම වස්තුවක්. අපේ ඉඩමක්. මේකේ දවසකට ලෙඩ්ඩු 550 ක් 600 ක් එනවාය කියන්නේ මේ ඉස්පිරිතාලය අපට හොඳටම සංවර්ධනය කරන්න පුළුවන්. බැරි දෙයක් නොවෙයි. ඒක ළඟම වකුගඩු රෝගීන්ට කියලා රෝහලක් හදලා තිබෙනවා. තට්ටු 10 ක ගොඩනැගිල්ලක්. මහ ආණ්ඩුවෙන් හදලා තිබෙන්නේ. ඒක පරිත්‍යාග මුදලකින් හදලා තිබෙන්නේ. ආණ්ඩුවේ සල්ලිවලින් නොවෙයි. මැද කොළඹ ඉස්පිරිතාලය, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා හිටපු ජනාධිපතිතුමාගේ නම කියන්නවත් තිබෙන හොඳම ඉස්පිරිතාලයක් කරන්න අපට පුළුවන්. බස්නාහිර පළාත් සභාවේ.

අපි හැමදාම අයවැය විවාදවල කථා කරනවා. සෞඛ්‍යයට මෙපමණ වෙන් කරලා තිබෙනවා. අධ්‍යාපනයට මෙපමණ වෙන් කරලා තිබෙනවාය කියලා. මේක තමයි ගරු සභාපතිතුමනි, ඇත්ත කථාව. මම කියන්නේ, මේක මැද කොළඹ විතරක් නොවෙයි, කොළඹ නගර සීමාව තුළ තිබෙන බස්නාහිර පළාත් සභාවට අයිති, අක්කරයක විතර භූමි ප්‍රමාණයක් තිබෙන ඉඩමක තිබෙන රෝහලක්. ගරු මහ ඇමතිතුමා මේ ගැන මැදිහත් වෙලා මේ පිළිබඳව

කථා කරන්න. උදේට කවුරුහරි නිලධාරියෙක් යවලා බලන්න එහි තිබෙන තත්ත්වය ගැන. පෝළිම පාරට වෙනකල් තිබෙනවා. එතැන මුස්ලිම්, සිංහල, දෙමළ හැම කෙනාම එකට තමයි ජීවත් වෙන්නේ. එතැන වෛද්‍යවරු නැහැ. අත් උදව්වට කවුරුවත් වැඩ කරන්න ඇවිල්ලා නැහැ. පර්චසයක් කෝටියක් වටිනාකම තිබෙන කොට අක්කරයක පමණ භූමි ප්‍රමාණයක් තිබෙන ඉඩමක් අපට තිබෙනවා නම්, අපට කොපමණ ලස්සනට කරන්න පුළුවන්ද? ඒ නිසා සෞඛ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේ ගැන කැබිනට් මණ්ඩලයටවත් දාලා විශේෂයෙන්ම මේ ඉස්පිරිතාලය ගැන උනන්දු වෙන්නය කියමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බස්නාහිර පළාතේ ගුරු උපදේශක මහත්ම මහත්මීන් වෘත්තීය සමිති වැඩ වර්ජනයෙන් පාසල් පද්ධතියට අසාධාරණයක් වීම පිළිබඳව මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමාගේ මාර්ගයෙන් අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය මේ ගැන යොමු කරන්නය කියලා විශේෂ ඉල්ලීමක් කරනවා. හේතුව, ගිය අවුරුද්දේ අපි දෙසැම්බර් මාසයේ අයවැයේදීත් මේ ගැන සාකච්ඡා කළා. මෙතැනදී මන්ත්‍රීවරු ගණනාවක් කථා කළා. මේ වන කොටත් බස්නාහිර පළාතේ ගුරු උපදේශකවරු 722 ක් ඉන්නවා. ඒ හත්සිය ගණනෙන් වැඩි ප්‍රමාණයක් මේ වන කොටත් අද වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් අරගෙන වැඩ කරන්නේ නැතිව ඉන්නවා. එක පැත්තකින් මධ්‍යම ආණ්ඩුව මේ සේවය ස්ථාපිත නොකරන නිසා. ඒ වාගේම වෘත්තීය සමිති ඉල්ලීම් ගණනාවක් නිසා අද ගුරු උපදේශකවරු වැඩ කරන්නේ නැහැ. හැබැයි, දෙසැම්බර් මාසයේ විභාග රාජකාරිවලටත්, ඒ වාගේම ප්‍රශ්න පත්‍ර බැලීමටත් ඒ අය, ඒ රාජකාරිවලට යනවා. මුදල් ගෙවන රාජකාරිවලට යනවා. මුදල් නොගෙවන පාසල්වල රාජකාරිවලට සහභාගී වෙන්නේ නැහැයි කියන එක අපි අද හොඳටම අත්දැකීමෙන් බලලා තිබෙනවා. ඒ නිසා අද අධ්‍යාපන ඇමතිතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා. මේකට විසඳුමක් හැටියට එක පැත්තකින් මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කරලා 2016 වසරටවත් මේ ගුරු උපදේශක සේවය ස්ථාපිත කරන්න අවශ්‍ය කටයුතු කරන්නය කියන එක එතුමාගේ මාර්ගයෙන් අපි ඉල්ලීමක් කරනවා. එහෙම නැත්නම් ගුරු උපදේශක මහත්ම මහත්මීන් කොට්ඨාශ කාර්යාලවල පාසල් අධීක්ෂණය කරන වැඩ සටහන් ක්‍රියාත්මක කරන්නේ නැත්නම් අද එක පැත්තකින් අනුමත සංඛ්‍යාව අනුව ගුරුවරු 722 ක් බඳවා ගන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. 1000 කට වඩා අද ගුරුවරුන්ගේ අඩුපාඩු ප්‍රමාණයක් බස්නාහිර පළාතේ තිබෙනවා. ගුරු උපදේශකවරුන්ගෙන් අද ඒ වැඩ කොටස ගන්න බැරි නම්, පළාතේ අධ්‍යාපන ඇමතිතුමා හැටියට පාසල්වලට යොමු කරලා, අර පන්තියේ නැති ගුරුවරයාටත් ගුරුවරයෙක් ලබා දෙන්නය කියලා අපි ඉල්ලීමක් කරනවා. පන්තියටත් ගුරුවරයා නැහැ. ගුරු උපදේශකවරයාත් නැහැ. එතකොට 722 න් එක පැත්තකින් පන්තියටත් අසාධාරණයක්, ළමුන්ටත් අසාධාරණයක් වෙලා තිබෙනවා. අනික් පැත්තෙන් කොට්ඨාශයේ වැඩ සටහන් ක්‍රියාවලියත් අද කර ගන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ නිසා ඔබතුමාගේ මාර්ගයෙන් අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේකට වැඩි කාලයක් ගත කරන්නේ නැතිව ගිය මාසෙත් මේ ප්‍රශ්නය විසඳුනේ නැහැ. දෙසැම්බර් මාසයේ මේ ප්‍රශ්නය ඇදි ඇදී ගියා. මේ 2016 වසරේ ජනවාරි මාසයේ මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිතුමාත් එකතු කර ගෙන මේ ප්‍රශ්නයට මැදිහත් වෙලා, මේ ප්‍රශ්නය විසඳන්න. එහෙම නැත්නම් එක පැත්තකින් ගුරුවරු හැටියට පාසලට අනුයුක්ත කරලා ඒ පන්ති කාමරයට අවශ්‍ය ගුරුවරයා ලබා දෙන්නය කියලා. ඒ ප්‍රශ්නය විසඳුනේ නැත්නම් දෙපැත්තටම - එක පැත්තකින් පන්තියට ගුරුවරයා නැහැ. එක පැත්තකින් කොට්ඨාශයේ ගුරු උපදේශකවරයාත් නැහැ. ඒ නිසා මේ ගැන විශේෂ අවධානය යොමු කරන්නය කියලා ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ගරු සභාපතිතුමනි, ඔබතුමාටත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම ඇමතිවරුන්ටත්, සියලුම මන්ත්‍රීවරුන්ටත්, සමස්ත නිලධාරී මණ්ඩලයට සහ සියලුම මාධ්‍යවේදී නිලධාරී මහත්ම මහත්මීන් ඇතුළු හැමෝටම ලැබුවා වූ නව වසර සුභම සුභ නව වසරක් වේවායි කියලා මුලින්ම

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

ප්‍රාර්ථනා කරනවා. අපේ බේරුවල ආසනය නියෝජනය කරන සහෝදර ගරු මන්ත්‍රීතුමා සංචාරක කලාපය පිළිබඳව කථා කළා. ඇත්ත වශයෙන්ම මම සතුටු වෙනවා. විෂය භාර ඇමතිවරයා මේ ස්ථානයේ සිටිනවා. රටට විශාල ප්‍රමාණයෙන් සංචාරකයන් ආවත් හැබැයි, මේ කොළඹට ඇවිල්ලා කොළඹින් ඒ අවශ්‍ය කරන කටයුතු සියල්ල ඉටු වුණාට, මම හිතන්නේ අපි බලාපොරොත්තු වන සංචාරකයන් නොවෙයි පැමිණියේ. සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටින තරුණයෙකු හැටියට අපි බලාපොරොත්තු වුණේ, හොඳ ධනවත් සංචාරකයින් මෙවරත් ලංකාවට ගොඩ බසියි කියලා. එහෙම තමයි මුල් කාලය තුළදී මේවා ක්‍රියාත්මක වන වැඩ සටහනේදී වුණේ. නමුත් මේ වන විට ඒ එන සංචාරකයන් කඩවල්වලට ගිහිල්ලා කොත්තු රොටි කාලා, බිත්තර ආප්ප, පරාටා කාලා ජීවත් වන වැඩ සටහනක් තමයි ක්‍රියාත්මක වෙන්නේ. මෙතුමා කිව්වා වාගේ කටුනායකින් බැස්සාට පස්සේ එතැන ඉන්න සමහර ගයිඩ්ලාගෙන් සිදු වන වැරදි වැටහීම් නිසා තමයි අද මේ සංචාරක කලාපය එන්න එන්නම කඩාගෙන වැටිලා තිබෙන්නේ.

මම ගරු ප්‍රධාන ඇමතිතුමාට කියනවා, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ මේ බස්නාහිර පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන සංචාරක වැඩ සටහන් දියත් කරන්න. අපි බේරුවල ආසනයේ ජීවත් වන ජනතාවක් හැටියට මෙතැන ඉන්නවා. මීගමුව, ඒ කලාප දියුණු කරන්න අලුත් වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න. ඊට අමතරව, උදාහරණයක් වශයෙන් ගත්තොත් අද ලියන්න කියන්න හැකියාව නැති වුණත් අප ප්‍රදේශවල භාෂා තුන හතරක් කථා කරන්න පුළුවන් දක්ෂ තරුණයෝ ඉන්නවා. අද මේ තරුණයෝ විදේශගත වෙලා, ඒ ඉන්න විශාල ප්‍රමාණයේ සංචාරකයින්ව පෞද්ගලිකව ගෙන්වලා, මහා පුදුමාකාර විධියට ඔවුන් දක්ෂ වැඩ සටහන් ක්‍රියාත්මක කරනවා. මම ඉල්ලීමක් කරනවා. ඔබතුමා ඉදිරිපත් කළ නව සභාපතිතුමා යටතේ මේ දෙන ගයිඩ් ලයිසන් එක සමහරුන්ට දෙන්නේ ලියන්න කියන්න හැකියාව නැති වුණත්, විවිධ ආකාරයට මේක ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙනවා. හැබැයි මේක අවුරුදු හතරකට හරි පහකට හරි දීර්ඝ කාලයකට දෙන්න. මේක අවුරුද්දෙන් අවුරුද්ද නැවත අලුත් කිරීමට යන කොට මහා විශාල මුදලක් අය වෙනවා. මේවාට කාලය ගත වෙනවා. ඇත්ත වශයෙන්ම සංචාරක කලාපයේ ජීවත් වන තරුණයෝ සමහර වෙලාවට වැල්ලට ගිහිල්ලා, මේ හෝටලය ඉස්සරහාට ගිහිල්ලා, වැල්ලේ තිබෙන ඒ හෝටලය ඉස්සරහාට ගිහිල්ලා, ඒ හෝටලයේ වැට අයිනට වෙලා උදේ හයේ ඉඳන් සවස පහ වන තුරු මහා දරුණු අව්වට වෙලා තමයි බලාගෙන ඉන්නේ. බලාගෙන ඉඳලා ජෝඩුව බහින කොට කියනවා, ජෝඩුවයි කියලා කථා කරලා තමයි ඒ ජෝඩුව වෙන් කර ගන්නේ. උදාහරණයක් ගත්තොත් මේ විධියට තරුණයෝ විස්සක් හිටියොත්, ඒ කාමර 20 බෙදාගෙන තමයි ඒ තරුණයෝ ඒ කටයුත්ත කරන්නේ. හැබැයි, මේකත් ක්‍රියාත්මක කරන්න යන කොට මේ පොලීසිය - එහෙම නැත්නම් මේ තරුණයෝ බොහොම අමාරුවෙන් මේ සංචාරකයන් අල්ලා ගෙන, ඔවුන්ට මග පෙන්වන්න ගිහිල්ලා රට වටේම ටුවර් එකක් අරගෙන යන්න කටයුතු කරන කොට මේවාට විවිධ විවිධ තැන්වලින් මහා දරුණු විධියට දඩ ගහන්න කටයුතු කරනවා. මම ඉල්ලා සිටිනවා. ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ මේ දෙන ලයිෂන් එක, මේ ඉන්න තරුණයින්ට ලියන්න කියන්න හැකියාව නැතත් ඔවුන්ට භාෂා තුන හතරක් කථා කරන්න පුළුවන් තරුණයෝ ඉන්නේ. අන්න ඒවාට වැඩ පිළිවෙළක් දියත් කරන්න. ඒ වෙනුවෙන් දීර්ඝ කාලීනව කටයුතු කරන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම එක වැස්සක් වැස්සොත් එහෙම ගඟ දිගේ එන කැළි කසළ ටික කෙළින්ම වෙරළට එන්නේ. මේක සමුද්‍ර පරිසර අධිකාරිය හරහා අපි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් ඉන්න කොට මහා දැවැන්ත වැඩ පිළිවෙළක් කළා. එක විනාඩි 10 ක් වැස්සොත් ට්‍රැක්ටර් තුන හතරක් කුණු එනවා. මේකට පළාත් සභාව තුළින් අපට ලබා දුන්නා, Beach Cleaner යන්ත්‍රයක්. සමහර අවස්ථාවලදී මේක කැඩෙනවා. එක යන්ත්‍රයක් මදී. බෙන්තර වෙරළ තීරයට එකක්, කළුවාමෝදර වෙරළ තීරයට එකක් ලෙස ලබා දුන්නොත් - මම හිතන්නේ තවත් යන්ත්‍රයක් ලබා දුන්නොත් මේ එන කැළි කසළ ටික පිරිසිදු කරන්න අපට පුළුවන්කම ලැබේවි කියන පණිවුඩය තමුන්නාන්සේ ඉදිරියේ තබමින්, මේ අවශ්‍ය කරන කරුණු කාරණාත් එක්ක ඉදිරියේදී ඒ ප්‍රදේශවලට ඇවිල්ලා ඔබතුමා අපිත් එක්ක සම්බන්ධ වෙලා, අලුත් වැඩ සටහනක් දියත් කරන්න, සංචාරක කලාපය දියුණු කරන්න වැඩ කටයුතු කරන්න අපේ තරුණයෝ වෙනුවෙන් ශක්තිය ලබා දෙන්නය කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

0025

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට සභාවේ කටයුතු යටතේ ගරු සභා කටයුතු අමාත්‍යතුමාට අවස්ථාව -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම මම අද මේ ප්‍රකාශය කරන්න බලාපොරොත්තු වෙන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ප්‍රකාශයක් කරන්න දෙන්න බැහැ. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය මට කියන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

මගේ වරප්‍රසාද ප්‍රශ්නය තමයි, බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක, ඒ වාගේම සභා කටයුතු හා කාන්තා කටයුතු ඇමතිවරයා විධියට මේ සභාවේ මාස තුනකට ආසන්න කාලයක් මම කටයුතු කර ගෙන ගියා. මට දැන ගන්න අවශ්‍යයි කුමන කරුණු පදනම් කර ගෙනද මගේ අමාත්‍ය ධූරයෙන් මාව ඉවත් කළේ කියලා. ඒ පිළිබඳව තවම මට පිළිගත හැකි, තර්කානුකූල, සාධාරණ උත්තරයක් ලැබිලා නැහැ. ඒ වාගේම මගේ අමාත්‍ය ධූරයෙන් මා ඉවත් කළ බව මට දැන ගන්නට ලැබුණේ එම අමාත්‍ය ධූරයේ මහ ඇමතිවරයා දිවුරුම් දීමෙන් පසුව පැය හතරක් ඉක්මවා ගියාට පස්සේ තමයි නිල විධියට ආණ්ඩුකාරතුමා විසින් මට ඒ ලිපියෙන් දැනුම් දෙනු ලැබුවේ.

ඒ වාගේම මම කියන්න ඕනෑ. මේ පළාත් සභාව ඇතුළේ ජාතික හෙළ උරුමය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට මේ අමාත්‍ය ධූරය මා වෙත පැවරුවේ ගරු ජනාධිපතිතුමා විසින්. එතුමා හරහා ගරු ආණ්ඩුකාරතුමා විසින් මට මේ අමාත්‍ය ධූරය පසුගිය සැප්තැම්බර් මස 14 වැනිදා පිරිනැමුවා. මේ කාල සීමාව තුළ මට කිසිදු ආකාරයක චෝදනාවක්, එහෙම නැත්නම් දූෂණයක්, වංචාවක්, අක්‍රමිකතාවයක් සම්බන්ධයෙන් කිසිදු ආකාරයේ පැමිණිල්ලක්, චෝදනාවක් ඉදිරිපත් වෙලා නැහැ. එහෙම නම් මේ සභාව ඇතුළේ මගේ ක්‍රියා කලාපය කුමක්ද කියන එක සම්බන්ධයෙන් මේ මන්ත්‍රීවරු ඇතැමෙක් ප්‍රශ්න කළා. මම කියන්න ඕනෑ. ජාතික හෙළ උරුමය හැටියට අප විසින් ගොඩ නගා ගත්ත දේශපාලන වටිනාකම් ටිකක් තිබෙනවා. අපේ දේශපාලන සංස්කෘතියක් තිබෙනවා. අපේ අනන්‍යතාවයක් තිබෙනවා. ඒ අනන්‍යතාවය ඇතුළේ -

0026

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. මට ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයට -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු සභාපතිතුමනි, මට අවස්ථාවක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට දෙන්න පුළුවන් නම් මම දෙනවා. අනිවාර්යයෙන්ම දෙනවා. ඔබතුමාට පැහැදිලි කරන්න. නමුත් මට 36 (1) යටතේ කාලය දෙන්න බැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

එහෙම නම් මට මේ ප්‍රකාශය කරන්න අවස්ථාවක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමාට ඕනෑ නම් පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ දෙන්න තිබුණා. ඔබතුමා එහෙම ඉල්ලුවේ නැහැ. 36(1) රීතිය තිබෙන්නේ, ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීමක් නම් ඒ ගැන කරුණු කාරණා කියන්න. මම ඒක -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

36(1) යටතේ තමයි මම මේ කථා කරන්නේ ගරු සභාපතිතුමනි. මට මේ සිදු වුණු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ඉල්ලීම සාධාරණයි. නමුත් මට තිබෙන ප්‍රශ්නය 36(1) යටතේ අවස්ථාව දෙන්න බැහැ ඔබතුමාට. දැන් ඔබතුමා ගොඩක් විස්තර කියනවා නේ?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මාධ්‍යයට කිව්වා නම් හරි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

මගේ වරප්‍රසාද කඩ වීමක් පසුගිය කාලයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකට එකඟයි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

මොකද, මේ සභාවේ පසුගිය 31 වැනිදා විශේෂ සභා වාරයක් කැඳෙව්වා. ඒ සභා වාරයේදී ඉතාම සාරගර්භ කථා පවත්වමින්, අපව ඉතාම දැඩි දෝෂාරෝපණයට ලක් කරලා තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාට ඉන්න තිබුණා නේ උත්තර දෙන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

එන්න තිබුණා නේ? ඇයි ආවේ නැත්තේ සභාවට. පත්තරවලට ගිහිල්ලා -

[සභාවේ ඝෝෂා]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මෙතුමා එළියේදී මහ ඇමතිතුමාව විවේචනය කළා නේ? එහෙම නම් එතුමාගේත් වරප්‍රසාද කඩ වෙලා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

මේ යහපාලනය සඳහා වූ ප්‍රතිපත්තිය අපි ඉදිරියට අරගෙන යනවා. ගරු මන්ත්‍රීතුමා, සීලාචාරකම තියාගෙන කරුණාකරලා පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ඔබතුමා එක එක්කෙනාගේ කොන්ත්‍රාත් කරන්න යන්න ඕනෑ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කාගේවත් කොන්ත්‍රාත් කරන්නේ නැහැ. සභාවේ ඔබතුමාට ඕනෑ විධියට කථා කරන්න -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

පොඩ්ඩක් අහගෙන ඉන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

බාධා කරන්නේ නැතිව ඉන්න කෝ. සීලාචාරකම තියාගෙන. (බාධා කිරීම්) මට සීලාචාරකම තිබෙනවා. මට සීලාචාරකම ඔබතුමා උගන්වන්න එන්න අවශ්‍ය නැහැ. ඔබතුමා එන්න අවශ්‍ය නැහැ මට ඒක උගන්වන්න. මම සභාපතිතුමාටයි කථා කරන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපිටත් ඕනෑ අවස්ථාව.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ගරු සභාපතිතුමනි, එහෙම නම් අපිටත් අවස්ථාව දෙන්න. ඒකට තමයි පෞද්ගලික පැහැදිලි කිරීම් තිබෙන්නේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

අපටත් පැහැදිලි කිරීම් ඕනෑ එහෙම නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් ඉවර කරන්න කෝ?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු සභාපතිතුමනි, මට කියන්න තිබෙන්නේ. කිසිදු චෝදනාවක් නැහැ. ඉතාම අයුක්ති සහගතව, අසාධාරණව කරනු ලැබූ මේ කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළ නිසා මගේ අමාත්‍ය ධූරය මට අහිමි කළා. ඒ අමාත්‍ය ධූරය පිළිබඳව පදවි තානාන්තර මත නොවෙයි. අපි පසුගිය කාලයේ මේ රටේ ජාතික දේශපාලනයේ නිරත වෙලා තිබෙනවා. ඒ ජාතික දේශපාලනයේ නිරත වුණේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ලොකු ප්‍රශ්නයක් වෙනවා ඔබතුමා -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ඒ වැඩ පිළිවෙළ අපි ඉදිරියට ගෙනියනවා, යහපාලන ප්‍රතිපත්තිය ජයග්‍රහණය කිරීම දක්වා එක්සත් ජාතික පක්ෂයට ලැබුණු ඒ ජනවරමත් එක්ක. ඒ වාගේම පසුගිය ජනවාරි 08 වැනිදා ලැබුණු ජනවරමත් එක්ක අපි ඉදිරියට යනවාය කියන එක පැහැදිලිව මේ වෙලාවේ කියන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දවල් තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ඇමතිකමේ ප්‍රශ්නය පිළිබඳව මට මොකුත් කරන්න බැහැ. මේ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාව දැනුවත් කරන්නම්. ඒක ගරු ආණ්ඩුකාරතුමාගෙන් ආපු නියෝගයක්. සභාපතිවරයා වශයෙන් මම ඒකට සම්බන්ධ නැහැ. ඒ නිසා මට ඒ ගැන පියවරක් ගන්න බැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා, 36(1) යටතේ කථා කරනවා නම්, එතුමා පසුගිය සුමානේම මාධ්‍යවල මේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ව හැල්ලුවට පත් කළා. එතුමාට 31 වැනිදාට එන්නය කියලා දැනුම් දීලා තිබෙනවා. 31 වැනිදා එතුමා ඇවිල්ලා නැහැ. එතුමා තමයි පැහැර හැරලා තිබෙන්නේ. අනික එතුමා මාධ්‍යයට ගිහිල්ලා මේ පළාත් සභා මන්ත්‍රීවරු කප්පම් ඉල්ලුවා කියලා ප්‍රසිද්ධියේ විද්‍යුත් මාධ්‍යවල ප්‍රකාශ කළා. කිසිම කෙනෙක් කප්පම් ඉල්ලලා නැහැ. ප්‍රතිපාදන ඉල්ලලා තිබෙනවා. ප්‍රතිපාදන ඉල්ලන්න අයිතියක් තිබෙනවා. එතුමා සම්පූර්ණයෙන්ම මේ පළාත් සභාව හැල්ලුවට පත් කළා. මන්ත්‍රීවරු හැල්ලුවට පත් කළා. ගරු ආණ්ඩුකාරතුමා හැල්ලුවට පත් කළා. ගරු ප්‍රධාන ඇමතිතුමාට අභියෝග කළා. 31 වැනිදායින් ඉස්සෙල්ලා පුළුවන් නම් අස් කරලා පෙන්වන්න කිව්වා. ඔක්කොම අභියෝග කළේ එතුමා. එතුමා මාධ්‍ය සන්දර්ශන පවත්වලා අද මෙතැන ඇවිල්ලා එතුමා 36(1) යටතේ කථා කරනවා. එතුමාට කථා කරන්න අයිතියක් නැහැ. එතුමා මාධ්‍ය සන්දර්ශන පෙන්වලා මේ පළාත් සභාව හැල්ලුවට පත් කළා. එතුමා ඒක බලන්න ඕනෑ. එතුමාට 31 වැනිදා මුහුණ දෙන්න බැරිව අද ඇවිල්ලා 36(1) යටතේ කථා කරනවා. එතුමාට කථා කරන්න ඕනෑ නම් පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ කථා කරන්න තිබුණා නේ? අපේ වරප්‍රසාද කඩ කරලා තිබෙන්නේ එතුමා. අපේ සියලුම මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩ කළේ එතුමා. ඒ නිසා එතුමාට කියන්න අනුන්ගේ වරප්‍රසාද කඩලා තමන්ගේ වරප්‍රසාද ගැන කථා කරන්න එපාය කියලා.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේක මගේ පෞද්ගලික වරප්‍රසාදයක් පමණක් නොවෙයි. මේක මා නියෝජනය කරන මහර ආසනයත්, කැලණිය ආසනයත්, බියගම ආසනයත් සියලුම ජනතාවගේ වරප්‍රසාදයක් මම මේ නගන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජනතාවගේ නොවෙයි. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න කෝ?

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

මමත් ඒ ජනතාව තමයි නියෝජනය කරන්නේ. ඒ නිසා මටත් ඒ වරප්‍රසාදය බලපානවා. ගරු සභාපතිතුමනි, මේක මම යොමු කරනවා ගරු මහ ඇමතිතුමාටත්, ඒ වාගේම අධ්‍යාපන ඇමතිවරයාටත්. මහර කැලණිය අධ්‍යාපන කොට්ඨාශයේ ජනාධිපති විද්‍යාලය අද වන කොට - අපි පසුගිය කාල වකවානුවේ මර්වින් සිල්වා ඇමතිතුමා ඉන්න කාලයේ එතුමා බලෙන් පවරා ගත්තා, ඒ රෙස්ට් හවුස් එක තිබෙන භූමිය. මේ කාරණය සම්බන්ධයෙන් බොහෝ දෙනා දන්නවා. අපි ඒ ඉඩම පවරාගෙන - පෞද්ගලික හේතූන් මත, එතුමාගේ පෞද්ගලික දේශපාලන න්‍යායට ඒ දේ ක්‍රියාත්මක කරන්න හදන කොට අපි එතැනම තිබෙන ඊට යාබද ඉඩම මහර ජනාධිපති විද්‍යාලයේ ඉඩම අපේ ප්‍රදේශයේ - මෙතැන හරියට භූ විෂමතාවය බැලුවොත් මහර ආසනයත්, කැලණිය ආසනයත්, බියගම ආසනයත් යන තුම්මුල්ලේ තමයි මේ විද්‍යාලය තිබෙන්නේ. මේ නිසා බියගමත්, කැලණියත්, මහරත් කියන සියලුම ජනතාවට මේ විද්‍යාලයේ අධ්‍යාපන කටයුතු කිරීම පිළිබඳ වරප්‍රසාදය තිබෙනවා. මම ඔබතුමාගෙන් ගෞරවනීය ඉල්ලීමක් කරනවා. මහ ඇමතිතුමාටත්, ඒ වාගේම අධ්‍යාපන ඇමතිතුමාටත්. මේ ඉඩම, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මේ වන විට පවරා ගන්න කටයුතු කරලා බියගම ප්‍රාදේශීය ලේකම්තුමිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් පැහැදිලියි.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

නැහැ. ඔබතුමාට මම මේක පැහැදිලි කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට පැහැදිලි කරන්න තිබුණා. කලින් ඇවිල්ලා මට දුන්නා නම්, පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ මට දෙන්න තිබුණා. ඔබතුමා එතැන නොකර දැන් 36(1) යටතේ මට අවස්ථාව දෙන්න බැහැ.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

වෙන්න තිබෙන ප්‍රශ්නය. එහෙම නම් ඔබතුමා භාර ගන්න ඕනෑ. හෙට මේ සියලු දෙනා විශාල උද්ඝෝෂණයකට ලැහැස්ති වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ඔය ප්‍රකාශය කරන්න තිබුණා කලින් ඇවිල්ලා. ඔබතුමා මට පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ අවස්ථාව ඉල්ලුවා නම් දෙන්න තිබුණා. ඔබතුමා ප්‍රමාද වුණා. ඔබතුමාට 36(1) යටතේ කියලා මට ඒ ගැන කථා කරන්න කාලය දෙන්න බැහැ.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

36(1) නොවෙයි. මොකක් හරි ජනතාව වෙනුවෙන් මේ වරප්‍රසාදය මට දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කරන්න බැහැ.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

කරුණාකරලා මේ වෙනුවෙන් මැදිහත් වෙන්න.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, මම එදා වතුපිටිවල සේවකයෝ මතු කරන ප්‍රශ්නයක් ගැන වරප්‍රසාද ප්‍රශ්නයක් ඇහුවා. ඒකට අවස්ථාව දුන්නේ නැහැ.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

අපේ ප්‍රදේශවල ඉඩම් වැඩි වෙන්නේ නැහැ. අපේ ප්‍රදේශවල ජනතාවගේ උවමනා එපාකම් වැඩි වෙනවා. ඒ නිසා කරුණාකරලා මීට මැදිහත් වෙලා මේ ප්‍රශ්නය විසඳලා දෙන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමාගේ වැරැද්ද. ඔබතුමා වෙලාවට ආවා නම් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. කරුණාකරලා වෙලාවට සභාවට එන්න. ඔබතුමා උදේ ආවා නම් එහෙම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. වෙලාවක් දෙනවා. කාලය ප්‍රශ්නයක් වෙනවා ඕවා කියන්න ගියාම.

මීළඟට සභාවේ කටයුතු යෝජනාව ඉදිරිපත් කිරීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව ලබා දෙනවා.

## පළාත් සභාවේ කටයුතු
## PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

*ගරු සභාපතිතුමනි, "2015.12.18 වන දින හා 2015.12.23 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවයට අනුව අද දින (2016.01.05) න්‍යාය පත්‍රයේ සඳහන් පොදු කටයුතු විෂයයේ වැඩ කටයුතු රීති අංක 15(4), 63(අ)(2) හා 63(අ)(3) හි සඳහන් විධිවිධානයන්ගෙන් නිදහස්ව පවත්වාගෙන යා යුතුය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත : බස්නාහිර පළාත් සභාවේ අදහස
## RIGHT TO INFORMATION BILL : VIEWS OF THE WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

*ගරු සභාපතිතුමනි,"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය - "තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත"[1] බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත, ඉදිරිපත් කර 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ, 154(උ) ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාව යටතේ, මෙම පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශනයක් අතිගරු ජනාධිපතිතුමාණන් වෙත වාර්තා කිරීමට හැකිවනු පිණිස දින 12 ක් ඇතුළත ලබා දෙන ලෙස 2015.12.16 දිනැතිව බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාණන් විසින් දන්වා එවන ලදින්, 2015.12.22 දින සභා රැස්වීමේදී එකී පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන්නට රැස් වුණ මුත්, පනත් කෙටුම්පතෙහි ඇති සංකීර්ණභාවය හේතු කොටගෙන, ඒ පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කර සාකච්ඡා කරන්නට අවශ්‍යතාවයක් පැන නැගී ඇති හෙයින්ද දැනට ලැබී ඇති කාලපරාසය කිසිසේත් ප්‍රමාණවත් නොවන හෙයින්ද, ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දෙන ලෙස ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලා සිටිය යුතු යැයි මෙම පළාත් සභාව එදින නොබෙදී පළ කළ අදහස් අනුව, ප්‍රමාණවත් කාලයක් දැනටමත් ඉල්ලා ඇති අතර, 2015.12.23 දින සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එකඟතාවය පළ කළ පරිදි අද දින (2016.01.05 දින) මෙම පළාත් සභාව විසින්, එම "තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත" සම්බන්ධව සාකච්ඡා කර එළඹෙන තීරණයන්ට අනුකූලව එම අදහස් අතිගරු ජනාධිපතිතුමා වෙත දැන්වීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත ලබා දීමට ක්‍රියා කළ යුතු යැයි"මෙම පළාත් සභාව අදහස් කරයි.*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම කෙටුම්පත සම්බන්ධ අදාළ ලිපිලේඛන 2015.12.21 දින සභාවේදී ගරු මන්ත්‍රීතුමන්ලාගේ මේසය මත තබා ඇත. මෙම කෙටුම්පත සම්බන්ධව අවශ්‍ය නම් වගන්තියෙන් වගන්තිය විමසා ගන්නත් පුළුවන්. නැත්නම් සමස්තයක් ලෙස සාකච්ඡා කොට අදහස් ඉදිරිපත් කරන්නත් පුළුවන්. කාලය වෙන් කිරීමක් සිදු වෙන්නේ නැහැ. ඒ නිසා ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

අපේ කථික ලැයිස්තුවක් ලබා දුන්නා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් මට ආණ්ඩු පක්ෂයේ ලැයිස්තුවත් දෙන්න. වගන්තියෙන් වගන්තිය ගන්න ඕනෑද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අවශ්‍ය නැහැ.

[1] වැඩ කටයුතු අවසානයේ පළ කර ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් අපි සාකච්ඡා කිරීම ආරම්භ කරමු. මුලින්ම විපක්ෂයට ආරාධනා කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, අපි කථික ලැයිස්තුවක් ලබා දුන්නා. අපේ ගරු මන්ත්‍රීවරුන් තුළ මේ සම්බන්ධව සංශෝධන තිබෙනවා නම්, එතුමන්ලා ඉදිරිපත් කරයි. ඒවා ඇතුළත් කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. ඒක දෙපැත්තෙන්ම කෙරෙනවා. එතකොට සාධාරණයක් තිබෙනවා. මේක රටට, පළාතට අවශ්‍ය පනතක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇතුළු කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සංශෝධන යෝජනාව ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ පිළිබඳ එතුමන්ලාට සලකා බලන්න පුළුවන්. අපි අපේ අදහස් හා සංශෝධන ඇත්නම් ඒවා ලබා දෙමු.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මෙය සාකච්ඡාවට භාජනය කරලා, ඊට පස්සේ හැන්සාඩ් එක යවන්න. එතකොට හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපි එහෙම තමයි තීරණය කළේ. ඒ අනුව මෙම පනත් කෙටුම්පත සම්බන්ධව අදහස් දැක්වීමට මම මුලින්ම සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට තේ විවේකයෙන් පසුව ආරාධනා කරන්න බලාපොරොත්තු වෙනවා. මේ අවස්ථාවේදී අපි තේ විවේකයට සම්බන්ධ වෙලා ඉන් අනතුරුව මෙම සාකච්ඡාවට සම්බන්ධ වෙමු.

ඒ අනුව දැන් මෙම සභාව පෙරවරු තේ විවේකය සඳහා තාවකාලිකව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්හිටුවන ලදින් පූ.භා. 10.25ට යළිත් රැස් විය.***

*Sitting, accordingly suspeneduntill 10.25 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදය ආරම්භ කිරීමට මම විපක්ෂය වෙනුවෙන් සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පත පිළිබඳව මූලික කරුණු කිහිපයක් සඳහන් කිරීමට අවසර පතනවා. විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පිළිබඳව කථා කරද්දී, ජනතාවගේ පැත්තෙන් ගත් ජයග්‍රහණයක් ලෙස මම මෙය මේ අවස්ථාවේ මතක් කරනවා. විශේෂයෙන්ම 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත වෙද්දී, 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් සමඟ සම්මත විය යුතු පනතක් ලෙස තමයි මේක පැවැතුනේ. නමුත් කිසියම් කාල ප්‍රමාදයක් සිදු වුණා. ඒ කොහොම වෙතත් මේ අවස්ථාවේදී හරි තොරතුරු දැන ගැනීමේ පනත ඉදිරිපත් වීම පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණ පැත්තෙන් තිබෙන්නේ කිසියම් සතුටක්.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ දන්නවා. 19 වන ව්‍යවස්ථා සංශෝධනය කරද්දී, 19 වන ව්‍යවස්ථාවේ සංශෝධනයට අත්‍යවශ්‍ය අංග කිහිපයක් අපේ අතින් මග හැරුණු බව. කොහොම වෙතත් අත්‍යවශ්‍ය සංශෝධනයක් ලෙස පක්ෂ මාරුවට අදාළ තහනම පිළිබඳව සම්මත කර ගන්න බැරි වුණා. ඉදිරියේදී එන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ හරි මේ පක්ෂ මාරුව පිළිබඳව සාකච්ඡා වෙයි කියලා අපි හිතනවා. පක්ෂ මාරුවට අදාළ නැවතීමේ තිතක්, මන්ත්‍රී ධුරය සිය අසුනේ තබා යෑමට අවශ්‍ය සංශෝධනය එයි කියන අවංක විශ්වාසය අප සතුව තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී කාලය නාස්ති කරන්නේ නැහැ. අත්‍යවශ්‍ය සංශෝධන කිහිපයකට තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න මම මේ අවස්ථාවේ අවසර පතනවා.

විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, මෙම සංශෝධනය තුළ තමුන්නාන්සේගේ අවධානය යොමු කරනවා, පනත් කෙටුම්පතේ 12(1) වගන්තියට. ගරු සභාපතිතුමනි, 12(1) වගන්තියෙහි තිබෙන්නේ, සංයුතිය පිළිබඳව. මේ කොමිෂන් සභාවේ සංයුතිය පිළිබඳව තමයි

12(1) වගන්තියෙන් විස්තර වෙන්නේ. ඒකේ තිබෙන්නේ ගරු සභාපතිතුමනි, වෙනත් සිවිල් සමාජ සංවිධාන. ඒකේ Criteria එකේ අන්තිමට තිබෙන්නේ, 12(1) (ඇ) වෙනත් සිවිල් සමාජ සංවිධාන කියලා තමයි තිබෙන්නේ. නමුත් ගරු සභාපතිතුමනි, අර්ථ නිරූපණ දක්වා ඇති තැන, කිසියම් හෝ ස්ථානයක වෙනත් සිවිල් සමාජ සංවිධානයකට අදාළ අර්ථ නිරූපණ ඇතුළත් වී නැහැ. ගරු සභාපතිතුමනි, අර්ථ නිරූපණයේදී රාජ්‍ය නොවන සංවිධානයක් කියන එකට අදාළ අර්ථ නිරූපණය තමයි දක්වලා තිබෙන්නේ. දැන් 31 වන පිටුවේ තිබෙනවා, රාජ්‍ය නොවන සංවිධානයකට අවශ්‍ය අර්ථ නිරූපණය.

ගරු සභාපතිතුමනි, අපට මේකේ කිසියම් වෙනත් පැත්තක් පේනවා. විශේෂයෙන්ම මේ කොමිෂන් සභාව සමන්විත වෙන්නේ රාජ්‍ය මුදල්වලින්. ගරු සභාපතිතුමනි, ඊට අමතරව සීමාවකින් තොරව ලැබෙන විදේශීය ප්‍රදාන, ඕනෑම කෙනෙකුගෙන් ගන්න ප්‍රදාන මත - එතකොට අපට පෙනෙනවා, එක පැත්තකින් නිකම් අර නංගි පෙන්වලා අක්කා දෙන එකක්ද මේ වෙන්න යන්නේ කියලා. මොකද, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව මේකේ මූලික විග්‍රහයේ නැහැ. නමුත් අර්ථ නිරූපණයේ තිබෙනවා. එතකොට මේ රාජ්‍ය නොවන සංවිධානවලින් ආධාර ලබා ගැනීමක් ද මේ වක්‍රෝක්තියෙන් වෙන්නේ කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේගේ අවධානය යොමු කරනවා. විශේෂයෙන්ම මෙන්න මේ "වෙනත් සිවිල් සමාජ සංවිධාන", කියන අර්ථ නිරූපණය රාජ්‍ය නොවන සංවිධාන කියන අර්ථ නිරූපණය කියන තැනට පැමිණිය යුතුයි. ඒ අනුව ගරු සභාපතිතුමනි, මම යෝජනා කරනවා. 43 වගන්තියේ, අර්ථ නිරූපණය යටතේ රාජ්‍ය නොවන සංවිධාන වෙනුවට,"වෙනත් සිවිල් සමාජ සංවිධානවලට" අදාළ අර්ථ නිරූපණයක් සපයන්නය කියලා ගරු සභාපතිතුමනි.

දෙවැනි එක තමයි, 34(1) වගන්තිය කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ගරු සභාපතිතුමනි, 34(1) වගන්තියෙහි තිබෙන්නේ, මේ තොරතුරු ලබා ගත් පුද්ගලයෙකුට ඒ තොරතුරු ලබා ගැනීම ප්‍රතික්ෂේප කළොත්, ඒ තැනැත්තාට අභියාචනයක් කරන්න පුළුවන් කියලයි. ඒ අභියාචනය ගණන් ගන්නේ නැත්නම් කිසියම් වෙලාවක අධිකරණයට යන්න පුළුවන්. ඒ අධිකරණය හැටියට මේකේ දක්වලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි, අභියාචනාධිකරණය. ඒ නිසා තමුන්නාන්සේගේ අවධානය යොමු කරනවා. ශ්‍රී ලංකාවටම අභියාචනාධිකරණ තිබෙන්නේ එකයි. හැබැයි, මේ අභියාචනාධිකරණය පුළුල් කරලා සිවිල් අභියාචනාධිකරණ මුළු ලංකාවේම, පළාත් නවයටම බලපාන පරිදි එක ගණනේ දාගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, යාපනයේ ඉන්න මනුස්සයෙකුට, අම්පාරේ ඉන්න මනුස්සයෙකුට හම්බන්තොට ඉන්න මනුස්සයෙකුට කොළඹ එන්න ඕනෑ නැහැ. එක වචනයක් වෙනස් කිරීමෙන්, මේකේ සහනය පතන්න පුළුවන්, අභියාචනාධිකරණය සහ/හෝ සිවිල් අභියාචනාධිකරණය කියන වචනය මෙතැනට ගැබ් වෙනවා නම්. මෙලෙස එක වචනයක් වෙනස් කිරීමෙන් විශාල සහනයක් රටේ ජනතාවට මේ නිසා පැමිණෙනවා. ඒ අනුව මම යෝජනා කරනවා. 34(1) වගන්තියේ 5 වන පේළියේ ඇති වාක්‍යයට "දින 14 ක් ඇතුළත අභියාචනාධිකරණය" කියන වචනය වෙනුවට "අභියාචනාධිකරණය වෙත සහ/හෝ සිවිල් අභියාචනාධිකරණය වෙත පුරවැසියෙකුට යෑමේ අයිතිය තිබෙනවාය කියලා." සංශෝධනය විය යුතු යැයි යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, ඊට අමතරව මෙතැන තිබෙනවා තවත් එක වැදගත් සංශෝධනයක්. පනත් කෙටුම්පතේ දෙවැනි වගන්තියට අනුව මේ සම්පූර්ණම පනතේ වගකීම දරන්නේ ජනමාධ්‍ය විෂය පවරා ඇත්තා වූ අමාත්‍යාංශයේ ඇමතිවරයාගේ වගකීම විය යුතුයි කියලයි. ගරු සභාපතිතුමනි, ඊයේ අපි වැඩ මුළුවේදීත් සාකච්ඡා කළා. මේ ජනමාධ්‍ය විෂය භාර ඇමතිවරයාට, මොකක්ද මේ තොරතුරු කියන වචනය නිසාද ජනමාධ්‍ය භාර අමාත්‍යවරයාට මෙම පනත් කෙටුම්පතේ විෂය භාරකාරත්වය ආවේ කියලා. මේක ඇත්ත වශයෙන්ම විය යුත්තේ - ගරු සභාපතිතුමනි, තොරතුරු තිබෙන්නේ කොහේද? සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ. ලංකාවේ තිබෙනවා, සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවක්. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව කියන්නේ, මිනිස්සුන්ව ගැන ගැන ඉන්න ආයතනයක් විතරක් නොවෙයි. Statistics- සංඛ්‍යා ලේඛන තිබෙන්නේ, සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ. එතකොට ගරු සභාපතිතුමනි, දෙවැනි වගන්තිය මෙසේ සංශෝධනය විය යුතුයි කියලා මම යෝජනා කරනවා. ඒ යෝජනාව තමයි, "මේ පනතේ විධිවිධාන සක්‍රීය ලෙස බලාත්මක වීම සහතික කිරීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය විෂය පවරා ඇත්තා වූ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා" වෙනුවට "ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව භාර විෂය භාර

අමාත්‍යවරයා" මේකේ වගකීම ගත යුතුයි කියන යෝජනාව තමුන්නාන්සේට මම මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා.
[ගරු සුනිල් වටගල]

ගරු සභාපතිතුමනි, මෙන්න මේ සංශෝධන ටික තමයි මට මුණ ගැසුණේ. මීට අමතරව තවත් මන්ත්‍රීවරු කථා කරාවි. විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, ඉන්දියානු තොරතුරු දැන ගැනීම පනත නඩු තීන්දුවලින් පෝෂණය වුණු පනතක්. ඇත්ත වශයෙන්ම මීට වඩා පුළුල් පනතක්. හැබැයි, ඉන්දියානු තොරතුරු දැන ගැනීමේ පනත විග්‍රහ කරද්දී ඒකට ඇඟිල්ලක් ගහන්න ඉඩ තියලා නැහැ. නමුත් මෙම පනත් කෙටුම්පතේ ගොඩක් අඩුපාඩු තිබෙනවා. විශේෂයෙන්ම සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාත් මේක පැහැදිලි කළා. ඉන්දියානු පනතේ තිබෙනවා, කොමිෂන් සභාවේ සාමාජිකයෙකුගේ වයස් සීමාව කොපමණද කියලා. අවුරුදු 65 සම්පූර්ණ වෙද්දී එයා ඒ කොමිෂන් සභාවේ ධුරයෙන් යන්න ඕනෑ. අවුරුදු 65 වෙද්දී. හැබැයි, අපේ පනත් කෙටුම්පතේ, මේ හඳුන්වා දෙන පනත් කෙටුම්පතේ ඇත්ත වශයෙන්ම වයස් සීමාවක් නැහැ. ඒ නිසා මම තමුන්නාන්සේට යෝජනා කරනවා. මේ පනතේ මේ තොරතුරු දැන ගැනීමේ පනතේ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ වයස, ඇත්ත වශයෙන්ම ඉන්දියානු පනත හා සමානව අවුරුදු 65 දක්වා කාලයකට සීමා කළ යුතුයි කියලා යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, එවැනි අත්‍යවශ්‍ය සංශෝධන ටික මේ වෙලාවේ ඉදිරිපත් කරනවා. ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි 19 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරද්දී වාගේම, පසුගිය මාසයේ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ වෙද්දී, ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි අපේක්ෂා කරපු මේ රටේ ජනතාවගේ අවධානයටත් විශේෂයෙන් ලක් කළා, තොරතුරු දැන ගැනීමේ පනතක් අවශ්‍යයි කියලා. ඒ පනත ප්‍රමාද වී හෝ පැමිණීම පිළිබඳව අපි අපේ සහයෝගය මේ අවස්ථාවේ පළ කරනවා. ඒ වාගේම මේ යෝජනා කරන සංශෝධනත් ඔබතුමාගේ මාර්ගයෙන් මධ්‍යම රජයේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. විශේෂයෙන්ම සංකල්පයක් විධියට තොරතුරු දැන ගැනීමේ ජනතාව සතු අයිතිය ලැබිය යුතුයි කියන කාරණය පිළිගන්න ගමන් මේ පනත පිළිබඳව අපට බරපතළ විවේචනයක් තිබෙනවා. අද දවසේ මේ පනත් කෙටුම්පත ක්‍රියාත්මක වීම පිළිබඳව බරපතළ විවේචනයක් තිබෙනවා. අපි මේ පනත් කෙටුම්පතට සංශෝධන ඉදිරිපත් කරන්න යන්නේ නැහැ. මොකද, අපි පැහැදිලිව දන්නවා, ලංකාවේ ක්‍රියාත්මක වන නීතිය අනුව පළාත් සභාවට බලපාන කාරණයක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ නීතියක් හදනවා නම්, සාම්ප්‍රදායිකව ඒ නීතිය සම්මත කරන්න කලින් පළාත් සභාවට එවන එක සිද්ධ කරනු ලබනවා. ඒ අනුව මේ පනතත් පළාත් සභාවට ඇවිල්ලා තිබෙනවා. අපි දාන සංශෝධන මේ පනතේ ඇතුළත් කරනවාද නැද්ද කියන කාරණය පිළිබඳව සහතිකයක් නැති නිසා අපි සංශෝධන ඉදිරිපත් කරන්න යන්නේ නැහැ. නමුත් මේ පනත ගැන අපට තිබෙන විවේචන ඉදිරිපත් කරලා, අපි කථා කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, මම කනගාටු වෙනවා. අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා කථා කරන කොට කිව්වා, 19 වන සංශෝධනයේදී අපට මග හැරී ගිය කාරණා තිබෙනවාය කියලා. අපි ඉතාමත්ම කනගාටු වෙනවා. ජාතික විධායක සභාව නියෝජනය කළා. ආණ්ඩුව හදන්න උදව් කළා. අන්තිමට 19 වන සංශෝධනය හදද්දී මග හැරී ගියාය කියන කාරණය කියද්දී, මේ රටේ ජනතාව සම්බන්ධයෙන්, ඔවුන්ට තිබෙන වගකීම ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවාය කියන කාරණය මතක් කරන්න ඕනෑ. ජනවාරි මාසේ 08 වැනිදා වුණු සිද්ධිය තවමත් අපි කියන්නේ කුමන්ත්‍රණයක් කියලා. මේ කුමන්ත්‍රණය ජනතාවගෙන් වසන් කරන්න දාපු කාරණා දෙක තමයි විධායකයේ බලය අඩු කරන්න කටයුතු කරනවා සහ, තොරතුරු දැන ගැනීමේ පනත ඉදිරිපත් කරනවාය කියන කාරණය. මේ ආණ්ඩුව මේ කාරණා දෙකටම සාධාරණය ඉෂ්ට කළේ නැහැ. විශේෂයෙන් 19 වන සංශෝධනය ගෙනැල්ලා විධායකයේ බලතල අඩු කරනවාය කියලා කිව්වාට, එකම බලයක්වත් අඩු කළේ නැහැ. අධිකරණයේදී ජනතාවට ජනාධිපතිවරයා සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමේ මුක්තිය තිබෙනවාය කියන කාරණය තමයි එකම සංශෝධනය විධියට 19 වන සංශෝධනය යටතේ ගෙනාවේ. වෙන, ජනතාවට හිතකර කිසිම සංශෝධනයක් ඒකේ තිබුණේ නැහැ. විධායකය එහෙම්පිටින්ම ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම මේ තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පතේ විධායකයේ

අඩු තවදුරටත් ජනතාව වෙතට දිගු කිරීමක් විධියට තමයි අපි දකින්නේ. විධායකය විසින් මේ රට පාලනය කරන්න, රටේ ජනතාව පාලනය කරන්න ගන්න උත්සාහයට තවදුරටත් ශක්තියක් සැපයීමක් තමයි මේ තොරතුරු දැන ගැනීමේ පනත මඟින් සිද්ධ කරන්නේ කියන කාරණය අපි කියන්න ඕනෑ.

තොරතුරු දැන ගැනීමේ අයිතිය එක්සත් ජාතීන්ගේ සංවිධානය පිළිගන්නවා. ලෝකයේ බොහෝ රටවල් තොරතුරු දැන ගැනීමේ පනත් සම්මත කරලා තිබෙනවා. ඒ අයිතිය ජනතාවට දීලා තිබෙනවා. හැබැයි, නිසි ප්‍රජාතන්ත්‍රවාදයක් ක්‍රියාත්මක නොවන අපි වාගේ රටක මේ තොරතුරු දැන ගැනීමේ අයිතිය සාධාරණව ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව ප්‍රශ්න, ගැටළු තිබෙන වෙලාවක මේ පනත් කෙටුම්පත දාන්නේ දේශපාලන පළි ගැනීම්, ඒ වාගේම දේශපාලන මඩ ගැසීම්, ඒ වාගේම ආණ්ඩුවට සල්ලි හොයා ගැනීම සඳහා තිබෙන ප්‍රශ්න මගහරවා ගැනීමටයි. මේ පනත ක්‍රියාත්මක කරන්නේ ඒ සඳහාය කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ. ඒක කියන්නට අපට කාරණා ගණනාවක් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ පනතේ අට වැනි පිටුවේ 20 (ආ) කියන තැන තිබෙනවා, මේ තොරතුරු දෙන්න ගාස්තු අය කළ යුතුයි කියලා. තොරතුරු දෙන්න ගාස්තු අය කරනවාය කියන එකේදී, මේ පත් කරන කොමිෂන් සභාව තමයි ඒ ගාස්තු තීන්දු කරන්නේ. ඒ නිසා ගාස්තුව කොපමණ වෙනවාද කියලා අපට තවම හිතාගන්න බැහැ. ජනතාව පෙළන ගාස්තුවක් බවට මෙය පත් වුණොත්, ජනතාවට දරා ගන්න බැරි ගාස්තුවක් බවට මෙය පත් වුණොත් මේ ආයතනය ආණ්ඩුවට මුදල් සොයලා දෙන ආයතනයක් බවට පත් වෙනවා මිසක තොරතුරු පිළිබඳ ජනතාවට සාධාරණය ඉෂ්ට කරන ආයතනයක් බවට පත් වෙන්නේ නැහැ.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, මේ පනතේ අට වැනි පිටුවේ 9 වැනි වගන්තිය යටතේ තිබෙනවා, තොරතුරු ලබා දීමේ අමාත්‍යවරුන් සතු කාර්යභාරය. මේක බරපතළ විධියට අමාත්‍යාංශවලට දරා ගන්න බැරි තත්ත්වයක් බවට පත් වෙනවා. හැම අමාත්‍යාංශයක්ම තමන් කරන ව්‍යාපෘති සම්බන්ධයෙන් විශාල ගොනු සකස් කරලා, ඒ ආයතනවලට තොරතුරු නිලධාරියෙක් පත් කරලා, අභියාචනා නිලධාරියෙක් පත් කරලා වෙනම නිලධාරී පැළැන්තියක් පත් කරලා කටයුතු කරන්න සිද්ධ වෙනවා, මේ තත්ත්වය ඇති කරන්න. මේක ආයතනයකට දරා ගන්න බැරි තත්ත්වයක්. අද රාජ්‍ය අංශයේ රැකියා වැඩි කිරීම රාජ්‍යයට බරක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි රාජ්‍ය අංශයේ රැකියා වැඩි කර ගන්න බැරිව තිබෙන්නේ. ඉතින් මෙවැනි තනතුරු නැවත ඇති කරන්න වුණොත් නැවත අලුත් සේවාවක් ඇති කරන්න වෙනවා. සන්නිවේදන සේවාවක් රජයේ ස්ථාපිත කරන්න වෙනවා. තොරතුරු සේවාවක්. එතකොට මේ එක නිලධාරියෙකුට මේ වැඩේ කරන්න බැහැ. රුපියල් ලක්ෂ පහක ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් තොරතුරු ලබා දෙන්න අවශ්‍ය කරන ගොනු සකස් කරන්නය කියලා කියනවා. ලක්ෂ පහක් නම් පළාත් සභාවට සිද්ධ වෙනවා, ගොනු නවදාහක් විතර අලුතෙන් නිර්මාණය කරන්න. ඒ තොරතුරු ඉල්ලපු වෙලාවක දෙන්න. මේකට විශාල කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වෙනවා. විශාල තනතුරු සංඛ්‍යාවක් නිර්මාණය කරන්න වෙනවා. ආයතන විසින් මේ බර දරන්නේ කොහොමද කියන ප්‍රශ්නය මතු වෙනවා. ඒ නිසා මේක අමාත්‍යාංශවලට අලුත් කරදරයක්. රාජ්‍ය අංශය එවැනි තත්ත්වයකට මේකෙන් පත් වෙනවා.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, 9 වන පිටුවේ 12(1) වගන්තියේ තිබෙනවා. ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථාදායක සභාවේ උපදෙස් අහන්න පුළුවන්. හැබැයි, ජනාධිපතිතුමා තමයි මේ කොමිසමට සාමාජිකයෝ පත් කරන්නේ. ජනාධිපතිවරයා තමයි සභාපතිවරයාව පත් කරන්නේ. එතකොට ජනාධිපතිවරයාගේ සභාපති කෙනෙක් ඉන්නේ. ජනාධිපතිවරයා තමයි පාලනය කරන්නේ. ඉතින් ඍජුවම විධායකය මේ කොමිසමේ පාලනය අතට ගන්නවා. එතකොට විධායකය තමයි මේ කොමිසම පාලනය කරන්නේ. ඒ නිසා මේ කොමිසම විධායකයේ ඕනෑ එපාකම් ඉෂ්ට කරන කොමිසමක් බවට පත් වෙනවා. ඒ නිසා මේක විධායකයේ අඩු ජනතාව තලා පෙළන්න තවදුරටත් දික් කරන අවස්ථාවක් විධියට තමයි අපි දකින්නේ.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, 14 පිටුවේ 16(1) (ආ) යටතේ තිබෙනවා. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාත් කිව්වා. මේක තමයි මේ සම්බන්ධයෙන් බරපතළම සැකයට තුඩු දෙන කාරණය. 14 පිටුවේ 16(1) (ආ) බලන්න. මේ කොමිෂන් සභාවේ අරමුදල ගැන කියනවා. මේ කොමිෂන් සභාවේ අරමුදල පිහිටුවද්දී කොමිෂන්

සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය යුතුයි - මේකට අරමුදල් දෙන්න [ගරු මහේෂ් අල්මේදා]

පුළුවන් කියලා කියනවා. ඒ එක්කම කියනවා, "ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ඕනෑම මූලාශ්‍රයකින් ලැබෙන පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන" මේ කොමිසමට භාර ගන්න පුළුවන්ය කියලා. අපි අහනවා මේ කොමිසමට තෑගි හම්බ වෙන්නේ, ඇයි? කියලා. මේ කොමිසමට තෑගි දෙන්නේ ඇයි? මේ කොමිසමට තෑගි දෙන්නේ, මේ කොමිසමට ප්‍රදාන දෙන්නේ වෙන රටවල්. ඒ නිසා බරපතළ සැකයක් මතු වෙනවා. මේ ආයතනය පිහිටුවන්නේ විදේශීය රටවල්වලට අවශ්‍ය කරන යම් යම් ක්‍රියාදාමයන් මේ රට තුළ එලා ගැනීමේ යාන්ත්‍රණයක් විධියටද? එවැන්නක් සඳහා තමයි මේ ආයතනය අද දවස ඇතුළේ මේ රට තුළ එලා ගන්නේ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මේකට සාමාජිකයෝ පත් කරද්දී, කියනවා, යම් වෘත්තියක් සහ නිලයක් නොදරන අය තමයි සාමාජිකයෝ වෙන්නේ කියලා. අපට අහන්න සිද්ධ වෙනවා, එහෙම අය කොහේද ඉන්නේ කියලා. යම් වෘත්තියක් නොකරපු අය, නිලයක් නොදරපු අය ලංකාව ඇතුළේ ඉන්නවාද? ඒ වාගේම මේකේ සාමාජිකයෝ විධියට රාජ්‍ය නොවන සංවිධානවල අයව පත් කරන්න පුළුවන්. ඒ නිසා මේක ඉදිරි කාලයේදී ඔත්තු සේවා සපයන ආයතනයක් විධියට ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා මේක භයානක ආයතනයක්. මේකෙන් ජනතාව අපේක්ෂා කරන දෙයට වඩා ජනතාවට එහා ගිය රාජ්‍යයේ තොරතුරු පිටට සපයන, රාජ්‍යය කඩාකප්පල්කාරී කරන්න බලපෑම් කරන්න පුළුවන් ආයතනයක් බවට පත් වෙනවා. මෙවැනි ආයතනයක් 2009 තිබුණා නම් කවදාවත් මේ රටට යුද්ධය ජයග්‍රහණය කරන්න ලැබෙන්නේ නැහැ. මේ තොරතුරු සියල්ල වෙන රටවල් විසින්, විදේශීය ආයතන විසින් ලබා ගෙන අපේ සියලු රහස් එළි වෙලා යුද්ධය ජයග්‍රණය කරන්න තිබෙන අවස්ථාවන්, රටේ ආරක්ෂාවන් සම්බන්ධයෙන් තිබෙන අවස්ථාවන් වැළකිලා යනවා. මේ පනතේ කියනවා, ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වැදගත් තොරතුරු සපයන්න බැහැයි කියලා. හැබැයි, කාටද ඒ සහතිකය දෙන්න පුළුවන්. මේකේ ජනාධිපතිවරයා නම් සභාපතිවරයා පත් කරන්නේ, ජනාධිපතිවරයා නම් කොමිසමේ සාමාජිකයෝ පත් කරන්නේ, කාටද? ඒ සහිතකය දෙන්න පුළුවන් මේකෙන්



තොරතුරු එළියට යන්නේ නැහැයි කියලා. ඒ නිසා මේකෙන් තොරතුරු විශාල සංඛ්‍යාවක් එළියට යනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට මතක් කරනවා. මේ තොරතුරු සම්බන්ධ නිලධාරීන් පත් කිරීම ගැන මම කිව්වා. ඒ වාගේම අභියාචනා කරන්න පුළුවන් අවස්ථාව ගැන කිව්වා. අභියාචනා නිලධාරියෙකුත් ආයතනවලට පත් කරන්න ඕනෑ. තොරතුරු සපයන්න නිලධාරියෙකු වාගේම හැම ආයතනයක්ම, ඒ තොරතුරු සැපයීම සම්බන්ධයෙන් යම් වැරැද්දක්, අඩුපාඩුවක් වුණා නම් අභියාචනය සලකා බලන්න අභියාචනා නිලධාරියෙකු පත් කරන්න ඕනෑ. එතකොට අනිවාර්යයෙන්ම හැම ආයතනයකම අලුත් නිලධාරීන් දෙන්නෙක් පත් වෙනවා. ඒ දෙන්නාට සහායක බලකායක් වෙනම පත් කරන්න වෙනවා. එතකොට දරා ගන්න බැරි සේවක සංඛ්‍යාවක් ආයතනවල පත් කරන්න වෙනවා. ඒ එක්කම කොමිසමට අභියාචනා කරලා එයින් සෑහීමකට පත් වෙන්න බැරි නම්, ඒ තොරතුරු ලබා ගන්න සහ ඒ සාධාරණය ඉෂ්ට කර ගන්න අභියාචනා අධිකරණයට යන්න ඕනෑ. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා නීතිඥයෙක් විධියට කිව්වා, ලංකාවේ තිබෙන්නේ එක අභියාචනාධිකරණයයි. මේ තොරතුරු සම්බන්ධයෙන් ජනතාවට ප්‍රශ්නයක් වුණොත් අභියාචනා ඉදිරිපත් කරන්නේ කොහොමද? කියලා.

ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පනත ඉතාම ගැටළුකාරී පනතක්. ඉතාම ප්‍රශ්නකාරී පනතක්. තොරතුරු දැන ගැනීමේ අයිතිය ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහතික කරලා තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (ආ) ව්‍යවස්ථාවේ මේ අයිතිය තහවුරු කරලා තිබෙනවා. අපේ රටට මේ තහවුරු කරලා තිබෙන අයිතිය හොඳටම ප්‍රමාණවත්ව තිබෙද්දී, තොරතුරු දැන ගැනීමේ අධිකාරියක්, කොමිෂන් සභාවක් පත් කරන්නේ තවත් කුමන කාරණාවටද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඒ නිසා මේක කේලම් අධිකාරියක්. මේක පුද්ගලයන්ට, තැන් තැන්වලට ආයතනවලට, රටවල්වලට කේලම් කියන්න පත් කරන අධිකාරියක්. ඒ වාගේම මේක ඔත්තු සේවා අධිකාරියක්. මේක ඔත්තු සේවා සපයන්න පත් කරන අධිකාරියක්. ඒ වාගේම මේක ආණ්ඩුවට මුදල් සොයා ගන්න පාවිච්චි කරන ආයතනයක්. මේ ආයතනය පාවිච්චි කරන්නේ සල්ලි හොයන්න. මේ ආයතනයෙන් භාණ්ඩාගාරයට සල්ලි හොයා ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම ජනතාවට තොරතුරක් ලබා ගන්න අවශ්‍ය මුදල මොකක්ද කියලා පැහැදිලිව තීරණය කරලා නැති නිසා,

කඩදාසිවලට යන මුදල විතරද ගන්නේ? එහෙම නැත්නම් තවත් මුදලක් ගන්නවාද කියන කාරණය පැහැදිලි නැති නිසා ඕනෑ මුදලක් අය කරලා තමයි තොරතුරු දෙන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා මේක ආදායම් ලබන ආයතනයක් බවට පත් කරන්නට කටයුතු කරාවි. ඒ වාගේම දේශපාලන පළිගැනීම්වලට මේ ආයතනය පාවිච්චි කරනවා. බොහෝ පෞද්ගලික තොරතුරු සහ යම් යම් පුද්ගලයෝ කරන විවිධ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ලබා ගෙන දේශපාලන පළිගැනීම් කිරීමේ හැකියාව තිබෙනවා. ඒ වාගේම මේක පුද්ගලයින්ට සහ සංවිධානවලට මඩ ගහන්න, දේශපාලන වශයෙන් ප්‍රහාරයන් එල්ල කරන්න, යම් තොරතුරු ලබා ගන්න පාවිච්චි කරන්න පුළුවන් අධිකාරියක් බවට පත් වෙනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

දැන් මේකට විරුද්ධව ද ඡන්දය දෙන්නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, අපි කියන්නට ඕනෑ. සුපිරි ප්‍රජාතන්ත්‍රවාදයක් ක්‍රියාත්මක කරන රටක, මීට අවුරුදු 100 කට කලින් ස්විස්ටර්ලන්තයේ තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත සම්මත කරලා, ජනතාවට ඒ සහතිකය ලබා දීලා තිබෙනවා. ඒ රටේ ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදයට අනුව, තොරතුරු ලබා ගැනීමේ අයිතිය පැවතීම ඉතාම වැදගත්. නමුත් - (බාධා කිරීමක්) ප්‍රජාතන්ත්‍රවාදය නිසි ලෙස ක්‍රියාත්මක වෙන්නේ නැති, ජනාධිපතිවරයාගේ අසීමිත බලය ජනතාව තලා පෙලා දාන්න පාවිච්චි කරන ව්‍යවස්ථාවක් ක්‍රියාත්මක වන රටක මෙවැනි බලයක් ලැබුණොත්, ඒ බලය ජනතා හිතකාමීව පාවිච්චි වෙන්නේ නැහැ. එක පුද්ගලයෙකුට, එහෙම නැත්නම් ආයතනයකට, තමන්ට ජනතාව පෙළා දාන්න පුළුවන් බලයක් විධියට පාවිච්චි වෙන එක තමයි වෙන්නේ. ඒ නිසා මේ පනත් කෙටුම්පත මේ වෙලාවේ සම්මත කරන එක විදේශීය රටවල් සතුටු කරන්නත්, ඒ වාගේම විදේශීය ආයතන සතුටු කරන්නත්, ජනවාරි මාසේ 08 වැනිදාට කලින් බොහෝ රටවල්වලට දීපු පොරොන්දුව ඉෂ්ට කිරීමක් විධියටත් කෙරුවා මිසක්, මේක මේ රටේ ජනතාවට ආදරයෙන් ඉදිරිපත් කරන එකක් නොවෙයි. සංකල්පයක් විධියට, මේ රටේ ජනතාවට තොරතුරු ලබා ගැනීමට තිබෙන අයිතිය අපි පිළිගන්න නිසා මේ පනත් කෙටුම්පතට පක්ෂ වෙනවා මිසක, අද දවසේ මේ පනත සම්මත වීම ඉතාම භයානක කුමන්ත්‍රණකාරී සහ ජනතාවට අහිතකරවාදී විධියට බලපාන්න පුළුවන්ය කියන කාරණය මතක් කරමින් මේ පනතට, තොරුතුරු දැන ගැනීමේ අයිතියට සංකල්පයක් විධියට නැවත නැවතත් අපි පක්ෂයි කියන කාරණය මතක් කරන ගමන් ඔබතුමාට කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොමියුනිස්ට් පක්ෂය ද මේ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

සමාජවාදය පිළිගන්නවාද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සමාජවාදය පිළිගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, ඔබතුමා මට මේ තොරතුරු දැන ගැනීමේ පනත සම්බන්ධව කථිකාවතේදී අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, අතිගරු ජනාධිපතිතුමාට. හේතුව, අපි එදා 2015 ජනවාරි 08 වැනිදා කරපු විප්ලවයේදී එතුමා මේ රටට හඬ නගලා කිව්වා, මම තොරතුරු දැන ගැනීමේ අයිතිය මේ රටේ ව්‍යවස්ථාගත කරලා, මේ රටේ ජීවත් වන සියලු දෙනාටම ඒ අයිතිය ලබා දෙනවාය කියලා. අපි ආඩම්බර වෙන්න ඕනෑ. ජනාධිපතිවරයෙක් වශයෙන් එතුමා මේ රටට හොඳ ආදර්ශයක් දීලා, ඒ කියපු දේ ඉටු කරන්න උත්සාහයක් ගන්නවා. මේ තොරතුරු දැන ගැනීමේ පනත සම්බන්ධව කථා කරද්දී, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මේ පනත් කෙටුම්පත පිළිබඳව දැකපු ආකාරය, වෙනස් ආකාරයක් වෙන්න පුළුවන්. තවත් මන්ත්‍රීවරු දකින ආකාරය විවිධ වෙන්න පුළුවන්. මේ පනත කියෙව්වාම, මේක ඇත්තටම නීතිඥවරයෙකුටත් කියවලා තේරුම් ගන්න සැහෙන වෙලාවක්, කාලයක් යන්න පුළුවන්

[ගරු හරින්ද්‍ර ද කොස්තා]

කියලා ගරු සභාපතිතුමනි, මම විශ්වාස කරනවා. ඊට හේතුව, මේක සම්පූර්ණ ලෙස උඩු යටිකුරු කරලා, කරකවලා තිබෙන්නේ. පනත් කෙටුම්පතේ වචන බැලුවාම, මේ එක වචනයකින් සෑහෙන දෙයක් වෙනසක් කරන්න පුළුවන් මතවාදයක් මේ පනත් කෙටුම්පතේ තිබෙනවා. එහෙම නම් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කථා කරපු දේවල් ගැන අපි කලබල වෙන්න ඕනෑ නැහැ. එක එක්කෙනා එක එක විධියට දකින්න පුළුවන්. ඒක වෙනම දෙයක්.

ගරු සභාපතිතුමනි, අපි ඊයේ වැඩ සටහනට සම්බන්ධ වුණා. මන්ත්‍රීවරු බොහොම අතලොස්සයි මේකට සහභාගී වුණේ. යම්කිසි විධියකින් මම මේ තොරතුරු පනත් කෙටුම්පත සම්බන්ධව සොයලා බලලා දැන ගත්තා නම් යම් තොරතුරක්, දැනුමක්, මම ඊයේ ඊට වඩා දහ ගුණයකින් එය දැන ගත්තා, අපේ පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මැතිතුමාගේ දැනුවත් කිරීමෙන්. එතකොට තවත් පැහැදිලි වුණා. මෙහෙමයි. මේ පනත් මේ රටට එකපාරට හඳුන්වලා දීලා මේකේ ප්‍රතිඵලය ගන්න අමාරු වෙයි තව අවුරුදු දහයක්වත් යන කල්. අතිගරු ජනාධිපතිතුමාට මේකේ ප්‍රතිඵලය මේ රටේ ජනතාවත් එක්ක භුක්ති විඳින්න බැරි වෙයි. එතුමාට නොවෙයි. ඊළඟ ජනාධිපතිවරයාට හරි මේ රටේ ජනතාවට හරි අනාගතයේ මේකේ ප්‍රතිඵලය හොඳට භුක්ති විඳින කොට තමයි අපට ආඩම්බර වෙන්න පුළුවන් වෙන්නේ. සමහර විට එතකොට අපි ජීවතුන් අතර නැති වෙන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, මම සොයලා බැලුවාම ලෝකයේ බහුතර රටවල්වල දැනට අවුරුදු බොහෝ ගණනකට ඉහතදී මේ තොරතුරු දැන ගැනීමේ සම්බන්ධව අයිතිය ඇති කරලා, ඒ රටේ නිදහස ඇති කරලා තිබෙනවා. එහෙම නම් අපි පරක්කු වෙලා හරි මේ වාගේ දෙයක් කරන්න යන කොට අපි සන්තෝෂ වෙන්න ඕනෑ. මේ එක එක්කෙනාට පිටරටට කේලම් සපයන්න කියලා. එක එක්කෙනා එක එක විධියට ගත්ත අර්ථකථන ගැන මම කියනවා නම් ගරු සභාපතිතුමනි, මේකේ අඩුපාඩුකම් තිබෙන්න පුළුවන්. අලුත් දෙයක් කරන කොට, රටට අලුත් දෙයක් හඳුන්වලා දෙන කොට ඒකේ ඇති වන අඩුපාඩුකම් අපට එකපාරම නිවැරදි කර ගන්න බැහැ. මේක අපට අලුත් දෙයක්. (බාධා කිරීමක්) මම පෞද්ගලිකවම දරන මතය තමයි මම මේ සභාවේත්, රටටත්, ජාතියටත් හැම තැනම කථා කරන්නේ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කෙළින්ම එතුමා දරන මතය කිව්වා. මගේ දරන මතය මම කියනවා. කවදාහරි මේ රටේ අපේ දරුවෝ මීන් ප්‍රයෝජනයට ගනියි. අද විද්‍යුත් මාධ්‍යයට අපි යන්න ඕනෑ මේ සම්බන්ධව මේකත් එක්ක යන කොට. මේ රටේ ඕනෑම කෙනෙකුට අද ප්‍රශ්නයක් ඇති වුණාම උසාවි ගිහින්, ඒකට අදාළව තොරතුරු උසාවියෙන් ගන්න පුළුවන්. නමුත් මේ පනත ස්ථාපිත නොකර තිබුණත් ගරු සභාපතිතුමනි, කෙනෙකුට යම්කිසි තොරතුරක් ගන්න ඕනෑ නම් මේ රටේ අද වක්‍රව ගිහින්, ඒ ආයතනය ඇතුළට ගිහින්, ඒ තොරතුර ගැනීමේ එපමණ අමාරුකමක් නැහැ. මේ රටේ මිනිස්සු ඒ තොරතුරු සොයා ගැනීමට එපමණට දක්ෂයි. එහෙම නම් ඒක අද නීතිගත කරලා, ස්ථාපිත කරලා, මිනිස්සුන්ට ක්‍රමයකට යන්න පුළුවන්කම ඇති වෙනවා.

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මතක් කළා, 20 (ආ) වගන්තිය පිළිබඳව. මමත් කථා කරන්න හිටියේ. මේකේ පොඩි ගැටළු සහගත තැන් තිබෙනවා. අපි ඒවා හදා ගන්න ඕනෑ. මුදල් අය කරන ක්‍රමවේදයක් නැහැ. තවම තීරණයක් කරලා නැහැ. ඒ වාගේ අඩුපාඩුකම් ගැන මම සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගෙනුත් ගිහින් ඇහුවේ, අපි කොහොමද මෙතැනට යන්නේ? මේවා ඉදිරියේදී සකස් වෙන්න ඕනෑය කියන එක තමයි අපි සියලු දෙනාගේම අදහස වුණේ. අනික් එක තමයි, අපට ඊයේ ගරු ජයම්පති වික්‍රමරත්න මැතිතුමා මෙහිදී අදහස් දැක්වුවා. මාස හයක කාලයක් තමයි ක්‍රියාත්මක වෙන්න පෙර අපට දීලා තිබෙන්නේ කියලා. පනත් කෙටුම්පත සම්මත වුණාම, මේක මාස හයක් නොවෙයි. මම අදහස් කරනවා. යෝජනාවක් වශයෙන් මේ පනත සම්මත කරනවා. අවුරුද්දක්වත් කාලයක් මේකට දෙන්නය කියලා ඉල්ලනවා. මේ රටේ ජනතාවට නිලධාරීන්ට මේ පනත හා සම්බන්ධ වෙලා වැඩ කරන්න. එහෙම නම් ගරු සභාපතිතුමනි, මේ පනතේ අඩුපාඩුකම් ඇති වෙන්න පුළුවන්. සමහර විට ඒවා අපට හදාගෙන ඉදිරියට යන්න පුළුවන්. මේ රටේ ජනතාවට අවශ්‍ය දෙයක්, මේ රටේ අනාගත පරපුරට අවශ්‍ය දෙයක්. මේ පනත සම්මත කිරීම ගැන මගේ කිසිම විරෝධතාවයක් නැහැ. අපි එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් නිර්භයව මම මේකට සහයෝගය ලබා දෙනවාය කියමින් මට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon .O. W. Prasannasanjeeva

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත සභාවට ඉදිරිපත් කරලා, එය අනුමත කර ගෙන එයට අවශ්‍ය කටයුතු නිර්මාණය කරන්න ඊයේ දවසේ ගරු මන්ත්‍රීතුමන්ලා අපි හැමෝම එකතු වෙලා ඒ ගැන සාකච්ඡා කරලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොටසක්.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon .O. W.Prasannasanjeeva

ඔව්. කොටසක්. ඔබතුමාත් ආවා. ඒ පිළිබඳව අපි යම්කිසි දැනුවත්භාවයක් ඇති කර ගත්තා. එතැනට ආපු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මැතිතුමා අපව දැනුවත් කළා. මම හිතන්නේ අපිත් නොදන්න දේවල් පිළිබඳව අපට දැන ගන්නට ලැබුණා. අපි දන්නවා. යම්කිසි තොරතුරක් ලබා ගැනීමට මේ ඉන්න ජනතාවට අවශ්‍යතාවයක් වුණොත්, එය ආයතනයකින් ගන්න ගියොත් අද කොපමණ අපහසුතාවයකට පත් වෙනවාද කියන එක මම හිතන්නේ අපි හැම දෙනාම දන්නවා. උදාහරණයක් ගත්තොත්, කිසියම් කෙනෙක්, ලියන්න කියන්න බැරි කෙනෙක් කාර්යාලයකට ගිහිල්ලා යම්කිසි දෙයක් කර ගන්න ගියොත් රජයේ නිලධාරීන් වශයෙන් සමහර නිලධාරීන් ඉන්නවා, ඉතාමත් හදවතින්ම උණු වෙන, කැප වන, තමන්ගේ කාර්ය භාරය හරියට ඉටු කරන, ඒ කටයුත්ත හරියාකාරව සේවාවක් ලබා දෙන්න බැඳී ඉන්න නිලධාරීන්. හැබැයි, සමහරු ඉන්නවා. ඒ ආපු ආදරණීය අම්මා, තාත්තා, සහෝදරයා හෝ සහෝදරිය, නැත්නම් යමක් පිළිබඳව දන්නේ නැති කෙනෙක් ආවාම ඒ මනුස්සයාව එළවා හරිනු ලබන අවස්ථා අපි දැකලා තිබෙනවා. හැබැයි, සමහරු ඒ පිළිබඳව ඉතාමත් හොඳින්, ඔවුන්ව වාඩි කරවලා, සුහදව කථා කරලා, ඒ පිළිබඳව ඔවුන්ට දැනුවත්භාවයක් ඇති කරලා ඒ අවශ්‍ය කරන තොරතුරු ටික ලබා දෙනවා. හැබැයි, මේ පනත් කෙටුම්පත පිළිබඳව අපට දැන ගන්න ලැබුණේ ඊයේ දවසේ. මෙතැන නීතිඥවරුන් වන අපේ මන්ත්‍රීවරු ඉන්නවා. විද්වත් තර්ක විතර්කවලට ගිහිල්ලා, ඒ වචනවල, ඒ වාක්‍යවල අඩුපාඩු පිළිබඳව ඒ සාකච්ඡාවේදී අපේ මේ ගරු මන්ත්‍රීතුමන්ලා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාට කරන්න ඉදිරිපත් කරමින් පැහැදිලි කළා. ඒ වචනවල යෙදෙනවා, එක්කෝ සහ/හෝ කියන වචන යෙදීමෙන් මම හිතන්නේ, ඒකේ වඩාත් විනිවිදභාවයක් පේන්න මම හිතන්නේ අද කටයුතු කරන්න අපේ ඉන්න මන්ත්‍රීවරු සැදී පැහැදුනා. මම හිතනවා, සෑහෙන කාලයක් යයි මේක දීර්ඝව ක්‍රියාත්මක කරන්න. අවුරුදු පහකට, දහයකට අධික කාලයක් යයි කියලා තමයි මම හිතන්නේ.

හැබැයි, මේවා ක්‍රියාත්මක කරන කොට ඒ අදාළ රජයේ කාර්යාලවල නිලධාරීන්ව පත් කරන කොට ඒ නිලධාරීන්ටත් වගකීමක් ඇතුළත් කරලා මේ පනත ක්‍රියාත්මක කළා නම් තවත් හොඳයි කියලා තමයි කියන්නේ. මොකද, සමහර නිලධාරීන් මේකේ තොරතුරු ලබා නොදුන්නොත් කොමිසමට යන්න පුළුවන් කියලා කිව්වා. කොමිසමෙන් ඒක ලබා නොදුන්නොත් ඒක උසාවිය දක්වා යන්න පුළුවන් කියලා කිව්වා. නමුත් ඊට වඩා වැඩි සාර්ථකත්වයක් දැනෙනවා. මම හිතන්නේ, අදාළ ඒ තොරතුරු දෙන්න හෝ නොදෙන්න අවස්ථා තිබෙනවා. දෙන්නත් පුළුවන්, නොදෙන්නත් පුළුවන් දේවල් තිබෙනවා. හැබැයි, මම හිතනවා ඒ අදාළ නිලධාරීන්ට යම්කිසි බරපතළ වගකීමක් වාගේ දෙයක් ඒකට ඇතුළත් කරලා තිබුණා නම් අදාළ නිලධාරියා මම හිතන්නේ ඒ කටයුත්ත හරියාකාරව ක්‍රියාත්මක කරනවා. උදාහරණයක් වශයෙන් මම හිතන්නේ, අපට මේක ක්‍රියාත්මක කරන්න යන කොට රජයේ තිබෙන හැම ආයතනයකටම වෙනම මෙවැනි වූ තොරතුරු තාක්ෂණය පිළිබඳව සෑහෙන නිලධාරීන් පිරිසක් මේකට ඇතුළත් කරන්න වෙයි. එහෙම නැති වුණොත් මම හිතන්නේ, අද අපේ ගරු මන්ත්‍රීතුමා කථා කළා වාගේ, අවසානයේ අපට දැන ගන්නට ලැබෙයි මේක පුස්සක් බවට යනවා කියලා. මම හිතන්නේ, තොරතුරු තාක්ෂණය පිළිබඳව අද එන්න එන්න දියුණු වෙනවා. එක බොත්තමක් තද කළ පමණින් අඟහරු ලෝකයට පවා යන්න පුළුවන් යුගයක අපි ජීවත් වෙන්නේ. හැබැයි, සත්‍ය තොරතුරු ලබා ගැනීමේදී ඒ තොරතුරුවලින් අපට සමහර අවස්ථාවලදී පාඩු වෙන්නත් පුළුවන්. වාසි වෙන්නත් පුළුවන්. ඒ නිසා අද මේ තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පත බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කරලා, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයට යටත්ව ඒ අවශ්‍ය කරන කරුණු කාරණාත් එක්ක මම හිතන්නේ බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරු වශයෙන් අපි ඉතාමත් සතුටු වෙනවා. ඉදිරි කාලය තුළ

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

මේ කටයුත්ත සාර්ථක කර ගන්න, අපි සැමගේ පමණක් නොවෙයි. සමස්ත රටේම හැම කෙනාගේම සහයෝගය මේකට ලැබෙයි කියන ආශිර්වාදය තුළින් මම හිතන්නේ, මට ලබා දීලා තිබෙන කාලය පිළිබඳවත් ස්තුතිවන්ත වෙනවා. අපි සුභ පතනවා, මේ කටයුත්ත සාර්ථක කර ගෙන ඉදිරියට යන්න ලැබේවායි කියලා. බොහොම ස්තුතියි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පත 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් සභාවන් වෙත යොමු කරලාඒ පළාත් සභාවන්වල එකඟතාවය මත පමණක් අනුමත කර ගැනීමේ හැකියාව මධ්‍යම රජයට තිබෙන නිසා මේ පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කිරීමට අද දිනය වෙන් කිරීම සහ ඒ සඳහා අපට අවස්ථාව ලැබීම පිළිබඳව අපි සතුටු වෙන්න ඕනෑ. මම හිතන්නේ පළාත් සභා ක්‍රමය බිහි වෙලා, අවුරුදු 27 කට පස්සේ මේ වාගේ පළාත් සභාවේ තොරතුරු දැන ගැනීම පළාත් සභාවේ විෂයයට අදාළ කාරණා පිළිබඳව එකක් හෝ දෙකක්, තුනක්, අතේ ඇඟිලි ගණනට වඩා අඩු ප්‍රමාණයක් ගැන තමයි මේ ආකාරයේ පනත් කෙටුම්පත් සාදලා පළාත් සභාවට යොමු වෙලා තිබෙන්නේ. ඒ අතරින් මේ තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පත ආරම්භ කරමින්, ඒ පනත් කෙටුම්පතේ පැහැදිලිව සඳහන් කරන කාරණයක් පිළිබඳව සභාවේ අවධානය යොමු කරන්න කැමතියි. මෙහි පූර්විකාවේ සඳහන් වෙනවා,

“*තොරතුරුවලට ප්‍රවේශවීමට ඇති අයිතිවාසිකම සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා සහ තොරතුරු වෙත ප්‍රවේශවීම ප්‍රතික්ෂේප කළ හැකි හේතු නිශ්චිතව දැක්වීම සඳහාද තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳත් කොමිෂන් සභාව පිහිටුවීම සඳහා*” කියලා. එතකොට පූර්විකාවේ පැහැදිලිව කාරණා දෙකක් සඳහන් වෙනවා. පළමුවැනි කාරණය, තොරතුරු දැනගැනීම සඳහා තියෙන අයිතිවාසිකම පිළිබඳවත්, ඒ වාගේම තොරතුරු ලබා නොදෙන්නේ නම් ඒ ලබා නොදෙන තොරතුරු ලබා නොදීමට තරම් හේතුවන කාරණා මොනවාද කියන එක පිළිබඳව ජනතාව දැනුවත් කිරීම කියන කාරණා දෙකම අදාළයි. ඒ නිසා මෙය අංගසම්පූර්ණ ලෙසම පුද්ගලයෙකුට, මහජනතාවට, පුරවැසියාට, මාධ්‍යයට කාරණා දෙකක් සම්පූර්ණ වෙනවා. එකක් තමයි, තොරතුරු දැන ගැනීමේ අයිතිය තොරතුරක් ලබා ගැනීමෙන් සම්පූර්ණ වෙනවා. අනික, තොරතුරක් ලබා නොදෙන්නේ නම් ඒ ලබා නොදෙන්න ප්‍රතික්ෂේප කළ හැකි හේතු නිශ්චිතව දැක්වීම සිදුවීම යම් ආයතනයක්,රාජ්‍ය ආයතනයක්, අධිකාරියක්, සංස්ථාවක් විසින්, ඒ ආයතනයේ සංස්ථාවට අදාළ කාරණයක් පිළිබඳව තොරතුර දෙන්න ප්‍රතික්ෂේප කරන්නේ මෙන්න මේ හේතූන් මත කියලා එහි පැහැදිලිව නිශ්චිතව සඳහන් කරන්න බැඳීමක් අදාළ ආයතනයට බැඳීමක් ඇති වෙනවා, නිල වශයෙන් මේ පනතත් එක්ක. මේ පනත සම්මත වුණු දවසත් එක්ක.

මේ කාරණය අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා යම් ආකාරයකට විග්‍රහ කරන්න යෙදුණා. මම එතුමාගේ කථාවේ අතරමඟ ආවේ. අන්තිම කොටසේ එතුමා කියනවා මට ඇහුණා, මේක මේ විදේශ රාජ්‍යයන් - ජනවාරි 08 වැනිදා ද, අගෝස්තු 17 වැනිදාද දවසක් කියලා. එතුමාකිව්වා, මේක ඒ අය සතුටු කරන්න ගත්ත දෙයක් කියලා. මගේ හිතවත් ගරු මන්ත්‍රීතුමනි, මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (අ) පුද්ගලයෙකුගේ කථා කිරීමේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තොරුතුරු දැනගැනීමේ අයිතිය දක්වා විහිදෙන බව පළමුවැනි වතාවට ප්‍රකාශ කළේ, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය. ඒ 2004 නඩුවක් අවස්ථාවේදී, ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විස්තර කරන්න යෙදුණා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (අ) කියන ව්‍යවස්ථාවෙන් සඳහන් වන පුද්ගලයෙකුගේ මූලික අයිතිවාසිකමක් වන කථා කිරීමේ නිදහස, පුද්ගලයෙකුගේ අයිතිවාසිකමක් වන අදහස ප්‍රකාශ කිරීමේ නිදහස කියන මේ වාක්‍යය ඛණ්ඩය ඇතුළේ පැහැදිලිව සඳහන් වෙනවා කියලා. ඒ අන්තර්ගතය තුළ කෙනෙකුට තොරතුරු දැන ගැනීමේ අයිතියත් තිබෙනවයි කියලා දැන ගත්තා කියලා, 2004 දී පළමුවැනි වතාවට කිව්වා.

2004 දී ලංකාවේ අධිකරණය ඒක කියන්න කලින් 1980 දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අපි, ශ්‍රී ලංකාව අත්සන් කරනවා, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට. එය 1980 තරම් ඈත ඉතිහාසයට යනවා. එදා සිට අද වනතුරු හිටපු හැම රජයක්ම වග කියන්න ඕනෑ. 1980 දී සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට අපි අත්සන් කරලා

කියන්නේ මොකක්ද? අපි එදා කියනවා, මේ කාරණා සම්බන්ධයෙන්, තොරතුරු දැන ගැනීම සම්බන්ධයෙන් ඒ මහජනතාවට ඇති අයිතියට ප්‍රවේශවීම සඳහා තිබෙන නීතිය සංශෝධනය කරන්න අපි බැඳෙනවා. ඒ වාගේම තිබෙන නීතියට අමතරව අලුතෙන් නීති සම්පාදනය කරන්නට අපි එකඟත්වය පළ කරනවා. හැබැයි, 1980 සිට මේ කාරණය කළේ නැහැ. 2001 දී අධිකරණ අමාත්‍යාංශය විසින්, නීති කෙටුම්පත් අමාත්‍යාංශය විසින්, නීති ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින්, ව්‍යවස්ථා කෙටුම්පතක් හදනවා. ඒක හදලා 2001 දී අධිකරණ අමාත්‍යාංශයට ලබා දෙනවා. ව්‍යවස්ථා සම්පාදන ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් 2001 දී හදපු තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පත අධිකරණ අමාත්‍යාංශයට භාර දුන්නාට පස්සේ, අධිකරණ අමාත්‍යාංශය ඒක ප්‍රවෘත්ති අමාත්‍යාංශයට දෙනවා. 2001 සිට මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ඒ ගමන අවසන් කරන 2014 ජනවාරි 08 වැනිදා වනතුරු ඒක තිබෙන්නේ, ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ හමස් පෙට්ටියේ. 2001 සිට මේ රට පාලනය කරපු හැම රජයක්ම වග කියන්න ඕනෑ. නීති ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් අධිකරණ අමාත්‍යාංශයට යොමු කරලා, අධිකරණ අමාත්‍යාංශය ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට යොමු කරපු මේ ව්‍යවස්ථා කෙටුම්පත ඉදිරිපත් නොකර සම්මත කර ගන්නට වගකීමෙන් කටයුතු නොකිරීම සම්බන්ධයෙන් හැම රජයක්ම වග කියන්න ඕනෑ. ඒ නිසා මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කියන විධියට අහසින් පාත් වුණු, විදේශ රාජ්‍ය සන්තෝෂ කරන්න, සතුටු කරන්න කරන වැඩක් නොවෙයි.

1980 දී අත්සන් කරලා 2001 දී නීති කෙටුම්පත් සකස් කරලා, 2004 දී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තොරතුරු දැන ගැනීමේ අයිතිය කියන කාරණය මිනිස්සුන්ගේ මූලික අයිතිවාසිකමක් විධියට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(අ) වගන්තියෙන් පිළි අරගෙන තිබෙන මූලික අයිතිවාසිකමක් විධියට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය පවා පිළිගත්ත කාරණයක් කියන එක තමයි ගරු මන්ත්‍රීතුමා අපි පිළිගන්න ඕනෑ. ඒ නිසා මේක ඇතුළේ දේශපාලනය නැහැ. මේක ඇතුළේ තිබෙන එකම දේශපාලනය තමයි දේශපාලඥයා විසින් තමන්ගේ ටෙන්ඩර් මගඩි, තමන්ගේ ව්‍යාපෘතිවල තිබෙන වැරැදි, තමන්ගේ ව්‍යාපෘතිවල තිබෙන හොර මැර දූෂණකම්, පවුලට, ඥාතීන්ට, අඹ යහළුවන්ට, ඥාති සංග්‍රහයට අවස්ථාව ලබා දීම මග අහුරාලීම. ටෙන්ඩරය ඇතුළේ ටෙන්ඩර් පටිපාටියෙන් පිට ගිහිල්ලා, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් එළියට ගිහිල්ලා මෙවන් ඥාතීන්ට දීම පිළිබඳව තිබෙන ඒ වැට බැඳීම මේ කෙටුම්පත පනතක් වුණු දවසේ සිට නවතිනවා. මාධ්‍යයට නිදහසක් තිබෙනවා. පුද්ගලයාට අයිතියක් තිබෙනවා. යම්කිසි ආයතනයක ටෙන්ඩර් කැඳවීමක් කරනවා නම්,ඒ ටෙන්ඩර් කැඳවීම කරන සම්පූර්ණ පිළිවෙත පිළිබඳව අදාළ අධිකාරියෙන්, ආයතනයෙන්, සංස්ථාවෙන්, රාජ්‍ය ආයතනයෙන් අසා විමසා දැන ගන්නට මේ පනත හරහා අයිතියක් ඇති වෙනවා.

ඒ වාගේම යම් මාධ්‍ය ආයතනයකට පුළුවන්කම තිබෙනවා, ටෙන්ඩරයක් සම්බන්ධයෙන්, ව්‍යාපෘතියක් සම්බන්ධයෙන්, ව්‍යාපෘති වාර්තාව සම්බන්ධයෙන්, ව්‍යාපෘතියට යොදවන සෑම මහජන රුපියලක් සම්බන්ධයෙන්ම පසුපස ඉඳලා නිල වශයෙන් තොරතුරු ලබා ගැනීමට. ඒ අයිතිය මෙයින් සියලු දෙනාටම ලැබෙනවා. අද වෙලා තිබෙන්නේ මොකක්ද? අද මාධ්‍ය ආයතන මේවා සොයන්නේ හොරා පොලිස් සෙල්ලම දාලා. ඉහේ කැමරා බැඳගෙන විවිධ ආකාරයට රාජ්‍ය ආයතනවලට, විවිධ තැන්වලට ගිහිල්ලා අද මාධ්‍ය ආයතන විශාල වෙහෙසක් දරනවා, තමන්ගේ රාජකාරියෙන් ඔබ්බට ගිහිල්ලා මේ රටේ තිබෙන අයහපත් දේ යහපත් දේ බවට පත් කරන්නට. හොඳ රටක් බවට මේ රට පත් කරන්නට මාධ්‍ය විශාල වෙහෙසක් ගන්නවා. සමහර අවස්ථාවලදී ජීවිතය පරදුවට තියලා සමහර මාධ්‍ය ආයතන මේ තොරතුරු පස හඹා යනවා. ඒ හඹා යාමේදී ඔවුන්ට නිල තත්ත්වයක් නැහැ. ඔවුන්ට නීත්‍යානුකූල වගකීමක් නැහැ. ඔවුන්ට නීත්‍යානුකූල ආරක්ෂාවක් නැහැ. හැබැයි, මේ පනත සම්මත වුණු මොහොතේ සිට මාධ්‍ය ආයතනයේ සිට සෑම පුද්ගලයෙකුටම නිල තත්ත්වයක් ලැබෙනවා. නෛතික තත්ත්වයක් ලැබෙනවා. තොරතුරු දැන ගැනීම සඳහා වන අයිතිය සම්බන්ධයෙන්. ඒ නිසා මේකට විරුද්ධ වෙන්න පුළුවන් නම්, ඒ විරුද්ධ වීමේ හැකියාව පවතින්නේ එක පුද්ගලයෙකුට පමණයි. ඒ මහජන නියෝජිතයෙකුගේ, රාජ්‍ය නිලධාරියෙකුගේ සහමුලින්ම මනසේ හිතේ තිබෙනවා නම් වංචාව, හොරකම, දූෂණය තව දුරටත් මේ රටේ පැල්පදියම් විය යුතුයි කියන අදහස, අන්න ඒ තැනැත්තාට විතරයි මේකට විරුද්ධ වෙන්න පුළුවන්කම තිබෙන්නේ. නැත්නම් හාල් මැස්සාට, ඉටි පන්දමට, සීනි ටිකට, තේ කොළ ටිකට, හාල් කිලෝ එකට ඔබතුමායි මමයි ගෙවන, මගේ ආදරණීය ජනතාව ගෙවන හැම රුපියලකටම රටේ ආණ්ඩුව කරන, රජය වියදම් කරන විධිය

[ගරු කේ.ඩී. අරුණ දීපාල්]

පිළිබඳව දැන ගැනීමේ පනත බවට මේ පනත පත් වෙන එක අපි සතුටු වෙන්න ඕනෑ. සන්තෝෂ වෙන්න ඕනෑ. ඊළඟ පරම්පරාව දැන ගන්නවා, අපෙන් පස්සේ පරම්පරාව දැන ගන්නවා, මේ රටේ මුදල් වියදම් වෙන්නේ මොන ක්‍රමවේදයක් ඇතුළේද? මොන විධියටද? කියලා. ඒක දැන ගැනීමේ අයිතිවාසිකම, මහජන අයිතිවාසිකම පනතෙන් අපට ලැබිලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම සරල උදාහරණයක් කියන්නම්. ඉන්දියාවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එහෙමයි. මේ ආසන්න රටේ ඉන්දියාවේ වුණු දෙයක් උදාහරණයක් ලෙස දක්වනවා. එක්තරා රටකජු වෙළෙන්දෙක් පාර අයිනේ ඉඳලා දකිනවා, එක්තරා රජයක නිල වාහනයක්, ඒ නිල වාහනයේ තැනැත්තා, රාජ්‍ය නිලධාරියා ඒ රට කජු වෙළෙන්දා රට කජු වෙළඳාම් කරන මහ පාර ඉස්සරහින් උදේට යනවා. දවල්ට යනවා. හවසට යනවා. රාත්‍රියට යනවා. හතර වතාවක් එහෙට මෙහෙට යනවා. රට කජු වෙළෙන්දාට ඕනෑකමක් ඇති වෙනවා, මේ තැනැත්තා නිල තත්ත්වයෙන්ද මේ කටයුතු කරන්නේ නැද්ද කියන එක බලන්න. රට කජු වෙළෙන්දාට අවස්ථාව ලැබෙනවා. අධිකරණයට ගිහිල්ලා ඒ කාරණය පිළිබඳ තොරතුරු දැන ගැනීමේ අයිතිය මත ඒ තොරතුර ලබා ගන්නට. ඒ අනුව අර රාජ්‍ය නිලධාරියාගේ ගමන් සියල්ල අනීතික විධියට, අයුතු විධියට රාජ්‍ය බලය උපයෝගී කරගෙන, නිල තත්ත්වය උපයෝගී කරගෙන කරපු දේවල් නිසා අර රට කජු වෙළෙන්දාගේ මැදිහත්වීම නිසා ඒ සියලු මුදල් නැවත වතාවක් රජයට ගෙවන්න ඒ නිලධාරියාට සිදු වෙනවා. අර රාජ්‍යයේ උසස් නිලධාරියාට අයථා වාහන පරිහරණය, ඉන්ධන පරිහරණය, රාජ්‍ය සේවයේ නිලධාරියෙකුගේ වගකීම් පැහැර හැරීම යටතේ සියලු මුදල් නැවත ගෙවන්න සිදු වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කථාව අවසන් කරන්න. ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒ නිසා ඒ රට කජු වෙළෙන්දා වාගේ වෙළෙන්දෝත්, අනික් හැම පුරවැසියටමත් මේ පනතෙන් ලැබෙන ආරක්ෂාව ගැන හිතලා අපි එක හෙලා අත් ඔසවලා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම කියලා කියන්නේ ඔබෙත්, මගෙත් මූලික අයිතිවාසිකම තවත් ශක්තිමත් වෙමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට නව අරුතක්, අර්ථයක් ලබාදෙන පනතක් බව ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මෙම කාරණාව පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් අපි කල්පනා කරනකොට මේ තොරතුරු දැන ගැනීමේ පනත පිළිබඳව අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මේ පිළිබඳ සහතිකයක් අපට දීලා තිබුණත් 1980 දී මීට වඩා පුළුල් ලෙස අපි මෙය පිළිගත්තා. ඒ තමයි සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය අපි පිළිගත්තා, තොරතුරු දැන ගැනීම සහතික කරනවා කියලා. නමුත් අවුරුදු 35 ක් ගිහිල්ලා හෝ මේ කටයුත්ත කෙරෙහි රාජ්‍යයේ අවධානය යොමු වීම ගැන අපි සතුටු වෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මේ තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පත ගෙනෙන්න කලින් සලකා බැලිය යුතු මූලධර්ම පහක් තිබෙනවා. මම කැමතියි මේ සභාවේ ඒ මූල ධර්ම පහ ඉතා කෙටියෙන් කියන්න. ඒ තමයි නීතිය මඟින් උපරිම තොරතුරු අනාවරණය කිරීම සඳහා විධිවිධාන තිබෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, දෙවැනි කාරණය තමයි විශේෂයෙන්ම රාජ්‍ය ආයතනවල තොරතුරු ක්‍රියාශීලී ලෙස ප්‍රසිද්ධ කිරීමට එම ආයතන නීතිය මඟින් බැඳී සිටීම තහවුරු කළ යුතුයි. ඊළඟ කාරණය තොරතුරු සැපයීමේ නීතිය විවෘත ආණ්ඩුවක් යන සංකල්පය ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට නීතිගත විය යුතුයි. හතරවැනි කාරණය, තොරතුරු ලබා ගැනීමේ අයිතියට අඩංගු නොවන තොරතුරු මොනවාදැයි ඉතා නිශ්චිත ලෙස හුවා දැක්වීම හා ඒවායේ සීමාවන් හානි දායක තොරතුරු හා මහජන යහපත සඳහා යන ද්විවාර්ගික පරීක්ෂණ මඟින් තහවුරු කරන්න ඕනෑ. සාධාරණීකරණය කරන්න ඕනෑ. පස්වැනි මූල ධර්මය, මහජනතාවට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම පිණිස

තොරතුරු සතු අදාළ ආයතන මගින් කඩිනමින් හා කාර්යක්ෂම ක්‍රියාපටිපාටියක් ඇති කිරීම හරහා තොරතුරු සැපයීම කරන්න ඕනෑ. එහෙම ප්‍රතික්ෂේප කරනවා නම්,තොරතුරු ලබා දීම සඳහා අධිකරණ බලය සහිත ස්වාධීන කොමිෂමක් හෝ වෙනත් අධිකරණ ක්‍රියාමාර්ගයක් කරා යන්න අවස්ථාව තිබෙනවා.

ගරු සභාපතිතුමනි, දැන් අපට මේ දීලා තිබෙන කෙටුම්පත දිහා බැලුවාම මෙහි ආරම්භයේම යම් ප්‍රශ්නයක් තිබෙනවා. අපි බැලුවොත් එහෙම අපේ කෙටුම්පතේ එක තැනක මෙන්න මෙහෙම තිබෙනවා, Public Authorities. ජනතාවට බලපාන මේ ආයතන, මහජන ආයතන. Public Authorities කියලා තිබෙනවා. අපි බැලුවොත් එහෙම ඉන්දියානු තොරතුරු දැන ගැනීමේ පනත. ඒකේ යම් ප්‍රමාණයක පිටපතක් වාගේ පෙනෙනවා. අපේ එකේ ඉන් යම් ප්‍රමාණයක් අඩංගු වෙනවා. නමුත් ඉන්දියානු තොරතුරු දැන ගැනීමේ පනතේ ඒක සඳහන් වෙන්නේ, Every Public Authorities කියලා ගරු සභාපතිතුමනි. ඒකෙන් තෙරෙන්නේ මොකක්ද? ජනතාවට වග කියන සෑම ආයතනයක්ම. නමුත් සෑම ආයතනයක්ම කියන එක අපේ පනතෙන් ගිලිහී යාමෙන්ම එතැන යම් වංගුවක් ගැහීමට දරන උත්සාහයක් තිබෙනවාද කියලා සැකයක් තිබෙනවා. කෙසේ වෙතත් අපි ඊයේ වැඩ මුළුවේදී දැන ගත්තා, මේ එකක්වත් සාපේක්ෂව මිසක් නිරපේක්ෂව නොවෙයි කියලා. දැන් බලන්න. Public Authorities කියන මෙය සාමාන්‍යකරණය ලක් කිරීමෙන් වෙන්නේ මොකක්ද? යම් ආයතනවලට මේකෙන් රිංගලා යන්න පුළුවන් වෙනවා.

එම නිසා මේක මීට වඩා පුළුල් ලෙස එන්න ඕනෑ. දැන් දකුණු අප්‍රිකාව වාගේ රටවල පෞද්ගලික ආයතනවල පවා - පෞද්ගලික ආයතනවල බැඳීමක් තිබෙනවා යම් ප්‍රමාණයකට තොරතුරු අවශ්‍ය නම්, හෙළි කිරීමට. මොකද ඒක ජනතාවට බලපානවයි කියන, රටේ ආර්ථිකයට, රටේ පැවැත්මට බලපානවයි කියන කාරණය මුල් කර ගෙන.

ඊළඟට මෙහි එක තැනක සඳහන් වෙනවා, ජනමාධ්‍ය අමාත්‍යාංශයට මේ කටයුතු පැවරෙනවා කියලා. ගරු සභාපතිතුමනි, මේක බරපතළ කාරණයක්. ජනමාධ්‍ය අමාත්‍යාංශයට මේක පැවරෙන්නේ කොහොමද? මේක මහජනතාවට වග කියන ආයතනයක්. මේක මහජනතාවගේ



බදු මුදල් පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා මේකේ තොරතුරු පිළිබඳ කටයුතු මෙහෙයවීම ජනමාධ්‍ය අමාත්‍යාංශයට පැවරීම වෙනත් ආකාරයක බලපෑමක් කියලා මේකේ හිතන්න පුළුවන්. එහෙම කියන්නේ ඇයි? අපි දන්නවා, පසුගිය කාලයේම ජනමාධ්‍ය මෙහෙය වූයේ රාජ්‍ය විසින්. ජනාධිපතිවරයා විසින් මාධ්‍ය ආයතන ප්‍රධානීන් අල්ලගෙන අපි දන්නවා, විවිධ උපක්‍රම හරහා මාධ්‍ය පාලනය කළා. ඒ නිසා ජනමාධ්‍ය අමාත්‍යාංශය හරහා මේක පාලනය කිරීමට උත්සාහ දැරීම අනවශ්‍ය අතපෙවීමක් බවට පත් වෙනවා. ඒකෙන් තොරතුරු දැන ගැනීමේ අයිතිය වෙනුවට රොබට් මුගාබේගේ තොරතුරු දැන ගැනීමේ පනත වාගේ එකක් ලංකාවේ ක්‍රියාත්මක කිරීමට ඉඩ ලැබෙනවා. ඒක නිසා ඒක භයානක තත්ත්වයක්. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. මේක පුරවැසියන්ගේ අයිතියක්. මේක ජනමාධ්‍ය අයිතියක් නොවෙයි කියන එක පැහැදිලිවම අපි අවධාරණයට ලක් කරන්න ඕනෑ.

ඒ වාගේම මෙහි 05 වැනි වගන්තියේ සඳහන් වෙනවා, පෞද්ගලික තොරතුරු කියන එක. පෞද්ගලික තොරතුරු කියන එකට දීලා තිබෙන අර්ථ නිරූපණය ඉතාම පුළුල් එකක්. එහෙම පුළුල් අර්ථ නිරූපණයක් දීමෙන් වෙන්නේ මොකක්ද? තොරතුරු ලබා දීමට තිබෙන අවස්ථාවලින්, තොරතුරු ලබා දීමෙන් මඟහැර යන්න, රිංගලා යන්න දරන උත්සාහක් මේකේ පෙනෙන්න තිබෙනවා. ඒක නිසා එසේ නොවිය යුතුයි. විශේෂයෙන් අපි බැලුවොත්, ඉන්දියාවේ තොරතුරු දැන ගැනීමේ පනතේ ඒකේ පැහැදිලිව කියලා තිබෙනවා, විශාල මහජන සම්බන්ධතාවයක් විසින් සාධාරණීකරණය කළොත් ඒ තොරතුරු කවරක් වුණත් ඒක එළියට දෙන්න ඕනෑය කියලා. ඒ සඳහා විශේෂයෙන් නිලධාරීන් තුන් දෙනෙක් ඉන්දීය පනතේ සඳහන් වෙනවා. හැබැයි අපේ කවුද මේකට එහෙම වගකිව යුතු නිලධාරියා? මේ සාධාරණීකරණය කරන්නේ කවුද කියන එක සඳහන් නොවීම අඩුවක් විදියට දකිනවා, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම මෙහි තවත් තැනක මෙන්න මෙහෙම සඳහන් වෙනවා.

*"රහසිගතව ලබා දුන් හෝ රහසිගතව තොරතුරු ලබා ගත් අවස්ථාවක ඒවා හෙළිදරව් කිරීම එම රජය හෝ ජාත්‍යන්තර නීතිය යටතේ වූ අන්තර්ජාතික ගිවිසුම් හෝ බැඳීම් සමඟ ශ්‍රී ලංකා සම්බන්ධතාවලට අගතිගාමී වන හෝ අගතිගාමී විය හැකි අවස්ථා."*

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

දැන් මෙතැනදී සඳහන් වෙන්නේ නැහැ, ජාත්‍යන්තර පෞද්ගලික ආයතන ගැන. පෞද්ගලික සමාගම් සම්බන්ධයෙන් මොකද වෙන්නේ. ඒවා මේකට ඇතුළත් වෙනවාද? නැද්ද? කියන එක මේකේ සඳහන් නොවීම බරපතළ කාරණයක්. එහෙමනම් පැහැදිලිව ඒ ප්‍රතිපාදනය මෙහි සඳහන් කළ යුතුව තිබුණා.

ඊළඟට ජාතික ආරක්ෂාව කියන කාරණය. අපි දන්නවා, මීට කලින් ඉතිහාසයේ වුණු දේවල්. ජාතික ආරක්ෂාව පදනම් කරගෙන බොහෝ තොරතුරු ලබා දීම පැහැර හැරියා. අපි දන්නවා, ලසන්ත වික්‍රමතුංගට ජීවිතෙන් පවා වන්දි ගෙවන්න සිද්ධ වුණේ, එදා ජාතික ආරක්ෂාවට වැදගත් තොරතුරු හෙළි කළා යැයි කියන චෝදනාව මත. ඒ නිසා මේක මේ ජාතික ආරක්ෂාවට මුවා වීමට තිබෙන ඉඩකඩ අඩු කරන්න ඕනෑ. මෙහි පළල අඩු කරලා, එහෙම නැත්නම් මේක පටු කරලා ජාතික ආරක්ෂාව කියන එකෙන් රිංගලා යන්න තිබෙන අවස්ථා පුළුවන් තරම් අඩු කරන්න අවශ්‍ය ප්‍රතිපාදන මේ හරහා ගොඩනැඟෙන්න ඕනෑය කියලා මම හිතනවා, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම තවත් වැදගත් කාරණයක් මතු කරන්න ඕනෑ. පාර්ලිමේන්තු වරප්‍රසාද. එක තැනක තිබෙනවා, පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝණය වෙනවා නම් මේ තොරතුරු වසන් කරන්න ඕනෑය කියලා. ගරු සභාපතිතුමනි, එහෙම වෙන්න බැහැ. වරප්‍රසාදවලට මුවා වෙලා නිලධාරීන් හරහා හෝ වෙනයම් ක්‍රමයකින් හෝ මේ පාර්ලිමේන්තු වරප්‍රසාද හරහා යම් වංචාවක්, දූෂණයක් සිද්ධ වෙනවා නම් ඒක වළක්වන්න ඕනෑ.

මම කැමතියි එක තැනකට අවධානය යොමු කරන්න. මාධ්‍ය නිදහස සහ සමාජ වගකීම් පිළිබඳ කොළඹ ප්‍රකාශනය කියලා එකක් එක්තරා අවස්ථාවකදී එළි දැක් වූවා. එම කොළඹ ප්‍රකාශනයේ එක තැනක මේ වරප්‍රසාද සම්බන්ධයෙන් අපේ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය සඳහන් වෙනවා. එහි මෙන්න මෙහෙම දැක්වෙනවා,

*"පාර්ලිමේන්තු වරප්‍රසාද සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි පැනැවී තිබෙන තහංචිවලින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනට අනවශ්‍ය වරප්‍රසාද පිරිනැමෙන නිසාත් කතා කිරීමේ ප්‍රකාශනයේ හා තොරතුරු ලබා ගැනීමේ නිදහස පිළිබඳ අයිතියට අදාළ නවීන ප්‍රමිතිවල එය පිළිබිඹු නොවන නිසාත් එම තහංචි ඉවත් කළ යුතුය. 1953 පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද පනත එහි මුල් තත්ත්වයට ආපසු හැරවිය යුතු අතර ඊට ආනුෂංගිකව සිදු කැරුණු සංශෝධනද විශේෂයෙන්ම බැහැර කළ යුතුය."*

කියලා. එහෙම නම් වරප්‍රසාදවලට මුවා වෙන්න තිබෙන ඉඩකඩ මේකෙන් අහුරාලන්න ඕනෑ කියලා විශ්වාස කරනවා, ගරු සභාපතිතුමනි. ඒ වාගේම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, තව විනාඩියක් දෙන්න. තොරතුරු දැන ගැනීමේ අයිතිය සුරක්ෂිත වන විධියට වාර්තා සකස් කරන්න ඕනෑය කියලා මේකේ එක තැනක තිබෙනවා. ඔව්. එහෙම සකස් කරන්න ඕනෑ. හැබැයි, මේක සිදු විය යුත්තේ ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවය මත නොවෙයි. තොරතුරු දැන ගැනීම සහතික කරන ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවය මත නොවෙයි. ඊට වඩා ජාතික වැඩ පිළිවෙළක් කරා මේකට යන්න ඕනෑ. මේකට ඇතුළත් කරන්න තිබුණා, තොරතුරු ලබා දීම සඳහා ජාතික වශයෙන් ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ කියලා. ගරු සභාපතිතුමනි, අවධානය යොමු කළ යුතු කාරණා ගණනාවක් තිබෙනවා. නමුත් කාලය පිළිබඳ ප්‍රශ්නය නිසා මම ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි, තොරතුරු දැන ගැනීමේ ප්‍රඥප්තිය පිළිබඳව අපේ අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් අපි ඉතාමත් සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අලුතෙන් සකස් වෙන වේලාවක් නිසා අපි විශ්වාස කරනවා, මේ ඇති වෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී විධියට ගොඩනැගෙයි කියලා. මොකද, අද ඒ සඳහා මහජනතාවටත් තමන්ගේ කරුණු ඉදිරිපත් කරලා, වඩා ප්‍රජාතන්ත්‍රවාදී විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසෙන්න

යෝජනා වෙලා තිබෙන වෙලාවක අපි විශ්වාස කරනවා, හැමදාමත් ප්‍රජාතන්ත්‍රවාදය එකතැන පල් වෙන්න ඉඩ දෙන්නේ නැතිව ඒක ක්‍රමානුකූලව සංවර්ධනය වන රටක් හැටියට ලංකාව පත් වෙමින් තිබෙනවයි කියලා. අපේ රටේ බොහෝ වේලාවට තිබුණේ, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ගැටලුවක් නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදය කොයි ආකාරයට පසුගිය රාජ්‍ය පාලකයින් පාවිච්චි කළාද කියන කාරණාව නිසා තමයි ප්‍රජාතන්ත්‍රවාදය හැකිලෙන තැනකට පසුගිය කාලපරිච්ඡේදය තුළ සිද්ධ වෙන්න හේතු වුණේ. ඒක නිසා අපි විශ්වාස කරනවා, ඉදිරි කාලපරිච්ඡේදයේදී - විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අඩුවීම ප්‍රමාණවත් නැහැයි කියලා අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා සඳහන් කළත් අපි විශ්වාස කරනවා, අලුත් ව්‍යවස්ථාව තුළ විධායක ජනාධිපති ක්‍රමයක් නොවෙයි. පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් වන නිසා මේ ප්‍රජාතන්ත්‍රවාදයට තිබෙන වඩාත් ඉඩකඩ ඇති වේවිය කියලා.

විශේෂයෙන්ම අපේ අසල්වැසි රටක් හැටියට තිබෙන ඉන්දියාවේ තොරතුරු දැන ගැනීමේ අයිතිය අද ඉතාමත්ම ශක්තිමත් තැනකට ඇවිල්ලා තිබෙනවා. ඇත්ත තමයි, යම් පිරිවැයක් ඒ වෙනුවෙන් දරන්න සිද්ධ වෙනවා. පිරිවැයක් දරන්න සිද්ධ වුණත්, ඒ හරහා ලැබෙන කාර්යක්ෂමතාවය හා වංචාව, දූෂණයට තිබෙන ඉඩකඩ අහිමිවීම තුළ අපි විශ්වාස කරනවා, ඒ දරන පිරිවැයට වඩා වඩාත් වැඩි ප්‍රතිලාභයන් මේ රටට තොරතුරු දැන ගැනීමේ අයිතිය තුළින් ලබා ගන්න පුළුවන් කියලා. මේ පනත තුළ අය කරන ගාස්තු පිළිබඳව සඳහන්ව නොතිබුණත් අපි දන්නවා, අපේ රටේ බොහෝ අය කිරීම් කරන ආකාරයන් පිළිබඳව. උප්පැන්න සහතිකයක් ගන්න ගියත්, විවාහ සහතිකයක් ගන්න ගියත්, මරණ සහතිකයක් ගන්න ගියත් යම් මුදලක් අය කරනවා. අපි බලාපොරොත්තු වෙනවා. රජය සහ කොමිෂන් සභාව ඒ හා සමාන සාධාරණ අය කිරීමකට යනවා මිසක්, මේක මුදල් ඉපැයීමේ අරමුණ ඇතිව ආරම්භ කරනවා කියලා කල්පනා කරනවා නම් ඒක වැරැදියි කියන එක තමයි අපි මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සඳහන් කරන්න බලාපොරොත්තු වෙන්නේ.

මේ තොරතුරු ලබා ගැනීමේ අයිතිය ජනමාධ්‍යවේදීන්ට පමණක් නොවෙයි. මුළු රටේම සියලු පුරවැසියන්ට ලැබෙන අවස්ථාවක් නිසා අපි දන්නවා, නිලධාරීන්ගේ පැත්තෙන් මේකට යම් අකැමත්තක් ඇති වේවි. තොරතුරු ලබා දෙන්න රාජ්‍ය නිලධාරීන් වැඩිය කැමති වෙන්නේ නැහැ. මේ තොරතුරු ලබා දීමේ ඉල්ලීමක් ප්‍රතික්ෂේප වෙනවා නම්, ඒ ප්‍රතික්ෂේප කරන අය කරන ක්‍රියාව හරිද වැරැද්ද කියලා යම් තැනක තීන්දු කරලා ඒක වැරැද්දක් ඇති වෙනවා නම් ඒ පිළිබඳව යම් විනය තත්තවයකට, එහෙම නැත්නම් දඩ මුදලක් අය කිරීම වැනි තැනකට ගියොත් එහෙම අපි විශ්වාස කරනවා, මේ තොරතුරු දැන ගැනීමේ අයිතිය වඩාත් ශක්තිමත් වේවි. ඒ තොරතුරු නිසි වේලාවට ලබා දෙන්න කවුරුත් ඉදිරිපත් වෙයි කියන එක අපි විශ්වාස කරනවා. ඒ වාගේම මෙහි සඳහන් කරලා තිබෙනවා, නීතිපතිවරයා ඇතුළු නීතිපති දෙපාර්තමේන්තුවට යම් මුක්තියක් දීලා තිබෙන ආකාරය. අපි හිතනවා, එවැනි මුක්තියක් දීම ඉතාම අත්‍යවශ්‍ය වෙන්නේ නැහැයි කියලා. ඒක සඳහන් කරලා තිබෙනවා, ජාතික ආරක්ෂාව පිළිබඳව හෝ රටේ භෞමික අඛණ්ඩතාවය පිළිබඳ ප්‍රශ්නයකදී ඒ මුක්තිය දීලා තිබෙන නිසා තවත් විශේෂ මුක්තියක් රජයේ නීතිපතිවරයාට ලබා දීමක් අවශ්‍ය වෙන්නේ නැහැයි කියලා අපි මෙහිදී විශේෂයෙන්ම සඳහන් කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම මේ තොරතුරු ලබා ගැනීමේදී දේශීය වශයෙන් නම් යම් ව්‍යාපෘතියකදී රුපියල් ලක්ෂ 05 කට සීමාවක් දක්වන අතරේ විදේශීය නම් ඩොලර් මිලියනයකට, රුපියල් ලක්ෂ 140 ක් වැනි විශාල මුදලකට ඒකේ ඉඩකඩ දීලා තිබෙනවා. ඒ නිසා ඒක දේශීය වශයෙන් ලක්ෂ 05 කටත්, විදේශීය වශයෙන් ඩොලර් මිලියනයකටත් වශයෙන් ලොකු පරස්පරයක් තිබීම සාධාරණය වෙන්නේ නැහැයි කියන කාරණාවත් විශේෂයෙන්ම සඳහන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මේ පියවර, මේ ආරම්භය අපි ආපස්සට හරවන්න නොවෙයි, බලාපොරොත්තු වෙන්න ඕනෑ. මේක ආරම්භයක් විතරයි. මේ ආරම්භය තුළ තවත් ඉදිරියේදී සංශෝධන ඇති වෙන්න පුළුවන්. වෙනස් කිරීම් කරන්න පුළුවන්. ඒ වෙනස්වීම් එක්ක හොඳ ගමන් මගක ආරම්භයක් හැටියට මේ තොරතුරු දැන ගැනීමේ පනතට මේ අවස්ථාවේදී අපි සහයෝගය දක්වන්න, අපේ එකඟතාවය ලබා දෙන්න කටයුතු කරන්නය කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ගරු සභාපතිතුමනි, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත පිළිබඳව සාකච්ඡාවට භාජනය වෙමින් තිබෙන මේ මොහොතේ ඒ වෙනුවෙන් අදහස් කීපයක් ප්‍රකාශ කරන්න අවකාශය ලබා දීම සම්බන්ධව මම ස්තුතිවන්ත වෙනවා. මේ තොරතුරු දැන ගැනීමේ පනත පිළිබඳව පසුගිය සභා වාරයකට ඉදිරිපත් කළාම, අපේ මන්ත්‍රීවරු සියලු දෙනාම මේ පිළිබඳව අවබෝධයක් ලබා ගත යුතුයි. ඒ නිසා මේ පනතේ තිබෙන සමහර අදහස් පිළිබඳව අපට ව්‍යාකූල තත්ත්වයක් ඇති වෙනවා. ඒ නිසා මේ පිළිබඳව දැනුවත්, පුළුල් අත්දැකීමක් ඇති කවුරු හෝ දේශකයෙක් ලවා මේ සම්බන්ධයෙන් අපව දැනුවත් කරන්නය කියලා කිව්වාම, අපේ සභා ලේකම් කාර්යාලය හරහා ඒ දැනුවත් කිරීම ඊයේ යොදා ගෙන තිබුණා. දේශකයා හැටියට සහභාගි වුණේ, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳව විශාරදයෙක් විධියට අපි කල්පනා කරන ජයම්පති වික්‍රමරත්න මැතිතුමා. මම හිතන්නේ, අද දවසේ මේ කථා කරන කාරණා සියල්ල ඊයේ දවසේ එතුමාත් එක්ක අපි සාකච්ඡා කළා. දැන් උදාහරණයක් විධියට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මතක් කරපු කාරණය එතුමා ඊයේ මතු කළා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා අවසානයේ මේ කාරණය කියලා, මේකට විදේශීය කුමන්ත්‍රණයක් තිබෙනවා. විදේශීය අතපෙවීමක් තිබෙනවා. ඒ නිසා මේ රටේ ස්වාධීනත්වයට, භෞමික අඛණ්ඩතාවයට මේකෙන් යම් බලපෑමක් ඇති වෙයි කියලා ප්‍රකාශ කරලා අවසානයේ කිව්වා, නමුත් මේකට මම පක්ෂයි කියලා. මට නිකන් දැනුණේ, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට තරුණ කාලයේ වාගේ නම් යම්කිසි යෝජනාවක් ඇවිල්ලා, කාන්තාවක් බලන්න ගිහිල්ලා වැඩේට මනුස්සයා අකමැති වුණාට කරන්න දෙයක් නැහැ. හැබැයි, කොණ්ඩේ සුදු කෙස් ගහක් තිබෙනාවද කියලා සොයනවා. අනික් ඔක්කොම කළුයි. එක සුදු කෙස් ගහක්වත් කොණ්ඩේ තිබෙනවාද කියලා හොයනවා. මේකට මොකක් හරි කියලා මේ වැඩේ අවසන් කර ගන්න. නමුත් අවසානයේ එතුමා ඉදන් මතක් කළා, නැහැ එහෙම වුණාට ප්‍රශ්නයක් නැහැ. දැන් මම මේකට කැමතියි කියලා.

අපි දන්නවා, එක්සත් ජාතීන්ගේ මණ්ඩලය හරහා අනන්ත අප්‍රමාණ මුදල් මේ රටට කොපමණ ලබා දෙනවාද කියලා. අනික් පැත්තෙන් මේ රටේ සමාජ සේවාවන් කරන පුද්ගලික ආයතන තිබෙනවා. අපි දන්නවා, ඒවා ස්වෙච්ඡා සංවිධාන හැටියට ක්‍රියාත්මක වෙනවා. ඇත්තෙන්ම අපි ඒ ප්‍රශ්නය ඊයෙත් මතු වුණු වේලාවේදී කිව්වේ, මේ රටේ බෙදුම්වාදයට උඩගෙඩි දෙන, මේ රටේ තිබෙන ස්වාධීනත්වයට යම්කිසි ප්‍රශ්නයක් ඇතිවන ආයතනවලින් මේ මුදල් නොගත යුතුයි. අපි ඒවා ගන්නවා නම්, ගත යුත්තේ ඇයි කියන කාරණයේදීත් ඒ කාරණය මතු කළා, මේවා රජයේ හෝ වෙනත් ආයතනවලින් හෝ විදේශීය යම් පිළිගත සංවිධානයකින් මුදල් අරගෙන මේ වැඩ පිළිවෙළ මහා පුළුල් වැඩ පිළිවෙළක් බවට ක්‍රියාත්මක කරන්න තිබෙනවා. ඒ නිසා යම් මුදලක් අවශ්‍ය වුණොත් ඒ සඳහා ඒක පාවිච්චි කරගන්න කියලා.

අනික් පැත්තෙන් අපි දන්නවා, මේ පනත් කෙටුම්පත අනුව අපි ඉල්ලුවොත් ඕනෑම තොරතුරක් නිලධාරියෙකුට දෙන්න පුළුවන්කම තිබෙනවා. ඒකේදී තොරතුරු නොදීමට හේතු මේ පනත තුළ කියලා තිබෙනවා. හැබැයි, ප්‍රශ්නය වන්නේ, ඊයේ ජයම්පති වික්‍රමරත්න මැතිතුමාගෙන් මම ඇහුවා, අපි මේ සමාජය තුළ තවමත් මිනිස්සු එක්ක ජීවත් වෙන්නේ. යම් තොරතුරක් ඉල්ලුවාම අපට ලබා දෙන්නේ සාවද්‍ය තොරතුරක්. ඒක තුළ අපි ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යන කොට අපට අවාසියක් ඇති වෙනවා. අවාසිය ඇති වුණාම, අපි හිතමු නඩු හබයකට ගියාම අර වැරැදි තොරතුරු නිසා යම්කිසි පුද්ගලයෙකුට අවාසියක් ඇති වුණාම අවුරුදු කීපයකට පස්සේ මේ තොරතුරු දීපු නිලධාරියා දැන දැනම, හිතාමතාම මේ තොරතුර දීලා තිබෙන්නේ, අපට අවාසියක් වෙන්නය කියලා තේරුම් ගත්ත දාට මෙකක්ද කරන්නේ කියලා. ඒ අනුව ජයම්පති වික්‍රමරත්න මැතිතුමා කියන්නේ, ඒක යම්කිසි විනය කටයුත්තකට යොමු කරන්න පුළුවන් කියලා. මම කියන්නේ, විනය කටයුත්තකට යොමු කළාට ඇති වැඩක් නැහැ. අර මනුස්සයාට වෙන්නට ඕනෑ අගතිය වෙලා අවසන් වෙලා තිබෙනවා. ඒ නිසා මේ පනතේ සැදිය යුතු සමහර තැන් තිබෙනවා. නමුත් අපි දන්නවා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, මේ රටේ මිනිස්සුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම වෙනුවෙන් මේ පනත ක්‍රියාත්මක විය යුතුයි කියන තැන තමයි අපි ඉන්නේ. හේතුව මෙපමණ කල් ප්‍රජාතන්ත්‍රවාදයේ අයිතිවාසිකම් ආරක්ෂා කරගෙන, රැකගෙන අපි තමයි වැඩ කටයුතු කරන්නේ කියලා පාලකයෝ හිතන්නේ. මෙවැනි පනත් පල්ලෙහා මට්ටමෙන් එන කොට පාලකයන්ට වැඩිය

පාලිතයෝ ඉහළට යනවා. පාලිතයන්ට පුළුවන්කම තිබෙනවා, ඕනෑම පාලකයෙකුගේ තොරතුරක් දැනගන්න. ඔහුගේ පුද්ගලික චර්යාවන් විවේචනය කිරීම හැර අනික් ඕනෑම දෙයක් අපට දැනගෙන ඒ පිළිබඳව සාකච්ඡා කරන්න පුළුවන්කම ඇති වෙනවා.

අද මේ පළාත් පාලන ආයතන පිළිබඳව අපි කථා කරනවා. මේවා දූෂිතයි කියලා කියනවා. මම අහගෙන සිටියා, මේ පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරයෙක්ම කිව්වා, සමහර තැන්වල තාර දාන්නේ හරියට ආස්මීවලට පැණි දානවා වාගේ කියලා. නමුත් පළාත් පාලන ආයතනයක යම් පාරකට තාර දාන්න තිබෙන ඇස්තමේන්තුවක් අද අපට ඉල්ල ගන්න බැහැ. ඒ පාරේ කවුරු හරි මනුස්සයෙක් ගිහිල්ලා පළාත් පාලන ආයතන ප්‍රධානියාගෙන්, සභාපතිවරයාගෙන්, ලේකම්වරයාගෙන්, ඉල්ලුවොත් ඒ ඇස්තමේන්තුව ලබා දෙන්නේ නැහැ. ඒ ඇස්තමේන්තුව ලබා ගන්න බැරි ඇයි? පළාත් පාලන ආයතනයට බදු ගෙවන්නේ මහජනතාව. තමන්ගේ පාරට තාර බැරල් කොපමණ එනවාද? තමන්ගේ පාරට ගල් ලෝඩ් කොපමණ එනවාද? තමන්ගේ පාර කොපමණ දුරකට, කොපමණ ප්‍රමාණයකට තාර දානවාද කියලා දැන ගැනීමේ අයිතිවාසිකමක් ඒ ප්‍රදේශයේ ජීවත්වන පුරවැසියාට තිබෙනවා. අද ඒක ආරක්ෂා වෙලත් නැහැ. ඒ නිසා මම කිව්වේ, ඉතාම පල්ලෙහා මට්ටමේ සරල උදාහරණය. ඒක ඉහළ දක්වාම ගෙනි යන්න පුළුවන්කම ඇති වෙනවා. ඒ නිසා මෙන්න මේ මත රටේ ජාතික ධනය, රටේ මහජන මුදල් පුද්ගලයෙකුට ඕනෑ ඕනෑ විධියට කාබාසිනියා කරලා, නැති නාස්ති කරලා මේ වැඩ පිළිවෙළ ගෙනියන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ, මේ වාගේ තත්ත්වයක් ඇති වුණාම. අද සමහර තැන්වල ඇස්තමේන්තු හදනකොට කාර්මික නිලධාරීන්ට කියනවා, හොඳට මස දාලා ඇස්තමේන්තුව හදන්න කියලා. කටු එපා. මස දාලා හදන්න කියලා. ඒ මස දාලා හදන්න කියන්නේ, හොඳට ලාභය එන විධියට ඇස්තමේන්තුව හදන්න කියල. තමන්ට සම්බන්ධකම නැත්නම් මස නැහැ. කටු එක්ක තමයි ඇස්තමේන්තුව හැදිලා යන්නේ. ඉතින් ඒ වැඩේ කෙරෙන කොට සමහර වේලාවට ලාභ නැහැ. ඉතින් ඒ නිසා අපි කියන්නේ, මේ පනත තුළ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම රටේ මහජනතාවගේ සුරක්ෂිත වෙලා තිබෙනවා. යම් යම් සංශෝධනයන් මේක තුළ විය යුතුයි කියන එක අපි පිළිගන්නවා. කාලවේලාව ඉක්මවා ගිහිල්ලා තිබෙන නිසා මීට වැඩිය මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපේ ගරු මන්ත්‍රීවරු ගණනාවක් මේ පිළිබඳව තමන්ගේ මතය, අදහස ප්‍රකාශ කළා. ඒ පිළිබඳව සන්තෝෂයට පත් වෙනවා. ඒ නිසා මේ රටේ හෙට දවසේ අනාගත සුභ සිද්ධිය වෙනුවෙන් මෙවැනි පනත් තවත් වැඩි වැඩියෙන් මේ රටට අවශ්‍යතාව වී තිබෙනවයි කියන එක මතක් කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මේ අවස්ථාවේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධ අදහස් ප්‍රකාශ කිරීමේ කාලය මෙයින් අවසන් වෙනවා. එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මම විශ්වාස කරනවා, මන්ත්‍රීවරු රාශියක්ම විවිධ අදහස්, යෝජනා, සංශෝධන ඉදිරිපත් කළා. ඒ නිසා මේ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බෙදීමක් නැහැ.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සභාවේ කිසිම බෙදීමක් නැහැ. ඒ අනුව පළාත් සභාවේ සම්මත වූ මෙම පනත් කෙටුම්පත පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා රාශියක් සංශෝධන, අදහස්, යෝජනා ඉදිරිපත් කළා. ඒ සියලුම සංශෝධන, අදහස්, යෝජනා මම ගරු ආණ්ඩුකාරතුමා මගින් අතිගරු ජනාධිපතිතුමාට ලැබෙන්න සලස්වනවා. ඒ වාගේම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මේ සභා ගර්භයේ හිටපු ගරු මන්ත්‍රීතුමන්ලාත් වැදගත් වෙනවා. එතුමාගේ යෝජනාවක් සම්මත වන වේලාවේ සභා ගර්භය තුළ ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය - විපක්ෂයත් දැන් යහපාලන ආණ්ඩුවක් නිසා විශේෂයෙන්ම දෙපැත්තේම ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය පිළිබඳව තොරතුරු ගන්නය කියලා මම ලේකම්තුමාට උපදෙස් දෙනවා.

[ගරු සභාපතිතුමා ]

මේ අවස්ථාවේ සභා ගර්භය තුළ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලාගේ නම් එතුමාගේ දැන ගැනීම පිණිස ඒ එක්කම අරින්න කියලා - ඇමතිවරුත් නැහැ. මොකද, ඊයේ මේ සම්බන්ධයෙන් සම්මන්ත්‍රණයක් තිබුණා. මන්ත්‍රීවරු විසි ගණනයි සිටියේ. අපි සභාව කල් දැම්මෙත් ඒකයි. මන්ත්‍රීවරු විසි ගණනයි සිටියේ. ඒ නිසා ලේකම්තුමා කරුණාකර ඒ සම්මන්ත්‍රණයට සහභාගි වුණු නාම ලේඛනය සහ අද සභාවේ මේ වන විට අසුන් ගෙන සිටින මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛනයත් මේ එක්කම ගරු ආණ්ඩුකාරතුමා මගින් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කරන්නය කියලා මම එතුමාට අවශ්‍ය උපදෙස් ලබා දෙනවා.

න්‍යාය පත්‍රය අනුව ඊළගට යෝජනාවක් තිබෙනවා. පැයක කාලයක් ඉතිරිව තිබෙනවා. ඒ නිසා මම ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා, එතුමාගේ යෝජනාව ඉදිරිපත් කිරීමට.

ගරු සභානායකතුමා, දැන් සභාවේ හිටපු මන්ත්‍රීවරුන්ගේ අත්සන් ලේඛනයක් ගන්න. ඇමතිතුමන්ලාගෙයි, අනිකුත් මන්ත්‍රීතුමන්ලාගෙයි. සංවිධායකතුමාත් නැහැ නේ? සභා නායකතුමා හෝ - ගරු ප්‍රධාන අමාත්‍යතුමා මෙහෙන් ගන්න අමාරුයි. ආණ්ඩු පක්ෂයේ කවුරු හරි ගන්න. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

## රණවිරු ගම්මාන වැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම
IMPROVING THE LIVING CONDITION OF PEOPLE LIVING IN RANAVIRU VILLAGES

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ගරු සභාපතිතුමනි, "*බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ රණවිරු ගම්මාන කිහිපයක්ම පිහිටුවා ඇති අතර, මෙම ගම්මානවල ජීවත් වන්නේ තිස් වසරක් අප රට තුළ පැවති යුද්ධයෙන් අප මව්බිම මුදා ගැනීම සඳහා ජීවිත පරිත්‍යාග කළ යුද්ධය නිසා ආබාධිත වූ රණවිරුවන් සහ ඔවුන්ගේ මව්පියන්, අඹුදරුවන්ය. මැතිවරණ කාලසීමාවන් තුළ දී සියලු දේශපාලන පක්ෂ නියෝජිතයින් රණවිරු ගම්මානවලට ගොස් ඡන්දය ලබා ගත්තද, එම ගම්මානවල වැසියෝ ප්‍රවාහන, සෞඛ්‍ය, අධ්‍යාපන, පානීය ජලය නොමැතිකම වැනි ප්‍රශ්න රාශියකින් පීඩා විඳිති. අප රට වෙනුවෙන් විශාල කැපවීමක් සිදු කළ රණවිරු ගම්මානවල වෙසෙන ජනතාවගේ ඉහත සඳහන් අවශ්‍යතාවයන් ඇතුළු ගැටලු සොයා බලා ඒ සඳහා පිළියම් ලෙස රණවිරු ගම්මාන වැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයිද, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි.*"

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[අ.භා.12.28]

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. පසුගිය කාලය පුරාවටම අවුරුදු 30 කට ආසන්න කාලයක් අපේ රටේ විශාල යුද්ධයක් පැවතුණා. මේ යුද්ධය නිමා කරන්න මම හිතන්නේ අපේ රටේ හිටපු සියලුම රාජ්‍ය නායකයන් තමන්ට හැකි ආකාරයට කටයුතු කළා. නමුත් ඒ යුද්ධය නිමා කරන්නට හැකියාව ලැබුණේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ. මගේ නායක ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මැතිතුමාගේ යුධමය නායකත්වයත් සමඟම ඒ යුද්ධය නිමා කරන්නට අපට හැකි වුණා. ඇත්තටම, ඒ යුද්ධය කාලයේදී මේ රටේ අහිංසක තරුණ තරුණියන් රාශියක් විවිධ ආබාධවලට ලක් වුණා. දහස් ගණනකගේ ජීවිත අහිමි වුණා. මේ අය වෙනුවෙන් තමයි රණවිරු ගම්මාන ඇති වුණේ. 1988 දී දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ සංකල්පයක් පරිදි රණවිරු ගම්මාන ඇති වුණා. ගරු සභාපතිතුමනි, මම හිතන්නේ, ඔබතුමාත් නියෝජනය කරන බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ කැරගල, වතුපිටිවල, උඩුපිළ, පස්යාල යන ප්‍රදේශයන්වල මේ රණවිරු ගම්මාන පිහිටුවා තිබෙනවා. එමෙන්ම කොළඹ

දිස්ත්‍රික්කයේ මා දන්නා ආකාරයට කොස්ගමත්, කළුතර දිස්ත්‍රික්කයේ නෑබඩත් යන ප්‍රදේශවල මේ රණවිරු ගම්මාන පිහිටා තිබෙනවා. හැබැයි ගරු සභාපතිතුමනි, මේ යුද්ධය වෙනුවෙන් කැප වෙලා, යුද්ධය වෙනුවෙන් අතපය නැති කරගෙන, ජීවිත අහිමි කරගෙන විවිධ ආකාරයෙන් මානුෂිකව වැටුණු, අතපය අහිමි කරගෙන අසරණ වෙලා ජීවත්වන රණවිරුවන් ඉන්න ගම්මානවල අද තිබෙන තත්ත්වය ඉතාම ශෝචනීයයි. විශේෂයෙන්ම ඔබතුමාත් දන්නවා ඇති. ගම්පහ දිස්ත්‍රික්කයේ රණවිරුවන් සිටින ගම්මානවල, මම යෝජනාවේ සඳහන් කරලා තිබෙන ආකාරයට හිටපු ප්‍රධාන අමාත්‍යවරයා වෙනුවෙන් අපි සියලු දෙනා වෙනුවෙන්ම වැඩ කරන ජනතාව මේ ගම්මානවල ඉන්නවා. මැතිවරණ කාලයට ඒ අය දැවැන්ත කැප කිරීම් කරනවා. හැබැයි, මේ රට වෙනුවෙන් තමන්ගේ දරු පවුල්, තමන්ගේ ජීවිත නැති කර ගත්තු පුද්ගලයන් වෙසෙන ඒ ගම්මානයේ අඩුපාඩු රාශියක් අද තිබෙනවා.

විශේෂයෙන්ම ඒ ආකාරයට රණවිරු ගම්මාන ඇති කළත්, ඒ සියලු ආණ්ඩු විවිධ කරුණු කාරණා විවිධ ආකාරයෙන් කටයුතු කළාට, අද වන කොට මම හිතන්නේ අඩුපාඩු රාශියක් මේවා තුළ තිබෙනවා. විශේෂයෙන්ම පානීය ජල පහසුකම් නැති තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ ගම්මානවල වැසි ජලය බැහැලා යන්න කාණු පද්ධතියක් හරියට නැහැ. අපි ඇස් දෙකට දැක්කා, සමහර ගෙවල් යට වෙනවා. යට වෙන ඒ ගෙවල්වල විභාගවලට මුහුණ දෙන දරුවන් ඉන්නවා. ඒ දරුවන්ට පාඩම් කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි ඒ මාර්ග සංවර්ධනය කරලා නැහැ. සමහර රණවිරු ගම්මානවලට හරියට ප්‍රවාහන පද්ධතියක් නැහැ. කිලෝ මීටර් ගණනාවක් පයින් යන්න තිබෙන සමහර ගම්මාන තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ වාගේම තමයි මේ රණවිරු ගම්මානවල විවිධ ආබාධයන්ගෙන් පෙළෙන රණවිරුවන් ඉන්නවා. මේ අයට තමන්ගේ ජීවන තත්ත්වය පවත්වාගෙන යන්න ව්‍යායාම කරන්න කියලා උපදෙස් දීලා තිබෙනවා, ගරු මහ ඇමතිතුමනි. එතකොට ඒ සඳහා අවශ්‍ය පහසුකම් ඒ ගම්මානවල නැහැ. සමහර වේලාවට ඒ අයට කායවර්ධන මධ්‍යස්ථානවලට විශාල ගණන් ගෙවන්න වෙලා තිබෙනවා. සමහර අයට උපකරණ මිලට ගන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ හැමෝම අපි වෙනුවෙන්, මේ රටේ සියලු ජනතාව වෙනුවෙන් යුධ වැදුණු රණවිරුවන්. ඉතින් අපි ඉල්ලා සිටිනවා. ඒ කාය වර්ධන මධ්‍යස්ථාන, ඒ වාගේම ඇවිදීමේ මංතීරු වාගේ දේවල් ගම්මානවල ඇති කරන්න පුළුවන් නම්, මේ බස්නාහිර පළාත තුළ සිදු කරන විශාල සත් කාරයක් හැටියට දකිනවා. ඉතින් මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යෝජනා කරනවා.

විශේෂයෙන්ම ඔබතුමාට කාලය ඇති පරිදි එක දවසක් හරි යොදා ගෙන පුළුවන් නම්, මේ රණවිරු ගම්මානවල ඒ දිස්ත්‍රික්ක තුනේම ගිහිල්ලා ඒ අයව හම්බ වෙන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඉතාම ශෝචනීය කතන්දර ගණනාවක් තිබෙනවා. මම හිතන්නේ, ඇත්තටම ගිහිල්ලා ඇස් දෙකෙන් බලලා ඒ අයත් එක්ක ඔබතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලය, විපක්ෂ නායකතුමා ඇතුළු මේ ගරු මන්ත්‍රීවරු ගිහිල්ලා විනාඩි 05 ක් 10 ක් හරි ඒ අය එක්ක කථා කරලා, මොනවද අවශ්‍ය මූලික අවශ්‍යතා ටික - ඇත්තටම ඒ ගම්මානවලට ගියාම තේරෙනවා, තිබෙන අඩුපාඩු. ඔවුන්ගේ ඒ මානුෂීය තත්ත්වය අපි සැලකිල්ලට ගන්න ඕනෑ. ඉතින් මේ සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයටත්, ගරු විපක්ෂ නායකතුමාටත් අවධානය මම යොමු කරන්න කැමැතියි. අපි එකතු වෙලා ගිහිල්ලා මේවායේ අඩුපාඩු බලලා, කරන්න පුළුවන් මොකක්ද කියලා බලලා බස්නාහිර පළාත් සභාව තුළ ඒ දේවල් කිරීමට හැකි නම් සුදුසු යැයි කියා ඒ යෝජනාවද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මට තවම කථික ලැයිස්තුවක් නම් නැහැ. නමුත් ආණ්ඩු පක්ෂයෙත් රණවිරුවන් දෙදෙනෙක් ඉන්නවා. ඔබතුමා කථා කරනවාද? රණවිරුවන් එක්ක - ආණ්ඩු පක්ෂයෙත් කවුරු හරි ඉන්න ඕනෑ. විපක්ෂයෙත් ඉන්නවා. කවුරුත් නැහැ නේ එහෙමනම්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, දැන් පැමිණීම පිළිබඳ ලේඛනයක් අත්සන් කරනවා කිව්වා. දැන් විපක්ෂයේ වෙනම ලේඛනයක් තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ වෙනම ලේඛනයක් තිබෙනවා. අපි ඒ දෙකටම නැති අය අත්සන් කරන තැනක් මොකක් හරි -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නපුංසක.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ. එහෙමනම් නැහැ. ඒ ආණ්ඩුවේ නේ?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මේ පැත්තේ අත්සන් කරන්නය කියලා අපි ඔබතුමාට ආරාධනා කරනවා.

[අ.භා.12.35]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාවට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් වචන කිහිපයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. මම සතුටු වෙනවා, ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා වාගේ මන්ත්‍රීවරයෙක් මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන. මොකද, ඉස්සෙල්ලාම අහන්නත් සිද්ධ වෙනවා, ඇඳුම් ඇඳගෙන ද මේ යෝජනාව ඉදිරිපත් කළේ කියලා. මොකද, එතුමා නියෝජනය කරන්නේ ලංකාවේ ඉන්න ලොකුම රණවිරුවාගේ දේශපාලන පක්ෂය. එක call එකෙන් මේ ෆීල්ඩ් මාෂල්ට රණවිරුවන්ගේ දේවල් කරන්න පුළුවන්. රණවිරුවන්ගේ සියලු දේවල්. එතුමන්ලාගේ ආණ්ඩුව තිබෙන්නේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

දැන් දීලා නේ තිබෙන්නේ. ෆීල්ඩ් මාෂල්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ෆීල්ඩ් මාෂල් තනතුර දීලා, ආණ්ඩුවට සම්බන්ධ වෙලා, ආණ්ඩුවත් එක්ක කටයුතු කරන කාලයේ කොපමණ දේවල් රණවිරුවන් වෙනුවෙන් කරන්න පුළුවන්ද?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ජාතික විධායක සභාව නියෝජනය කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අවාසනාවට තමන්ගේ වාසි ප්‍රයෝජන ටික ගන්නවා මිසක් රණවිරුවන් වෙනුවෙන් කථා කරනවා අපි තවමත් දැක්කේ නැහැ. සරත් ෆොන්සේකා මැතිතුමා එක වචනයක්වත් රණවිරුවන් වෙනුවෙන් කථා කරනවා අපි තවමත් දැක්කේ නැහැ. ඒ අයගේ අයිතිවාසිකම් වෙනුවෙන් කථා කරනවා අපි තවමත් දැක්කේ නැහැ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒ වුණාට ෆීල්ඩ් මාෂල් තනතුර හදා ගත්තා නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අපි බලාගෙන ඉන්නවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ ගැන මම විරුද්ධ වෙනවා. එතුමාගේ නෝනා රණවිරු සේවා අධිකාරිය හරහා විශාල වැඩ කොටසක් කරනවා. බොරුවට මඩ ගහන්න එපා. මම ඒ ගැන පස්සේ පාඩමක් කියලා දෙන්නම්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මම කථා කළාට පස්සේ කථා කරන්න. අපි තවමත් දැක්කේ නැහැ, එහෙම දේවල් වෙනවා. ගරු සභාපතිතුමනි, මේ කාලසීමාව තමයි රණවිරුවන්ව විශාල විධියට අපහසුතාවයට පත් කරන කාලසීමාව බවට පත් වෙලා තිබෙන්නේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

රණවිරුවන් දංගෙඩියට ගෙනි යනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

දංගෙඩියට ගෙන යනවා තමයි. වැරැදි කෙරුවා නම් කවුරුත් ගෙනි යන්න ඕනෑ

[සභාවේ ඝෝෂා]

හොඳට මතක තියා ගන්න. වැරැදි කරලා බේරෙන්න බැහැ. රටේ නීතියක් තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, සිරිකමල් ගරු මන්ත්‍රීතුමා බාධා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

රණවිරුවන් කරන වැරැදි මොනවාද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එතුමා කියනවා රටේ නීතියක් තිබෙනවාලු. එහෙමනම් එතුමාගේ ඇමතිතුමා තමයි ඉස්සෙල්ලාම ගෙනි යන්න ඕනෑ. මිනී කීයක් මරලා තිබෙනවාද? කී දෙනෙකුට ගහලා තිබෙනවාද? හැබැයි, එහෙම කරලා නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එහෙම තිබෙනවා නම් උසාවියට ගෙනෙන්න. ඉස්සර වාගේ මිනී මරලා හංගන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එතකොට හිරුණිකා ඉන්නේ කොහොමද?

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒ ගහපුවා අහු වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා. ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

[සභාවේ ඝෝෂා]

සිරිකමල් ගරු මන්ත්‍රීතුමා බාධා කිරීම් කරන්න එපා. මම ඔබතුමාට කථා කරන්න කාලය දෙන්නම්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාට මම කියන්න ඕනෑ

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම්වලට යන්න එපා. මන්ත්‍රීවරු බොරුවට කෑ ගහන්න එපා. මම කාලය දෙන්නම්. ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා, අපේ රටේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගෙනාවේ මේ රටේ ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා. ඒ පනත පාවිච්චි කරලා කළේ ත්‍රස්තවාදීන් අත්අඩංගුවට ගන්න එකයි. ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් නතර කරන එක. හැබැයි අද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පාවිච්චි කරලා රණවිරුවන් අත්අඩංගුවට ගන්න එක කරන්නේ. මේ රටේ යුද්ධය අවසන් කරන්න -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

සරත් ෆොන්සේකා මැතිතුමා එතකොට අත්අඩංගුවට ගත්තේ, කරපු වැරැද්දක් නැතිව.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සරත් ෆොන්සේකා අත්අඩංගුවට ගත්තේ වැරැද්දක් කරපු නිසා. වැරැද්දක් නිසා අත්අඩංගුවට ගත්තේ. අපි තවම දැක්කේ නැහැ, සරත් ෆොන්සේකා මැතිතුමා එක වචනයක් කථා කරනවා. (බාධා කිරීම්) මම කථා කළාට පස්සේ උත්තර දෙන්න.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, තුප්පහි, තක්කඩි දේශපාලනය කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ත්‍රස්තවාදය වළක්වන්න ලොකුම සේවාව කළ රණවිරුන් අත්අඩංගුවට ගනිද්දී අපි තවම දැක්කේ නැහැ, ෆොන්සේකා

[ගරු මහේෂ් අල්මේදා ]

මහත්මයා එක වචනයක් කථා කරනවා. රණවිරුවන් අත්අඩංගුවට ගැනීමට විරුද්ධව එක වචනයක් කථා කළේ නැහැ. ලංකාවේ ඔත්තු සේවාවල්වල කටයුතු කරපු ලොකුම රණවිරුවන් ටික තමයි අද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට අරන් ඉන්නේ.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ දරුවන් පාසල්වලට ඇතුළත් කර ගැනීමේ කාරණාවලදී මේ රටේ රණවිරුන්ට තිබුණු කෝටා එක අහෝසි කළා. රණවිරු ලේඛනයෙන් දරුවන් පාසල්වලට ගන්න එක අහෝසි කළා. තවම අපි දැක්කේ නැහැ, එක වචනයක්වත් කථා කරනවා මේ රටේ ලොකුම රණවිරුවන්ගේ අයිතිවාසිකම් ගැන කථා කරන කෙනා. තවම කථා කළේ නැහැ. (බාධා කිරීමක්) රණවිරුවන්ගේ දරුවන් අද ඉස්කෝලවල දාන්න බැහැ. රණවිරුවන්ට කනගාටුවෙන් එක වචනයක්වත් කථා කරලා නැහැ.

ගරු සභාපතිතුමනි, අපි කියන්න ඕනෑ. රණවිරුවන් වෙනුවෙන් සේවය කළේ මහින්ද රාජපක්ෂ හිටපු ගරු ජනාධිපතිතුමා. එතුමා තමයි රණවිරුවන් වෙනුවෙන් දැවැන්ත ගම්මාන හැදුවේ. රණවිරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කෙරුවේ. රණවිරුන්ගේ මානසිකත්වය වැඩි කළේ, රණවිරුවන්ට ගෙවල් හැදුවේ, රණවිරුවන්ට පාරවල් දුන්නේ, රණවිරු කෝටා එකක් දුන්නේ, පාසල්වලට දරුවෝ දාලා දුන්නේ. ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, මහින්ද රාජපක්ෂ මැතිතුමා රණවිරුවන් වෙනුවෙන් පාසල් හදන්න කටයුතු කළා. අද රණවිරුවන්ට පාසල් තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

සරත් ෆොන්සේකා මහත්තයාට පිං සිද්ධ වෙන්න යුද්ධය ඉවර වුණේ. ඒක කියන්න ඉස්සෙල්ලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ නිසා අද රණවිරුවන්ට මේ රටේ ඉතිහාසයේ යම් සහනයක් දුන්නා නම් -

[සභාවේ ඝෝෂා]

ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ රණවිරුවන් ජීවත් වන ගම්වල පහසුකම් (බාධා කිරීමක්) රණවිරුවන්ට වතුර නැහැ. කෝලිකා හර්ෂනී ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමිය -

[සභාවේ ඝෝෂා]

ඒ නිසා රණවිරුවන් වෙනුවෙන් කරන්න තිබෙන සේවාව මේ ආණ්ඩුව විසින් දිගින් දිගටම කළ යුතුව තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ යෝජනාව අපි දකින්නේ දෛවයේ සරදමක් වාගේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න මේ කියන දේවල් මාධ්‍යයට ඇහෙන්නේ නැහැ. ඝෝෂාවක් විතරයි ඇහෙන්නේ. කාලයේ ප්‍රශ්නයක් නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මාතෘකාවට නොවෙයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අවස්ථාවක් දෙන්නම්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මාතෘකාවට තමයි කථා කරන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔබතුමාගේ ප්‍රතිපත්තියට මොකද වුණේ? වාමාංශික දේශපාලනයක් නියෝජනය කරපු නායකයෙක්. කනගාටුයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ බාධා කිරීමක් දකින්නේ. රණවිරුවන්ගේ (බාධා කිරීමක්) විධියට. සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා ඒ අයගේ දේශපාලන ප්‍රතිපත්තිය තමයි මේ ක්‍රියාත්මක කරන්නේ. රණවිරුවන්ට සේවාවක් කරන්න තිබෙන අවස්ථාව කඩාකප්පල් කරන්න තමයි මේ උත්සාහ කරන්නේ. ඒක ඉතිහාසය පුරාම මේ අය කළා. රණවිරුවන්ට විරුද්ධව සකලවිධ කුමන්ත්‍රණ කෙරුවා. ඒක තවදුරටත් කරන එක තමයි මේ කරන්නේ. රණවිරුවන් වෙනුවෙන් කථා කරන අවස්ථාවලටත් බාධා කරන්නේ, රණවිරුවන්ට සේවාවක් කරන්න තිබෙන අවස්ථාව වළක්වන්නයි. ඒ නිසා ඒ පිළිබඳව අපි කනගාටු වෙනවා. ඒ වාගේම මේ යෝජනාව දෛවයේ සරදමක් විධියට අපි දකිනවා. තමන්ට ඉතිහාසය විසින් බාර දුන් වගකීමක් ප්‍රමාද වෙලා ඉෂ්ට කරන්න ගත්තු උත්සාහයක් විධියට අපි දකිනවා. ඒ නිසා මේ යෝජනාව එන්නත් කලින් බස්නාහිර පළාත් සභාව අතිවිශාල අරමුදලක් වියදම් කරලා රණවිරු ගම්මානවල විශාල ක්‍රියාකාරකම් ගණනාවක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. කෝකිලා හර්ෂනී ගරු මන්ත්‍රීතුමිය කිව්වා, එතුමිය ජීවත් වන ගමේ රණවිරු ගම්මානයට වතුර දුන්නේ, පළාත් සභාවේ අරමුදල්වලින් කියලා. කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන්නේ එකම එක රණවිරු ගම්මානයයි. ඒ සාලාව රණවිරු ගම්මානය විතරයි. ඒකේ පාලම කැඩිලා. රණවිරුවන්ට යන්න බැරුව තිබුණා. ලක්ෂ 50 ක් විතර වියදම් කරලා අපේ හිටපු ගරු ප්‍රධාන ඇමැතිතුමා, ප්‍රසන්න රණතුංග මැතිතුමා ඒ රණවිරු ගම්මානයේ පාලම හදලා රණවිරුවන්ට යන්න පුළුවන් අවස්ථාව උදා කරලා දුන්නා.

රණවිරුවෝ අත පය නැති කරගෙන, ජීවිතය නැති කරගෙන මේ රටේ හදලා දීපු නිදහස පාවිච්චි කරලා තමයි අද සිරිකමල් මන්ත්‍රීතුමන්ලාට කථා කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. රණවිරුවෝ දිනා දීපු නිදහසින් තමයි සිරිකමල් මන්ත්‍රීතුමන්ලා පාරේ බැහැලා යන්නේ. ඒ නිසා රණවිරුවන්ට අපහාස කරන්න එපා. රණවිරුවෝ රකින්න. රණවිරුවෝ ආරක්ෂා කරන්න. ඔවුන් කරපු කැප කිරීම ජීවිතය කාලය පුරාම තියාගෙන රණවිරුවෝ වෙනුවෙන් කථා කරන වෙලාවේ ඒ කථා කරන අවස්ථාවටත් බාධා කරන්න එපා කියන කාරණය මතක් කරන ගමන් නැවත නැවතත් කියනවා, මේ යෝජනාව ඉතිහාසයේ සරදමක් විධියට ඉදිරිපත් වුණු එකක්. තමන්ට වුණු මහා අතපසුවීම වළක්වාගෙන, යම් සාධාරණත්වයක් රණවිරුවෝ තුළ දිනා ගන්න ගත්තු උත්සාහයක් විධියට අපි දකින්නේ. මේ යෝජනාව ආවත් නැතත් රණවිරුවන් වෙනුවෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමාත්, ගෙවුණු ආණ්ඩුවත්, අපත් කරන්න පුළුවන් හැමදේම කරලා තිබෙනවා. ඉදිරි කාලයේත් කරනවා කියන කාරණය මතක් කරන ගමන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ගරු සභාපතිතුමනි, ගණපූරණය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, සභාවේ ගණපූරණය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

හොඳ යෝජනාවලදී මේ අය ගණපූරණය අදිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න. මෙතුමා ආසනයේ ඉඳලා නොවෙයි ගණපූරණය ඉල්ලා සිටියේ. මම ගණන් ගන්නේ නැහැ.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ගරු සභාපතිතුමනි, ගණපූරණය පිළිබඳ පළමුවෙන්ම යෝජනාව ගෙනාවේ මම. ඉන් පස්සේ තමයි මෙතුමා මෙතැන ඉඳන් යෝජනා කළේ. සභාවේ ගණපූරණය නොමැති බවට ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දැන් පිළිගන්නවා. එතුමා සීට් එකේ ඉන්න නිසා. කරුණාකර සීනුව නාද කරන්න.

***පළාත් සභාව ගණන් කොට ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණය ඇති විය.***

*Provincial council counted, and a Quorum not being present, the Division bells were ordered to be rung,*
*Later, a Quorum being present.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[අ.භා.12.49]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, අපේ ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්. නමුත් මේක පිටිපස්සේ මතු කළ යුතු යම් කාරණා කිහිපයක් තිබෙනවා. විශේෂයෙන් මම දන්නවා, කොස්ගම ප්‍රදේශයේ රණවිරු ගම්මානයක් තිබෙනවා. මේකේ ඉන්න ඇතැම් අය බොහෝ විට අපට කථා කරනවා. ඒ නිසා මම මේ ප්‍රශ්නයේ ගැඹුර දන්නවා. හැබැයි මට කනාගටු විය යුතු කාරණාවක් තිබෙනවා. ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට මේ ප්‍රශ්නය ලෙහෙසියෙන්ම විසඳ ගන්න තිබුණා. ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මැතිතුමාට මහා තනතුරක් දීලා, රනිල් - මෛත්‍රී ආණ්ඩුවේ කරන්න බැරි දෙයක් නැහැයි කියපු සරත් ෆොන්සේකා මැතිතුමාට එක දුරකථන ඇමැතුමෙන් ජනාධිපතිතුමා හෝ අගමැතිතුමා ලවා අමාත්‍යාංශයක් හෝ අරගෙන රණවිරුවන් වෙනුවෙන් වැඩ කරන්න ඉඩකඩ තිබුණා. (බාධා කිරීමක්) මම කිව්වේ ගරු සභාපතිතුමනි, එලාදයි යෝජනාවක් කරන්න තිබුණා. මම දන්න හැටියට ලංකාවේ රණවිරු ගම්මාන 21 ක් තිබෙනවා.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, මේ යෝජනාව ගෙනාවේ ඔබතුමා කණ්ඩායම් නායක වෙලා ඉන්න කොට. ඔබතුමාගේ උපදෙස් පරිදි මේ යෝජනාව ගෙනාවේ. ඔබතුමා පක්ෂයේ ඉඳිද්දී, ඔබතුමාගේ උපදෙස් පරිදි මේක හැදුවේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

යෝජනාව ගෙනාපු කෙනාට කට්ටිය නැතුව දැන් මේ කතන්දර කියන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා කියන දේවල් මට අදාළ නැහැ. මගේ කථාවට තර්ක කරන්න -

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ඔබතුමාගෙන් අහලා නේ ගෙනාවේ?

[සභාවේ ඝෝෂා]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔන්න මීට වැඩිය දේවල් දිග ඇර ගන්න හදන්න එපා ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා. හරිද? කරුණාකරලා පරණ කථා දිග අරින්න එපා. මම කිව්වේ, ෆොන්සේකා මහත්තයා එක රණවිරුවෙක් ගැන කථා කළේ නැහැ. මම අරන් ගිහිල්ලා තියෙනවා, ලියුම් මිටියක්. මම ලියුම් මිටියක් අරගෙන ගිහිල්ලා තියෙනවා රණවිරුවන් සම්බන්ධව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අන්න අහගන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මා ළඟ තිබෙනවා. මේ පක්ෂයේ සාමාජිකයෙක් හැටියට හිතලා ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා ලවා මේ ප්‍රශ්න ටික විසඳලා දෙන්න කියලා මම අරන් ගිහින් දුන්නා. ලියුම් මිටිය ගෙනැල්ලා මම සභාගත කරන්නම්. අද නැහැ. මම දන්නේ නැහැ මේ යෝජනාව ගේනවා කියලා. එක ලියුමක් ගැන සලකා බලන්නේ නැහැ. මේ අනෙක් මන්ත්‍රීවරු සාක්ෂි කියයි. එතුමා රණවිරුවන් ගැන කථා කරන්නේ නැහැ. නමුත් එතුමාට කථා කරන්න තිබුණා. එතුමා මොකක්ද කියන්නේ? ප්‍රධාන පක්ෂ දෙකෙන් එකකටවත් මගෙන් අයින් වන කිසිම මිනිහෙකුට යන්න දෙන්නේ නැහැ. එහෙම කියන මනුස්සයාට රණවිරුවෙකුට - මෙතුමන්ලාට රණවිරු ගම්මානවලින් ඡන්ද ටිකවත් නැහැ. ඒකයි මේ කථා කරන්නේ.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ඔබතුමා රණවිරු ගම්මානවලට ගිහිල්ලා තිබෙනවාද? ගම්පහ රණවිරු ගම්මානවලට -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මේ රණවිරු ගම්මානවල වණ්ඩි පිරිලා. ජාවාරම් කරනවා. ගණිකා වෘත්තිය කරනවා. කාන්තාවකට, ගැහැණු දරුවෙකුට එළියේ බැහැලා යන්න බැහැ. ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහත්තයාට මේවා ලෙහෙසියෙන් කරන්න තිබුණා නේ? අඩුම ගාණේ ඒ මිනිස්සුන්ගේ ආරක්ෂාව. මෙතුමා දන්නවා. මේ ඉන්නවා, රණවිරුවෝ ඕනෑ තරම්. මේවා ඉතාමත් දූෂිත ස්ථාන බවට පත් වෙලා. ගම්මාන හැදුවාට වැඩක් නැහැ. ඒ මිනිස්සුන්ට මූලික පහසුකම් නැහැ. වතුර ටික නැහැ. ලයිට් නැහැ. සමහර ගෙවල්වල ලයිට් තිබුණා. මොකද ආදායමක් නැහැ. රණවිරුවාට ජීවිතාන්තය දක්වා වැටුප දෙනවා කිව්වා. අද කිසිම දීමනාවක් නැහැ. තවමත් උතුරු - නැගෙනහිර ආරක්ෂා කරන්න අපේ රණවිරුවෝ දුක් විඳිනවා. හැබැයි සියලු දීමනා කපලා. එහෙම නේද? සියලු දීමනා කපලා. ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මැතිතුමාට ඒවා කථා කරන්න කියන්න. ඒවා කථා කරන්න කියන්න. ඒවා කථා කළා නම් ඡන්ද ටිකක්වත් ගන්න තිබුණා. ගරු සභාපතිතුමනි, ඒ නිසා පාසල් කෝටාව අයින් කරලා, දුෂ්කර දීමනා අයින් කරලා සියලු පහසුකම් නැති කරලා තියෙන්නේ. ළමයින්ට පොත් පත් නැහැ. ගම්මානවල සමහර අය අපට කථා කරලා කියනවා, අපේ දරුවන්ට මේ සැරේ ඉස්කෝලේ යන්න පොත්පත් ටික නැහැ කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මීට වඩා ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක කළ යුතු වැඩ සටහනක් මේක. ඒක නිසා මේක ඉහළට ගෙනියන්න. අපි කියනවා බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ රණවිරු ගම්මාන තිබෙන්නේ, ඉතාමත් සීමිත ගණනක්. ඒ රණවිරු ගම්මානවලට අපි උදව් කරන්න ඕනෑ. හැබැයි රට පුරා රණවිරු ගම්මාන 21 ක් තිබෙනවා. ඒ නිසා මේක ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක, අපි ඔබතුමාගේ යෝජනාවට සහාය දෙනවා. කිසි තර්කයක් නැහැ. හැබැයි ඔබතුමාගේ නායකතුමාට කියන්න ජාතික මට්ටමේ වැඩ සටහනකට දැම්ම ගිහිල්ලා, රනිල් - මෛත්‍රී එක්ක කථා කරලා, එවැනි වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්නය කියලා. බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් සමාවෙලා වාඩි වෙන්න. මුලින්ම මේ යෝජනාව ආපු වෙලාවේ ආණ්ඩු පක්ෂයෙන් මම ඉල්ලීමක් කරලා විවාදයට සම්බන්ධ වෙන්න කිව්වාම. කවුරුත්ම හිටියේ නැහැ. මම පැහැදිලිව කිව්වා. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විතරක් කථාවක් දෙන්න කියලා මගෙන් ඉල්ලීමක් කළේ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා පස්සේ කථා කළා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමා වෙලාව තියෙනවා කිව්වා. ඒකයි මේ දැන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වෙලාව තියෙනවා කිව්වා.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු සභාපතිතුමනි, ඔබතුමා ප්‍රකාශයක් කළා රණවිරුවෝ ඉන්නවා. රණවිරුවන් වෙනුවෙන් කවුරුත් කථා කරන්නේ නැහැයි කියලා. ඒක නිසා අපට අවස්ථාවක් දෙන්න රණවිරුවන් වෙනුවෙන් කථා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්නම්. දෙන්නම්. මම කලින් කිව්වේ, මේ යෝජනාව වැදගත් යෝජනාවක්. මට හිතා ගන්න බැහැ මේ යෝජනාව සම්බන්ධයෙන් රණවිරුවෝම ගණපූරණය නැහැයි කියනවා. ඒකයි මට තිබෙනව ගැටළුව. අපේ රණවිරු මන්ත්‍රීවරුම ගණපූරණය නැහැයි කියලා මගෙන් ඉල්ලීමක් කරනවා. මට හිතා ගන්න බැහැ මොකක්ද ප්‍රශ්නය කියලා. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[අ.භා.12.54]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, අපේ ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා ඉතාමත් කාලෝචිත අවශ්‍යතාවයක් මත හොඳ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. රණවිරු ගම්මාන පිළිබඳව. ඔවුන්ගේ අවශ්‍යතාවය මත අවශ්‍ය කරන සියලු පහසුකම් ලබා දීමට කටයුතු කරන්න කියලා. මට මතක් වෙනවා ගරු සභාපතිතුමනි, අලිමංකඩ යනවා කියලා, පාමංකඩ ගියා කියලා කියපු කථා. මේවා ඇහෙන කොට හදවතින්ම එක පැත්තකින් අපි දුක් වෙනවා. එක පැත්තකින් සන්තෝෂ වෙනවා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාල වකවානුව තුළ එතුමා කිව්වා, මේ රටට අවශ්‍ය වන ශක්තිය රණවිරුවෝ වෙනුවෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් සමාවෙන්න. මේ අවස්ථාවේදී සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා කථා කරන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

මූලාසානරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය තුළ රණවිරුවන්ට අවශ්‍ය කරන ශක්තිය උපරිමයෙන් ලබා දීලා, මේ රටේ අවශ්‍ය කරන ආකාරයෙන් අභිමානය, ගෞරවය ලබා දීලා කටයුතු කිරීම පිළිබඳව එතුමා කිව්වා, අද දින සන්තෝෂ වෙනවා කියලා. මේ වනකොට යහපාලන ආණ්ඩුවේ රණවිරුවන්ට වෙලා තිබෙන දේ - මම හිතන්නේ මෙතැන ඉන්නවා රණවිරු මන්ත්‍රීවරු සෑහෙන්න පිරිසක්. ඔවුන් දන්නවා මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. සමස්ත රටම දන්නවා. ලෝකයම දන්නවා. අද තිස් අවුරුද්දක් තිබුණු යුද්ධය නිමා කරන්න, ඒ යුද්ධයේදී කටයුතු කරපු රණවිරුන්ව ජීවිතාන්තය දක්වා හිර ගෙවල්වලට දාන්න කටයුතු කරලා, මම හිතන්නේ අපේ ආදරණීය සහෝදර ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කරන කොට අපි එක පැත්තකින් කනගාටු වෙනවා. ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මැතිතුමාට එක බොත්තමක් තද කරපු පමණින් කථා කරන්න පුළුවන්. ටක් ගාලා අතිගරු ජනාධිපතිතුමාට කථා කරලා, අගමැතිතුමාට කථා කරලා මේ ප්‍රශ්න සියල්ල විසඳන්න පුළුවන්. මහින්ද රාජපක්ෂ මැතිතුමා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඒ ආසනවල මන්ත්‍රීවරු, අද සමස්ත රට තුළම රණවිරු ගම්මාන 21 ක් පමණ ස්ථාපිත කරලා ඒ අවශ්‍ය කරන සියල්ල ලබා දීලා මහ දැවැන්ත කටයුත්තක් නිර්මාණය කරලා, දීලා තිබෙනවා. හැබැයි දැන් තිබෙන්නේ, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවක් නොවෙයි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක්. එහෙම නම් ඒ ආණ්ඩුව තුළින් අවශ්‍ය කරන සියලු කටයුතු කරන්න තමුන්නාන්සේලා බැඳී සිටිනවා. එදා අපට මතකයි අපේ ගමට රණවිරුවෙක් මැරිලා එනකොට, එක පවුලේ තුන හතර මැරිලා එනකොට අවුරුදු තිස් ගණන්, හතලිස් ගණන් නඩු පැවරුණු ඉඩමට මිනියවත් ගෙදරට ගන්න දුන්නේ නැති තත්ත්වයක් උදා වුණා. හැබැයි එදා විරුද්ධ වුණේ එක්සත් ජාතික පක්ෂයේ පිරිස් තමයි. එහෙම වුණු කාල අපට මතකයි. නමුත් ඒ ප්‍රශ්න අපි මොහොතකින් වෙනස් කරලා,

අදාළ නඩු පැත්තකට දාලා මිනිය ගෙදරට ගෙනියන්න, පාරට කොන්ක්‍රීට් ටික දාන්න රණවිරුවන්ට අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්න මේ කථා කරන අපි කටයුතු කරලා තිබෙනවා. ඒක අහගන්න පුළුවන් බේරුවල ආසනයට ගියොත්. මේ කථා කරන මම රණවිරුවන් වෙනුවෙන් අංග සම්පූර්ණ නිවාස රාශියක් හදලා දීලා තිබෙනවා. අපි අහනවා. එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉන්නවා. තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු කීදෙනෙක් එවන් වූ කටයුත්තක් කරලා තිබෙනවා කියලා අපි අහනවා. එහෙම නම් මේ යෝජනාව දාන්න පෙර ඔබතුමන්ලාට තිබෙනවා මේ ඉන්න සියලු මන්ත්‍රීවරු එක්ක සුහදව කථා කරලා, මේ ඇමැතිවරු එක්ක සුහදව කථා කරලා, මොවුන් වෙනුවෙන් මේ යෝජනාවට වඩා යම්කිසි දෙයක් ඉල්ල ගෙන කරන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි ඒක නොවෙයි කෙරිලා තිබෙන්නේ. අද මේ යෝජනාව මෙතැනට දානකොට රණවිරුවෝ අපහසුතාවයට පත් වෙලා, අද ඔවුන් කථා නොකර තත්ත්වයට පත් වෙලා තිබෙනවා. හේතුව මොකක්ද? රණවිරුවාගේ තිබෙන ගෞරවය, අභිමානය පැත්තකට දාලා තිබෙනවා. එදා පාසලට දරුවා ඇතුළත් කරන කොට ක්‍රියාන්විතයේ ඉන්න රණවිරුවාගේ දරුවා පාසලට ඇතුළත් කරනවා. අද මොකද වෙලා තිබෙන්නේ? රණවිරුවාව ශත පහකට ගණන් ගන්නේ නැති තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. එදා බස් එකේ යනකොට, බැංකුවට ගියාම රණවිරුවා ආවාට පස්සේ පළමුවැනි තැන දුන්නා. අද රණවිරුවාට එහෙම තැනක් දෙන්න කවුරුත් නැහැ. හේතුව මොකක්ද? මහා යුද්ධයක් ක්‍රියාත්මක වෙලාත්, එදා ඒ අවශ්‍ය කරන කටයුතු සියල්ල සිද්ධ වුණා. අද මම හිතන්නේ, යාපනයේ ඉන්න, මේ විධියටම කටයුතු කරන ඒ රණවිරුවාගේ දීමනාව කපා හැර තිබෙනවා. මෙන්න මේකද කටයුත්ත? අද බුද්ධි අංශය පාවා දෙනවා.

අපි අහනවා. සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා කෑගැහුවා. මට මතක් වෙනවා බටලන්ද වදකාගාරය. මූලාසානරූඪ ගරු මන්ත්‍රීතුමනි, බටලන්ද වදකාගාරය අපට මතක් වෙනවා. අපි ඒ දවස්වල ගියේ ඒ පාරේ. 8000 ක් මැරුවා. අද ඒවාට මොකද වුණේ? එහෙම නම් කට ඇරලා කථා කරන්න ඕනෑ. මෙතැන ඉන්නවා, ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමන්ලා. තමුන්නාන්සේලා එදා අමුවේ පාරේ කැලි කැලිවලට කපලා, ටයර් සෑයවල් දාලා හැම තැනම මරලා දාලා ගියා. අද මම හිතන්නේ, එක්සත් ජාතික පක්ෂයත් එක්ක දීග කනවා. අද දීග කනවා. ඒකයි සැබෑ තත්ත්වය. මූලාසානරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමාගේ යෝජනාවට අපි හදවතින්ම ස්තූතිවන්ත වෙනවා. හැබැයි අවශ්‍ය කරන (බාධා කිරීමක්) –

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය, කවුද රිවඩ් ද සොයිසා නැති කළේ?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

අද මේ සියල්ල අමතක වෙලා. මට මතකයි සරත් ෆොන්සේකා මැතිතුමාව -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තාජුඩීන්ට මොකද වුණේ?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

මරාගෙන මැරෙන -

[සභාවේ ඝෝෂා]

කදවුරට ඇතුළත් වනකොට මරාගෙන මැරෙන බෝම්බයකට අසු වී බරපතළ ලෙස තුවාල වුණා. පිටරට (බාධා කිරීම්) අරගෙන ගිහිල්ලා සනීප කරන්න මහින්ද රාජපක්ෂ මැතිතුමා එතුමාට අවශ්‍ය කරන ශක්තිය ලබා දුන්නා. නැවත ජීවත ලබා දුන්නා. ප්‍රාණය ලබා දුන්නා. හැබැයි දැන් කාට කාටත් මහින්ද රාජපක්ෂ හොඳ නැහැ. අද මහින්ද රාජපක්ෂ මැතිතුමාට, ආරක්ෂක ලේකම්තුමාට පිංසිද්ධ වෙන්න තමයි, ත්‍රිවිධ හමුදාව, පොලීසිය ඇතුළු සමස්ත රණවිරුවන්ට පිං සිද්ධ වෙන්න තමයි අපි ඔක්කෝම දෙපයින් නැඟී සිටලා කෙලින් සිටින්නේ. අද මම හිතන්නේ මේක කාටත් අමතක වෙලා තිබෙනවා. ඒ නිසා මූලාසානරූඪ ගරු මන්ත්‍රීතුමනි, රණවිරුවාගේ අභිමානය රකින්න ඕනෑ නම් අද අපේ රණවිරුවා හිර ගෙදර දාන්න කථා කරන කට සදහටම නැති කරන්න ඕනෑ. එහෙම වුණොත් පුළුවන් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

රණවිරුවා අලෙවි කරන්න යන්න එපා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

මෙන්න මේ යෝජනාව -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

අද අපි සන්තෝෂ වෙනවා ඔබතුමා වැඩ බලන සභාපතිතුමා හැටියට මූලාසනයේ වාඩි වුණා. හැබැයි, කථා කරන කොට ඔබතුමාත් ආසනේ හිටියා නම් මට ගොඩක් දේවල් තිබෙනවා, අහන්න. දැන් ගරුත්වයක් තිබෙනවා මූලාසනයේ අසුන් ගැනීම නිසා. නැත්නම් මට අහන්න කිහිපයක් තිබෙනවා. මම මෙතැන හිටියා නම් අහනවා. ඒ නිසා අවස්ථාව ලබා දීම පිළිබඳව තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් අපේ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් ඔබතුමාට අවශ්‍ය කරන යම් දෙයක් පෞද්ගලිකව හරි අපි ඒ යුතුකම වෙනුවෙන් ඉටු කරනවා.

[ අ.භා.01.02 ]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මූලාසානරූඪ ගරු මන්ත්‍රිතුමනි, ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව ඉතාමත් වටිනා, වැදගත් යෝජනාවක් හැටියට අපි මේ සභාවේ අද විවාදයට ගත්තා. මම හැබැයි කනගාටු වෙනවා. අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා අනෙකුත් අමාත්‍යවරු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයක් අඩුවෙන් ඉන්න අවස්ථාවක තමයි විපක්ෂයේ ඉඳගෙන මේ යෝජනාවට අපි අදහස් ඉදිරිපත් කරන්නේ. මූලාසානරූඪ ගරු මන්ත්‍රිතුමනි, අපේ ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අනුව 1988 වකවානුවේ ප්‍රේමදාස ජනාධිපතිතුමා ඇති කරපු රණවිරු ගම්මානවල දැන් ජලය, නිවාස, මාර්ග, පාසල් අධ්‍යාපනය පිළිබඳව ගැටළු රාශියක් මතු වෙලා තිබෙනවා. ඒ රණවිරුවන්ට යම්කිසි සේවාවක් කරන්න මේ පළාත් සභාවට සැලැස්මක් හදා ගන්න කියලා - හැබැයි කථා කරපු අපේ මන්ත්‍රීතුමන්ලා කථා කළේ, ජනාධිපතිවරුන්ට ප්‍රසංශා කරන්නත්, ඒ වාගේම හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මහත්තයාව නිග්‍රහ කරන්නත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මාර්ගයෙන් මේ සභාවට එකක් කියන්න ඕනෑ. ජෙනරල් සරත් ෆොන්සේකා කියන්නේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හිටපු හමුදාපතිවරයෙක්. මේ හමුදාපතිවරයාත් එක්ක එකතු වෙලා එවකට හිටපු රජයේ ආරක්ෂක අංශයේ ප්‍රධානියා හැටියට හිටපු ජනාධිපතිතුමා මෙතුමාත් සමග සාකච්ඡා කරලා මේ යුද්ධය ඉවර කරන්න වැඩ කටයුතු කළා. ඒ යුද්ධය ඉවර කරන්න වැඩ කටයුතු කරන ගමන්ම 2001 දී සටන් විරාම ගිවිසුමක් අත්සන් කළේ, එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍යවරයා හැටියට. එහෙම නම් මෙන්න මේ සටන් විරාම ගිවිසුම විග්‍රහ කරමින් නොයෙකුත් මන්ත්‍රීතුමන්ලා සිය කථාවලදී නොයෙකුත් චෝදනා ඉදිරිපත් කළා. අපි කියන්න ඕනෑ. බුද්ධි අංශය පාවා දුන්නා කියලා තමුන්නාන්සේලා කියනවා. හැබැයි, අපි කියනවා, අපි බුද්ධි අංශය පාවා දුන්නේ නැහැ. බුද්ධි අංශයේ තිබුණු තොරතුරු ලබාගෙන, එදා ප්‍රභාකරන් එක්ක හිටපු කරුණාඅම්මාන්ව අරගෙන ඒ තොරතුරු සේවාවන් -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

තිලක් මාරපන මහත්තයාත් කිව්වා බුද්ධි අංශය පාවා දුන්නා කියලා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ යුද්ධය අවසන් කරන්න අතපය කඩාගෙන, ජීවිත නැති කරගෙන, ගෙවල් දොරවල් අහිමි කරගෙන කටයුතු කරපු රණවිරුවන්ට සේවාවක් ලබා දෙන්නයි මේ කටයුතු කළේ. එහෙම නම් අපි ඔබතුමන්ලාට මතක් කරන්න ඕනෑ, ජෙනරල් සරත් ෆොන්සේකා මහත්තයාව රණවිරුවෙකුටත් වැඩිය පල්ලෙහාට ආලා තිබුණේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන්. පඩි දුන්නේ නැහැ. ජම්පරයක් අන්දලා

0025

හිරේට දාලා තිබුණා. හැබැයි, අපි ප්‍රධානම රණවිරුවාට හොඳම වරප්‍රසාදය ලබා දුන්නා. (බාධා කිරීමක්) වත්මන් ජනාධිපතිතුමාත්, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් පිළිබඳව මතක් කරන්න ඕනෑ. රණවිරුවෝ දිහා අපි අරගෙන බැලුවා. අපි මේ ආණ්ඩුව හදලා තවම අවුරුද්දයි. මේ ආණ්ඩුව හදලා අවුරුද්දක් ඇතුළත රණවිරුවන් වෙනුවෙන් සැලැස්මක් හදලා තිබෙනවා, 2016 අයවැය වෙනුවෙන් ඒ අයට විශාල සහනයක් ලබා දෙන්න. ඒ අයගේ විශ්‍රාම වැටුප් ක්‍රමයට දීමනා වැඩි කරලා ලබා දෙන්න, ඒ අයට යම්කිසි සේවාවක් ලබා දීලා ඒ අයගේ දරුවන්ගේ අධ්‍යාපන මට්ටම උසස් තත්ත්වයකට ගෙන එන්න. ගම්මානවල තිබෙන පානීය ජලය, මාර්ග, ප්‍රවාහන වැඩ පිළිවෙළවල් කොටස් වශයෙන් සැලසුම් කරලා ක්‍රියාත්මක කරන්න බස්නාහිර පළාත් සංවර්ධන ව්‍යාපෘති යටතේ විශේෂ ව්‍යාපෘතියක් රණවිරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන්න නව රජය බලාපොරොත්තු වෙනවා කියන එකත් මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි කියන්න කැමැතියි මේ රණවිරුවන්ගේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වනකොට මේ සභාවේ මේ යෝජනාව තේරුම් ගන්න බැරි මන්ත්‍රීතුමන්ලා කොයි ආකාරයෙන්ද කථා කළේ කියලා බලන්න. එහෙම නම් ඔබතුමාගේ මාර්ගයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාට කියන්න ඕනෑ ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ - රණවිරු අධිකාරිය තිබෙනවා. මධ්‍යම ආණ්ඩුව කටයුතු කරනවා. ඒ වාගේම NGO සංවිධාන රණවිරුවන් වෙනුවෙන් කටයුතු කරනවා. මේ පළාත් සභාව වෙනුවෙන් යම්කිසි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්නය කියන එක තමයි එතුමා මේ යෝජනාවෙන් ඉල්ලලා තිබෙන්නේ. එහෙම නම් දැන් අපට වැරදිලා තිබෙනවා. මේ යෝජනාව සභාවට දාන්න ඕනෑ. කවුද මන්ත්‍රීවරයෙක් කථා කරලා කිව්වා මේ යෝජනාවෙන් ඇති වැඩක් නැහැයි කියලා. ඇයි? සභාවේ ප්‍රතිපාදන ගන්න නම්, සභාවේ යම්කිසි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න නම් යෝජනාව සභාවට දාලා සභාවේ අනුමැතිය වැඩි ඡන්දයෙන් ලබාගෙන ඒවා ක්‍රියාත්මක කළාට පස්සේ තමයි යම්කිසි අමාත්‍යවරයෙකුට මෙයට මුදල් ප්‍රතිපාදන ලබා දීලා රණවිරු ගම්මාන හඳුනාගෙන රණවිරුවන්ට සේවාවක් කරන්න පුළුවන් අයිතිය

0026

ලැබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනී. එහෙම නම් මම අවසාන වශයෙන් ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා. මේ යෝජනාව අද සභාවට එනවා. දැම්ම සභා ලේකම්තුමාට දැනුම් දීලා, මේ මන්ත්‍රීවරු තව කොහේ හරි ඉන්නවා නම් අපේ ඇමැතිවරු මේ සභාවට ගෙන්නලා මේ රට බේරා ගන්න ජීවිත පරිත්‍යාග කරපු රණවිරුවන්ගේ ගෞරවයට පාත්‍ර වෙන්න, මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු මීට වැඩි ප්‍රමාණයක් සිටිය යුතුයි. එදා සභාපතිතුමා කිව්වා මේ සභාව රැස් වන දවසේ උදේ 09.30 ට පටන් ගන්නේ. 01.30 ට අවසන් වෙන්නේ. සියලු මන්ත්‍රීවරුන් මේ සභා ගැබේ පුළුවන් තරම් රැඳී සිටින්න කියලා. අද 09.30 ට පටන් ගත්තා. 01.10 යි වෙලාව. වැදගත් යෝජනාවක් සභාවට ගෙනැල්ලා සම්මත කරගෙන මේ බස්නාහිර පළාත තුළ ජීවත් වන රණවිරුවන්ට සේවාවක් කරන්න යෝජනාව සම්මත කර ගන්න ඕනෑ වුණාම ඉන්න මන්ත්‍රී සංඛ්‍යාව දැක්කාම දුක හිතෙනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමා එක පාරටම කියනවා, අපි මේ සභාවේ මන්ත්‍රීවරු ගැන සොයා බලන්න ඕනෑ කියලා. ඊයේ මම දැක්කා පත්තරේක තියෙනවා. එහෙම නම් අද මම ඔබතුමාගේ මාර්ගයෙන් එතුමාට දැනුම් දීමක් කරනවා, ඡන්දය විමසන්න කලින් ඉක්මණට ඇවිල්ලා වාඩි වෙලා එතුමාගේ ගෞරවයත් ආරක්ෂා කර ගන්න කටයුතු කරන්නය කියන එක ඉල්ලමින් මේ යෝජනාව ඒකඡන්දයෙන් සම්මත කරගෙන මේ රණවිරුවන්ට පළාත් සභාවෙන් සේවාවක් ලබා දෙන්න පුළුවන් පළාත් සභාවක් බවට බස්නාහිර පළාත් සභාව පත් කර ගන්න ඔබ සියලු දෙනාගේම සහයෝගය මෙතුමාගේ යෝජනාවට ලබා දීලා කටයුතු කරන්න කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[ අ.භා.01.10 ]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. මේ යෝජනාව කාලෝචිත බව නම් ඇත්ත. මේ යෝජනාව ගෙන එන්නේ රණවිරුවෝ දංගෙඩියට යන කාල පරිච්ඡේදයේ. අපි කවුරුත් රණවිරුන්ට පිංසිද්ධ වෙන්න ඕනෑ කියනවා. ඒ වාගේම ඔවුන්ට ශක්තිය දෙන්න ඕනෑ කියනවා. ඔවුන්ට ගරු කරන්න ඕනෑ. කවුරු ගෙනාවත්

[ගරු ජගත් කුමාර ]

මේ යෝජනාව තුළ තිබෙන කාරණාව වැදගත්. හැබැයි මේක ප්‍රායෝගික නැති ප්‍රශ්නයක් තිබෙනවා. මේ රටේ රණවිරුවෝ ගැන කථා කරන කොට හැම තිස්සේම එවකට විපක්ෂය කථා කළේ, සරත් ෆොන්සේකාට මොකද වුණේ? රණවිරුවන්ගේ නායකයා. ප්‍රධානියා. හරි දැන් සරත් ෆොන්සේකාට ප්‍රශ්නයක් තිබුණා නම් එතුමා සම්බන්ධව සියලු ප්‍රශ්න විසඳලා එතුමාව වෙල් විදානේ තැනටත් පත් කරලා, අද ලොකු ගෞරවයක් දීලා අර සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ජනාධිපතිට එක Call එකක් දීලා රණවිරුවන්ගේ ප්‍රශ්න විසඳන්න කියලා කියන්න පුළුවන් වකවානුවක් තිබෙන්නේ. හැබැයි අද ඒ කිසිවක් වෙන්නේ නැහැ. එක රණවිරුවෙක් හිරේට ගිය පළියට සියලු රණවිරුවන්ට හානියක් වුණේත් නැහැ. ඒ වාගේම ඒ රණවිරුවාට සියලු තනතුරු, තාන්න මාන්න දුන්නු පළියට අද අනෙක් රණවිරුවන් සැලකිල්ලට ලක් වෙන්නෙත් නැහැ. ඒ නිසා අපි පැහැදිලිවම මේ වෙලාවේ කියන්න ඕනෑ, (බාධා කිරීම්) රණවිරුවන්ට සලකන්න ඕනෑ. ඔවුන්ට පළාත් සභාවෙන් කරන්න පුළුවන් දේ - රණවිරුවන් වෙනුවෙන් කරන්න පුළුවන් වැඩ කොටසක් මධ්‍යම රජයටයි කරන්න තිබෙන්නේ. හැබැයි මධ්‍යම රජය අද කරන්නේ මොකක්ද? එදා රණවිරුවන්ගේ නායකයා විධියට සරත් ෆොන්සේකා ගැන කියන කොට කිව්වේ, එතුමා තමයි යුද්ධය අවසන් කළේ කියලා. එහෙම එතුමා යුද්ධය අවසන් කළා කිව්වා නම් ඉතිහාසයට ගිහිල්ලා බැලුවාම මේ රටේ දුටුගැමුණු කුමාරයා කරපු දෙයක් නැහැ. දුටුගැමුණු කුමාරයා නොවෙයි. එදා හිටපු සේනාධිපතිවරුන් විතරයි කරලා ඇත්තේ. සෙබළු විතරයි කරලා ඇත්තේ.

අපි පැහැදිලිව කියනවා සරත් ෆොන්සේකා මහත්මයා කරපු යමක් තිබෙනවා. හැබැයි කලින් සිටිය අගමැතිවරුන්, ජනාධිපතිවරුන්ගේ කාලයේ ඒ හිටපු හැම ආණ්ඩුවක්ම කාලයේ එතුමාට යුද්ධය අවසන් කරන්න බැරි වුණා. එදා මේ යුද්ධය අවසන් කරන්න නිවැරැදි නායකත්වය දුන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා විතරයි කියලා අපි පැහැදිලිව කියනවා. එතුමාගේ නායකත්වය නිසයි මේ යුද්ධය අවසන් කළේ. මේ යුද්ධය අවසන් කරලා රණවිරුවන්ට නිසි නායකත්වය දුන්නා විතරක් නොවෙයි. ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැලසුවා. ඔවුන්ට පහසුකම් සලසලා ඔවුන්ගේ පවුල්වල දෙමව්පියන් පවා බලා ගන්න වැඩ පිළිවෙළක් හැදුවා. නමුත් මූලාසානරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද්ධය අවසන් කළාට පස්සේ අපට කනගාටුයි රණවිරුවන් ගැන ඔබතුමන්ලා කථා කළාට, එල්.ටී.ටී.ඊ. යේ දරුණු සිරකරුවෝ අද එළියට ඇද්දී රණවිරුවෝ හිර ගෙට යවමින් ඉන්නවා. දංගෙඩියට යවමින් ඉන්නවා. ඔවුන්ගේ දරු පවුල් අනාථ භාවයට පත් වෙලා තිබෙනවා. සරත් ෆොන්සේකාවත්, අද මේ කථා කරන මන්ත්‍රීතුමාවත් යෝජනා ගෙනාපු මන්ත්‍රීතුමාවත් ඒ රණවිරුවෝ ගැන කථා කරන්නේ නැහැ. අද අර සමහර මාධ්‍යවේදීන්ගේ සිද්ධිවලට. ඒ මාධ්‍යවේදියා හැබෑවට මැරුවාද? නැත්නම් වැළලුවාද? මුහුදු පතුලට දැම්මාද කියලා කියන්න පුළුවන් අය මේ ආණ්ඩුව ඇතුළත ඉන්නවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගිනි තිබ්බා, වාහනය ඇතුළට දාලා. පංගුවක් අයව ගිනි තිබ්බා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එහෙම ඉද්දී අහිංසක රණවිරුවෝ ගෙනැල්ලා, අහිංසක රණවිරුවන්ට බලපෑම් කරනවා. මේකට ගෝඨාභය මහත්තයා බලපෑම් කළා. එහෙම නැත්නම් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කණ්ඩායම්වලින් කිව්වා කියලා එහෙම සාක්කි දුන්නොත් විතරයි, ඒ රණවිරුවෝ නිදහස් කරන්නේ. මේ තුච්ඡ දේශපාලනය නිසා තමයි අද රට පස්සට යමින් තිබෙන්නේ.

තමුන්නාන්සේලා ඉස්සරහාට යමින් තිබුණු ආණ්ඩුවක් ගත්තේ. හැබැයි, අද පස්සට යන ආණ්ඩුවක් තිබෙන්නේ. ඒ නිසා අපි පැහැදිලිව කියනවා. මේවා සුරංගනා කථා විතරයි. මේවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මේවා ක්‍රියාත්මක කරන්න ඕනෑ නම් වැරදිකරුවන් ඒ තැන්වල තියලා නීතිය ක්‍රියාත්මක කරන්න. රණවිරුවන්ට නිසි තැනට එන්න මධ්‍යම රජයෙන් කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිමින්, මොන පක්ෂයෙන් යෝජනාව ගෙනාවත් මේ රණවිරුවන් වෙනුවෙන් සහයෝගය දෙන්නත් සූදානම් කියමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

[ අ.භා.01.14 ]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ද මේ සාකච්ඡා කරන්නේ කියන එක මේ කථා ටික ඇහුවාම ප්‍රශ්නයක් තිබෙනවා. මේ සාකච්ඡාවේදී යෝජනාව පිළිබඳව අදහස් දක්වන්න කලින් මට පළමුවෙන්ම දැන ගන්නට තිබෙන කාරණය තමයි යෝජනාව සංශෝධනයට ලක් කළාද කියන එක. මම හිතන්නේ, බොහෝ මන්ත්‍රීවරු කරපු කථා ඇතුළේ තිබුණේ 30 අවුරුදු යුද්ධය, 2009 මැයි මාසේ 19 වැනිදා අවසන් කරන්නට කළින් වුණු දේවල් පිළිබඳව කථාවක් තමයි මේ කරන්න යෙදුණේ. 2009 මැයි මාසේ 19 වැනිදා අවුරුදු 30 ක් පැවති යුද්ධය අවසන් වුණා. ඒ අවුරුදු 30 කට ඉස්සෙල්ලා වුණු දේවල් මේ කථා කළේ. ඊට ඉස්සෙල්ලා කථා කරලා බේර ගන්න තිබුණු ප්‍රශ්න මේ තිබෙන්නේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

නැහැ. දැන් වුණු ඒවත් කථා කළා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේ යෝජනාව අදාළ වෙන්නේ 2009 මැයි මාසේ 19 වැනිදායින් පස්සේ. රණවිරුවා මුහුණ දීලා තිබෙන, අද වන කල් ඔවුන්ට බලපාන කාරණා. ඒක 2009 –

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු මන්ත්‍රීතුමා, අද තිබෙන ප්‍රශ්න තමයි අපි කිව්වේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මහින්ද කසාය බීපු කට්ටිය.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

2009 මැයි මාසේ 19 වැනිදා වන තෙක් තිබුණු කාරණාත්, 2009 මැයි මාසේ 19 වැනිදායින් පස්සේ මේ 2016 ජනවාරි මාසේ 05 වැනිදා වන තෙක් රට පාලනය කරපු හැම කෙනාටම මේක අදාළයි. ඒක හිටපු මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් අදාළයි. වර්තමාන රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත් අදාළයි මේකේ තිබෙන දේවල්. ඒ නිසා මම කියන්නේ, මේ කාල වකවානුව තුළ සරත් ෆොන්සේකා මැතිතුමා යුධ හමුදාපතිවරයාගේ ඉඳලා ජනාධිපති අපේක්ෂකයා දක්වා ආවා. ජනාධිපති අපේක්ෂකයාගේ ඉඳලා පාර්ලිමේන්තු මන්ත්‍රී වුණා. පාර්ලිමේන්තු මන්ත්‍රීගේ සිට සිරකරුවා දක්වා ගමන් මග දියත් කරන්න සකස් කළා. ඒ වාගේම මහින්ද රාජපක්ෂ මැතිතුමා කියලා කියන්නේ, මේ රටේ අවුරුදු 30 ක් තිස්සේ පැවති යුද්ධය දිනන කොට මේ රටේ හිටපු ජනාධිපතිතුමා. අවුරුදු 30 ක යුද්ධය දිනන වෙලාවේ මේ රටේ හිටපු ජනාධිපති තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමා. අවුරුදු 30 ක යුද්ධය දිනපු ජනාධිපති තමයි -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

යුද්ධය දිනවපු ජනාධිපති. එහෙම කියන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

2005 ජනාධිපතිකම ගත්තේ කොහොමද? කොටි එක්ක (බාධා කිරීම්)

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා කථා කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අද වෙනස තියෙන්නේ

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

2005 දී ඩීල් දැම්මේ කවුද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අද මහින්ද රාජපක්ෂ මැතිතුමාව මරන්න එල්.ටී.ටී.ඊ. සංවිධානයේ කොටියාව ළඟ තියා ගෙන හිටපු මන්ත්‍රීව ළඟට අරගෙන, ඒ ෆයිල් එක හංගලා, ඇමතිකමක් දීපු

[ගරු කේ.ඩී. අරුණ දීපාල් ]

ජනාධිපතිතුමා තමයි මහින්ද රාජපක්ෂ මහත්තයා. අද හිටපු ජනාධිපතිතුමාව මරන්න එල්.ටී.ටී.ඊ. සංවිධානයේ බෝම්බකරුවාට ආරක්ෂාව දීපු මිනිහාත් මහින්ද රාජපක්ෂ මහත්තයා. කරුණාව දැක්වුවා බුද්ධාගමට අනුව. කරුණාව දැක්වුවා. ඒ නිසා අද තිබෙන ප්‍රශ්න ඔය කියන ඒවා නොවෙයි. අද සැබෑ ලෙසම රණවිරුවාගේ තත්ත්වය මොකක්ද? කාලයක් රණවිරුවා මහ පාර අතු ගානවා. එළවළු විකුණනවා. එළවළු වවනවා. රණවිරුවා කෑම විකුණනවා. බත් විකුණනවා. පාර අතු ගානවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

දැන් නැද්ද? බියගම පැත්තේ එන්න. අන්න රණවිරුවෝ -

[සභාවේ ඝෝෂා]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

විග්නේෂ්වරන් මහ ඇමතිතුමා කියලා තිබුණා -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු මන්ත්‍රීතුමා, කඩේ යන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

අන්න රණවිරුවෝ බියගම ජොගින් ට්‍රැක්ස් සුද්ධ කරනවා. කාණු කපනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

උතුරේ මහ ඇමතිතුමා කියලා තිබුණා හමුදාව කාණු සුද්ධ කරන්න දාන්න කියලා. ඕගොල්ලන්ගේ ආණ්ඩුවේ කට්ටිය.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, මම කිව්වේ නැහැ - ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා කියනවා මහින්ද මහත්තයා කියලා. මම කිව්වේ නැහැ නේ එහෙම නමක්.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

දැන් ඔබතුමා ආණ්ඩුවට කඩේ යනවා. කොළඹ සුද්ධ කරන්න එන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මම හිතනවා, ජගත් මන්ත්‍රීතුමා කියන එක ඇත්ත කියලා. එහෙම කාල වකවානුවක් මේකේ තිබුණා. මහ පාර අතුගානවා රණවිරුවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඕගොල්ලන්ගේ ආණ්ඩුව දැන් දාන්නේ ඕක. දැන් කියන්නේ, උතුරේ හමුදාව කාණු සුද්ධ කරන්නය කියලා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

Come Back ටී ෂර්ට් එක ඇඳගෙන රණවිරුවා මහා පාර අතුගානවා අපි ඇස් දෙකට දැක්කා. අදත් ඒක එහෙම තිබෙනවා නම්, අදත් වැරදියි. ඒක එදත් වැරදියි. එදා කරපු එක නිවැරදි වෙන්නේ නැහැ -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

අදත් තිබෙනවා. එන්න බියගමට. ආරක්ෂක ඇමතිතුමා ඉන්නවා බියගම. අදත් රණවිරුවෝ ඒවා කරන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ආණ්ඩුව කවුරු වුණත් එහෙම කළා නම් වැරදියි. අද රණවිරුවාට තිබෙන ප්‍රශ්න මොනවාද? මේ රණවිරු ගම්මානවල ඉන්න රණවිරුවන්ගේ දරුවන්ට තිබෙන්නේ අධ්‍යාපන ප්‍රශ්න විතරක් නොවෙයි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමා බොහොම පරිස්සමින් කථා කරන්නේ. ලොක්කාට බයෙන් කථා කරන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලිව කල්පනා කරලා බලන්න. මේ බස්නාහිර පළාතට මේ යෝජනාව ඇවිල්ලා තිබෙන්නේ. සරත් ෆොන්සේකා මැතිතුමාට මධ්‍යම ආණ්ඩුවට කෝල් එකක් දීලා, ජනාධිපතිතුමා හමු වෙලා කියලා, අගමැතිතුමා හමුවෙලා කියලා විසඳන්න පුළුවන් ප්‍රශ්න තිබෙනවා. මේ අපි පළාත් සභාව. කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක තුනට අදාළ -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඉතින් ඕගොල්ලෝ පළාත් සභාවට ආවේ සරත් ෆොන්සේකාගෙන් නේ? ඉතින් කථා කරන්න එපැයි ඒ නායකයාට. මේවා පළාත් සභාවෙන් නොවෙයි, මධ්‍යම ආණ්ඩුවෙන් කරන දේවල්. මධ්‍යම ආණ්ඩුවෙන් මොනවාද කරන්නේ?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කල්පනා කරලා බලන්න. රණවිරුවා රාජ්‍ය ආයතනයකට ආවාම පළාත් සභාවෙන් පාලනය වන රාජ්‍ය ආයතනයකට රණවිරුවා ආවාට පස්සේ, මේ පළාත් සභාවට කරන්න පුළුවන් දේ අපි කථා කරමු.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේකේ ඒවායි, ඒකේ ඒවායි දෙකම වැදගත් මේ රටේ ජනතාවට.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඕගොල්ලෝ විපක්ෂයේ ඉන්න කොට අපට යෝජනා දුන්නේ -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු මන්ත්‍රීතුමා, මගේ වෙලාවත් අරන් ඔබතුමා කථා කරන්න. නැත්නම් ඔබතුමා තව විනාඩි පහක් ඉල්ලා ගන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

හරි. ඔබතුමා පරිස්සමින් කථා කරන්න. නායකයාව බේරා ගෙන කථා කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

රණවිරුවාට බස්නාහිර පළාත් සභා සීමාව ඇතුළේ ප්‍රවාහන පහසුකම් ලබා දීමේදී, පළාත් සභාවට පුළුවන්කමක් තිබෙන්න ඕනෑ - ලලිත් වනිගරත්න ඇමතිතුමාට අදහසක් තිබෙනවා නම්. පුළුවන්කමක් තිබෙන්න ඕනෑ සියලු රණවිරුවන්ට නොමිලයේ ප්‍රවාහන පහසුකම් සපයන්නට. නොමිලයේ ගමන් බිමන් යන්න පාස් එකක් දෙන්න. එහෙම රණවිරුවන්ට සලකන්න පළාත් සභාව ඇතුළේ ක්‍රියාත්මක විය යුතුයි කියලා මේ යෝජනාව හරහා කල්පනා කරන්න ඕනෑ. ඒ රණවිරුවන්ට රාජ්‍ය ආයතනයකට ගියාට පස්සේ -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඇයි මහ ආණ්ඩුවෙන් ඉල්ල ගන්න තිබුණා නේ? ඇයි අනෝමා ෆොන්සේකා ඉන්නේ රණවිරු අධිකාරියේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මධ්‍යම ආණ්ඩුවට ගේන්න කෝ. එතකොට පළාත් සභා නොවෙයි මුළු රටම පිළිගන්නවා නේ? ආයිත් මේ පළාත් සභාවේ විතරක් ඕක ඕනෑ යෑ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අද මොහොතක් කල්පනා කරලා බලන්න. (බාධා කිරීම්)

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර කථාව අවසන් කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මට එක තත්පර 30 ක් දෙන්න. මේ යුද්ධය ඇතුළේ -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna sanjeeva

ඔයාටත් ටිකට් එක දෙනවා පක්ෂයෙන්.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඔබතුමාට දැන් බණ්ඩාරගම යූ.එන්.පී. එකෙනුත් නැහැ. දැන් මෙහෙත් නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ටිකට් එක කවුරු දුන්නත්, නොදුන්නත් ඊළඟ පළාත් සභාවෙත් මම ඉන්නවා. ඒ නිසා කරුණාකරලා කවුරුවත් කලබල වෙන්න එපා. ඊළඟ පළාත් සභාවෙත් මම ඉන්නවා. ටිකට් ගැන ප්‍රශ්නයක් කර ගන්න එපා. මම ටිකට් කලින්ම අරගෙන ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එක දෙයයි කියන්නේ. අද අඩුම තරමේ රණවිරුවන් ගැන අපි කථා කරන කොට ආබාධිත වූ රණවිරුවෝ ඉන්නවා. කකුල් නැති අය ඉන්නවා. අත පය නැති අය ඉන්නවා. අපි තවම සමත් වෙලා තිබෙනවාද ගරු සභාපතිතුමනි, රාජ්‍ය ආයතනයකට රෝද පුටුවෙන් එන රණවිරුවාට රෝද පුටුව තල්ලු කර ගෙන එන්න පුළුවන් ගමන් මග හදලා දෙන්න. ජාත්‍යන්තර වශයෙන් අපි පිළිඅරගෙන තිබෙනවා. අපි පිළිඅරගෙන තිබෙනවා. පඩි පෙළ දිගේ නැගලා එන්න ඕනෑ. පඩි පෙළ නැතිව රෝද පුටුව තල්ලු කර ගෙන එන්න පුළුවන් රාජ්‍ය ආයතන නැහැ. අද බස් එකට නගින්න පුළුවන්ද රණවිරුවෙකුට. තමන්ගේ ඒ අපහසුතාවය නිසා. ඒ නිසා මේ කාරණා ටික හදලා සරත් ෆොන්සේකා මැතිතුමාට කරන්න පුළුවන් ටික එතුමා -

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා. වෙලාව පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා වෙලාවට කථාව අවසන් කරන්න.

[ අ.භා.01.22 ]

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. අපේ ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා රණවිරුවෙක් නොවුණත් රණවිරුවන් වෙනුවෙන් ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව කාලෝචිත යෝජනාවක් නොවෙයි. මේක මීට ඉස්සෙල්ලා කළ යුතු කාර්යභාරයක් හැටියට තමයි මම දකින්නේ. මම මේ විෂය සම්බන්ධයෙන් කථා කරන කොට කුමන පක්ෂයක අපි හිටියත්, මේ රණවිරුවෝ කියන පිරිස එක්සත් ජාතික පක්ෂයේවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේවත් මිනිස්සු නොවෙයි. මේ රණවිරුවන්ගේ අතීතය ගැන අපි සොයලා බලන කොට එක්සත් ජාතික පක්ෂය මේ රට පාලනය කරපු අවදියේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ රට පාලනය කළ අවදියේත් මේ රටේ යුද්ධය කළේ එකම රණවිරුවෝ. මේ රණවිරුවෝ වෙනස් වුණේ නැහැ. යුධ නායකයෝ සමහර විට වෙනස් වුණාට, දේශපාලන නායකත්වය රටේ වෙනස් වුණාට එදා හිටපු රණවිරුවෝම තමයි යුධ ජයග්‍රහණයේදී එදා නිර්භීතව මේ යුද්ධයට මුහුණ දීලා යුද්ධය ජයග්‍රහණය කරවන්නට යෙදුණේ. මේ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේදී මා දකිනවා. මෙහි කියලා තිබෙනවා. රණවිරු ගම්මානවල ඉන්න රණවිරුවන්ගේ සෞඛ්‍ය, අධ්‍යාපන, පානීය ජලය, ඒ වාගේම ප්‍රවාහන කටයුතු පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. අපි ඔවුන්ගේ තිබෙන ප්‍රශ්න නිරාකරණය කිරීම වැදගත් කියලා. මම පුද්ගලිකවම දන්නවා. මුළු ශ්‍රී ලංකාවේම තිබෙනවා, රණවිරු ගම්මාන 48 කට ආසන්න ප්‍රමාණයක්. ශ්‍රී ලංකාවේම තිබෙන රණවිරු ගම්මාන 48 ට ආසන්න ප්‍රමාණයේ - (බාධා කිරීමක්)

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

රණවිරු ගම්මාන හැදුවේ කවුද?

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ඒක අදාළ නැහැ මට.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

රණවිරු ගම්මාන හැදුවේ රණසිංහ ප්‍රේමදාස මැතිතුමා.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ඒක හොඳ වැඩක්. ගරු මන්ත්‍රීතුමා ඒක හොඳ වැඩක්. මම දකින්නේ, රණවිරු ගම්මානවල තිබෙන අඩුපාඩු අපි කුමන පක්ෂයක -

0025

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

යුද්ධය දිනුවේ කවුද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යුද්ධය දිනුවේ සරත් ෆොන්සේකයි. මහින්ද රාජපක්ෂයි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඊට ඉස්සෙල්ලා හිටියේ නැද්ද හමුදාවේ අය.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

යුද්ධය පටන් ගත්තේ කොයි කාලයේද?

[සභාවේ ඝෝෂා]

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා රණවිරුවන්ට ගෙවල් හැදුවේ නැහැ. ත්‍රිවිධ හමුදාවේ රැකියා කරන අයට ගෙවල් දුන්නා. යුද්ධය වෙනුවෙන් ජීවිතය පුජා කරපු, ශරීර කොටස් පරිත්‍යාග කරපු අයට ගෙවල් හැදුවේ නැහැ.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු මන්ත්‍රීතුමා, අපි දකිනවා. රණවිරු ගම්මානය තුළ තිබෙන - (බාධා කිරීම්) අපි දන්නවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙන යෝජනාවේ යථාර්ථයක් අපි දකිනවා. අද රණවිරු ගම්මානවල අඩුපාඩු තිබෙනවා. මේ රණවිරු ගම්මානවල තිබෙන අඩුපාඩුවලට විසඳුම් සොයන්නට බස්නාහිර පළාත් සභාවේ රණවිරු මන්ත්‍රීවරු හැටියට අපි පසුගිය රජය කාලයේත් උපරිම උත්සාහයක් දැරුවා. ඒ වාගේම පසුගිය රජය කාලයේදී අපි රණවිරුවන් වෙනුවෙන් අතිගරු හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, ඒ වාගේම හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් තමයි ඒකරාශී වෙලා මේ රණවිරුවන් වෙනුවෙන් කළ හැකි උපරිම කාර්යභාරය ඉතිහාසයේ ඉෂ්ට කරලා තිබෙන්නේ. විශේෂයෙන් ගෝඨාභය රාජපක්ෂ

0026

කියන ආරක්ෂක ලේකම්තුමායි කියන එක මම පැහැදිලිවම කියනවා. දකුණු ආසියාවේ තිබෙන විශාලතම යුධ හමුදා රෝහල හැදුවේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. මේ රටේ ත්‍රිවිධ හමුදා මූලස්ථානයක් නිර්මාණය කරන්න කටයුතු කළා. නමුත් අවාසනාවකට අද ඒක නැවතිලා තිබෙනවා. නමුත් රණවිරුවන් වෙනුවෙන් අබිමංසලවල් සාදමින් රණවිරුවන්ගේ පවුල් වෙනුවෙන් දිය යුතු සියලුම වරප්‍රසාද පසුගිය රජය තුළදී මේ රණවිරුවන් වෙනුවෙන් අපි ලබා දීලා තිබෙනවා. රණවිරුවන් වෙනුවෙන් අපි පාසල් නිර්මාණය කළා. රණවිරුන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කළ යුතු උපරිම කාර්යභාරය පසුගිය රජය තුළදී අපි ඉෂ්ට කළාය කියන එක භය නැතිව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම රණවිරුවන් කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පක්ෂයක් පාටක් තිබෙන පුද්ගලයෝ නොවෙයි. රණවිරුවන් වැඩ කළේ රට වෙනුවෙන්. රණවිරුන්ගේ අනාගතය, රණවිරුවන්ගේ සෞඛ්‍යය, රණවිරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කථා කරන්නට කුමන දේශපාලන පක්ෂයක් වුණත් රණවිරුවන්ගේ අනාගතය ගැන සලකා බලන්නට සෑම දේශපාලන පක්ෂයක් වුණත් උත්සාහ ගත යුතුයි. ඒ නිසා මා දකිනවා, ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ යෝජනාව මම ඉතා ගරුත්වයෙන් සලකනවා. නමුත් මම දකිනවා. කොළඹ දිස්ත්‍රික්කය තුළ රණවිරු ගම්මාන දෙකක් තිබෙනවා. මේ රණවිරු ගම්මාන දෙකෙන් එකක් කොස්ගම රණවිරු ගම්මානය සහ අනික් එක පැලැඳගොඩ හෝමාගම ආසනයට අයත් රණවිරු ගම්මානය. මම රණවිරු මන්ත්‍රීවරයෙක් හැටියට පසුගිය රජය කාලයේ මම උපරිම උත්සාහයක් දැරුවා. පැළෑඳගොඩ රණවිරු ගම්මානයට මේ වන තෙක් පානීය ජල පහසුකම් නැහැ. මේ රණවිරු ගම්මානයට පානීය ජලය ලබා දෙන්නට එදා අපි උපරිම උත්සාහයක් දැරුවා. නමුත් තිබුණු එක එක ප්‍රශ්න නිසා ඒ ප්‍රදේශයට පානීය ජලය දෙන්න පුළුවන් තරම් ප්‍රමාණවත් ධාරිතාවකින් වතුර ලබා ගන්න පුළුවන් ක්‍රමවේදයක් නැතිකම නිසා අපට එදා රණවිරු ගම්මානයට පානීය ජලය ලබා දෙන්නට බැරි වුණා. ඒ නිසා මම දකින්නේ, අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්, අපේ රණවිරුවන්, ඒ වාගේම ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මැතිතුමා ගැන කථා කළා. මා දකින්නේ, ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මැතිතුමා කියන්නේ, රණවිරුවෙක් පමණයි. රණවිරුවෝ හැටියට එතුමා සමස්ත රණවිරු

[ගරු ප්‍රදීප් උඳුගොඩ]

ප්‍රජාවම නියෝජනය කරන පුද්ගලයෙක් නොවෙයි. එතුමා යුධ හමුදාවෙන් විශ්‍රාම ගිහිල්ලා ඉන් අනතුරුව දේශපාලනයට ආවාට පස්සේ ඔහු සමස්ත රණවිරු ප්‍රජාව නියෝජනය කරන මනුස්සයෙක් නොවෙයි. නමුත් එතුමා රණවිරුවෙක් හැටියට අපි ගරු කළත්, දේශපාලන නායකයෙක් හැටියට ඔහුගේ ප්‍රතිපත්තිවලට අපි රණවිරුවන් හැටියටත්, දේශපාලඥයන් හැටියටත් විරුද්ධයි. නමුත් ඔහු රණවිරුවන් වෙනුවෙන් කළ යුතු ඒ කාර්ය භාරය, රණවිරුවන් වෙනුවෙන් පෙනී සිටිමින්, රණවිරුවන් වෙනුවෙන් යම්කිසි කාර්යභාරයක් කළාද කියන ඒ අවිශ්වාසය අද අපට පැන නැඟිලා තිබෙනවා. ඒ නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. අපේ ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්. ඒ වාගේම ගරු සභාපතිතුමා මූලාසයේ රැඳී සිටින කොට කිව්වා, රණවිරු මන්ත්‍රීවරු ඉන්නවා. කවුරුත් කථා කරන්නේ නැහැයි කියලා. නමුත් අපි මේ මාතෘකාව වෙනුවෙන්, මේ විවාදයට අපි ඉල්ලුවේ පැය 01 ½ ක කාලයක් නොවෙයි. මේ විවාදය අපට පැය 04ක්, නැත්නම් පැය 05 ක් දෙන්න තිබෙද්දීත් ඒකට ලබා දුන්නේ පැය 1 ½ ක් වැනි ඉතාමත් සුළු කාලයක්. ඒ නිසා ඒ පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. මේ යෝජනාව ගෙනෙන වේලාවේ කථා කරන්න ගරු මන්ත්‍රීවරු සිටියේ නැහැ. නමුත් දැන් කාලය දීර්ඝ කරන්නත් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා කරුණාකර කාලය දීර්ඝ කරන ලෙසට මම ඉල්ලා සිටිනවා.

# රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 30

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, *"දැන් සභාවේ කාලය විනාඩි 10 කින් දීර්ඝ කළ යුතු යැයි"* යෝජනා කර සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[ අ.භා.01.31 ]

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව පිළිබඳව මම හිතන්නේ, මේ සභාවේ ගොඩක් ගරු මන්ත්‍රීවරු කථා කළා. ඒ කථා කරපු බොහෝ දේවල්වල එක එක්කෙනාට චෝදනා කර ගැනීම් තමයි අපට දකින්න ලැබුණේ. ඒ නිසා අපි දන්නවා, මේ ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවේ තිබුණේ රණවිරු ගම්මානවල ජීවත්වන රණවිරුවන්ගේ දෙමව්පියන්, දූවා දරුවන්ට ඒ අවශ්‍ය කරන පහසුකම් සපයා දීමේ කියන යෝජනාවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි අපි දන්නවා, මා ජීවත්වන කළුතර දිස්ත්‍රික්කයේත් රණවිරු ගම්මාන කිහිපයක් තිබෙනවා. ඒ ගම්මානවලින් මා ජීවත් වන ප්‍රදේශයටම ආවේණික වූ රණවිරු ගම්මානයක් තිබෙනවා. අරියගම රණවිරු ගම්මානය කියලා. මේ ගම්මානයට අද අපි ගියොත් එහෙම, එහි තිබෙන තත්ත්වය ගත්තොත්, ඒ ප්‍රදේශයේ පවුල්වල ජනතාව ජීවත්වන තත්ත්වය ගත්තොත් එහෙම ඉතාම ඛේදජනක තත්ත්වයක් තමයි තිබෙන්නේ. රණවිරු ගම්මානවලට ඇතුල් වෙන මාර්ග ගත්තොත් එහෙම ඉතාමත් අබලන් තත්ත්වයේ තිබෙන්නේ. මට මතකයි, මීට අවුරු දෙකකට විතර උඩදී ඒ රණවිරු ගම්මානය හඳුන්වන්න, ප්‍රධාන ගාලු පාරේ වාඩිය මංකඩ කළුතර දිස්ත්‍රික්කයේ ඒ රණවිරු ගම්මානය හඳුන්වන්න විශාල බෝඩ් එකක් පවා ගාලු පාරට ආසන්නයේ ප්‍රදර්ශනය කරලා තිබුණා. මේ මෑතකදී අපි දැක්කා. දැනට වසර 02 කට විතර දී සම්පූර්ණ බෝඩ් එක, රණවිරු ගම්මානයට යන මාවත අසළ ඇති නාම පුවරුව සම්පූර්ණයෙන් මේ වන විටත් පෙරළා දාලා තිබෙනවා. අපි දකිනවා, ඒ රණවිරු ගම්මානවලට අද තිබෙන සැලකිලිවල තත්ත්වය. ඒ නිසා ඒ රණවිරු ගම්මානවල ජීවත්වන නිවැසියන්ට, දූවා දරුවන්ට අවශ්‍ය කරන පහසුකම් සැපයීමේදී ඇත්ත වශයෙන්ම අපි බස්නාහිර පළාත් සභාව හැටියට මීට වැඩිය සොයා බැලීමක් කරලා, ඔවුන්ගේ දරුවන්ගේ ජීවන තත්ත්වයන් ගැන සොයා බලලා ඔවුන්ගේ සෞඛ්‍යය

තත්ත්වය ගැන සොයා බලලා ඒ වාගේම ඒ පවුල්වල වැඩිහිටියන්ගේ ජීවන තත්ත්වය සෙයා බලන ගමන් ඔවුන්ගේ අනිකුත් පහසුකම් ගැන සොයා බලන්න ඕනෑ. මහා මාර්ග ගත්තොත් එහෙම, ජල පහසුකම් ගත්තොත් එහෙම මෙවැනි දේවල් අපි සොයා බලලා අපි බස්නාහිර පළාත් සභාව හැටියට යම් ක්‍රියා මාර්ගයක් ගන්නවා නම්, එය තමයි මම හිතන්නේ, මේ යෝජනාව ගෙනෙන මන්ත්‍රීතුමාගේ බලාපොරොත්තුව තිබෙන්නේ. ඒ නිසා බස්නාහිර පළාත් සභාව හැටියට බස්නාහිර පළාත් සභාවේ කළුතර දිස්ත්‍රික්කය, කොළඹ දිස්ත්‍රික්කය, ගම්පහ දිස්ත්‍රික්කවල තිබෙන මේ රණවිරු ගම්මානවල ඒ තිබෙන තත්ත්වයන් ගැන සම්පූර්ණ සොයා බැලීමක් කරලා ඊට අදාළ පහසුකම් සැපයීම තමයි මම හිතන්නේ අපි කළ යුත්තේ. ඒ නිසා අපි දන්නවා. නොයෙක් විට මේ රටේ නායකත්වයට පත් වන බොහෝ දෙනා රණවිරුවන් විකුණමින්, ඔවුන්ගේ ජීවන තත්ත්වයන් ගැන උදව් කරනවා කියලා බලයට ආවා. මට මතකයි පසුගිය කාලයේ රණවිරුන්ගේ පවුල්වලට තුන් වැනි දරු උපතේදී රුපියල් ලක්ෂයක් දෙනවා කිව්වා. එවැනි පොරොන්දු දුන්නා. එවැනි තත්ත්වයක් සම්පූර්ණයෙන් නැතිව ගිහිල්ලා තිබෙනවා. ඔවුන්ගේ පවුල් නඩත්තු කර ගැනීමේදී අපි දැකලා තිබෙනවා, ඒ හමුදාවේ ඉන්න සොල්දාදුවෝ අසරණ වෙලා ඉන්න සමහර අවස්ථා.

ඒ නිසා මේ අවස්ථාවේදී මේ ගෙනෙන ලද යෝජනාවට අනුව බස්නාහිර පළාත් සභාව තුළ ඒ කළුතර, කොළඹ, ගම්පහ කියන දිස්ත්‍රික්කවල රණවිරු ගම්මානවල ජීවත් වන ඔවුන්ගේ දරුවන්, දෙමව්පියන් ඇතුළු මේ ගම්මානවල ජීවත්වන සියලුදෙනාගේ පහසුකම් සපයන වැඩ පිළිවෙළක් අපි බස්නාහිර පළාත් සභාව තුළ හදලා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ඉදිරියේදී ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස ඉල්ලීමක් කරනවා. ඒ වාගේම ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා වෙන යම් ක්‍රියා මාර්ග මේ අමාත්‍යාංශවලින් අපට කරන්න පුළුවන් නම්, ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ක්‍රියා මාර්ග සොයා බලලා ඔවුන්ට උදව් කරන්න පුළුවන් නම්, ඒ තමයි මම හිතන්නේ අපි බලාපොරොත්තු විය යුත්තේ. ඒ නිසා අපි පක්ෂයක් හැටියට ඉල්ලා සිටිනවා. ත්‍රිවිධ හමුදාවේ සේවය කරන සියලු දෙනා වෙනුවෙන්, ඒ මොහොතේ නායකත්වය දුන්නු ත්‍රිවිධ හමුදාවේ සොල්දාදුවන් වෙනුවෙන්, ගම්මානවල ජීවත් වන ඔවුන් වෙනුවෙන් විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරලා බස්නාහිර පළාත් සභාව තුළින් ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම කරමින් මේ අවස්ථාවේ මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට පිළිතුරු කථාව සඳහා ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා.

[ අ.භා.01.34 ]

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මගේ යෝජනාව මේ පළාත් සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා හරි හැටි තේරුම් නොගැනීම ගැන මම කනගාටු වෙනවා. මොකද, මම අදහස් කළේ, මේ පළාත් සභාව තුළින් අපට පුළුවන් අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාත් කිව්ව ආකාරයට ප්‍රවාහන, ඒ වාගේම සෞඛ්‍ය අපේ පළාත් සභාව තුළින් පාලනය වන ආයතනවල නොමිලේ හරි යම්කිසි වැඩ පිළිවෙළක් හඳුන්වා දෙන්න. නමුත් මේක වැරැදි ආකාරයට තේරුම් ගැනීම පිළිබඳව මම කනගාටු වෙනවා. අපි අදහස් කරන්නේ, මේ පළාත් සභාව මැදිහත් වෙලා පළාත් සභාව ඇතුළේ ඒ කටයුතු කරන්නයි. මගේ නායක සරත් ෆොන්සේකා මැතිතුමා, එතුමාට හැකි ආකාරයට ඒ කටයුතු කරනවා. හැබැයි, අනවශ්‍ය බලපෑම් අපි කරන්න යන්නේ නැහැ. හැම දෙයක්ම ජනාධිපතිතුමාට, අගමැතිතුමාට කථා කර කර, කර ගැනීමේ එවැනි යුගයක් කරා යන්නේ නැහැ.

ඒ වාගේම මගේ කථාවේදී මම පැහැදිලිව ආරම්භයේදී කිව්වා, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා, වත්මන් කුරුණෑගල දිස්ත්‍රික්ක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා එතුමා දේශපාලන නායකත්වය දුන්නා වාගේම යුධමය නායකත්වය දුන්නේ, ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මැතිතුමා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලයක් තිබුණා. ඒ දේශපාලන නායකත්වය යුද්ධය දින්නයි කියලා සරත් ෆොන්සේකා මැතිතුමාට හමුදාපතිවරු තුන්දෙනාටම ලබා දුන්න ඉඩම් ඇතුළු ඒ සියලු වරප්‍රසාද, වරදාන එතුමාගෙන් උදුරා ගත්තා. ඒ හැම දෙයක්ම නැවත පවරා ගත්තා. අන්න ඒවා තමයි අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

දැන් එතුමාට සලකලා විතරයි. රණවිරුවන්ට සලකලා නැහැ නේ? පැහැදිලියි නේ?

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. කථා කරන්න දෙන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමා ඔක්කෝටම බාධා කළා. ඔබතුමා යෝජනාව ගෙනාවට හැමෝටම බාධා කළා. ඔබතුමා හැම මන්ත්‍රීවරයාටම - මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න දුන්නේම නැහැ. ඔබතුමා පටන් ගත්තු වෙලේ ඉඳන් බාධා කළා. ඔබතුමාට කථා කරන්න දෙන්න කිසිම යුතුකමක් නැහැ. යෝජනාව ගෙනාපු මනුස්සයා සාධාරණව ඉන්න ඕනැ. ඔබතුමා හැසිරුණේ මෙතැන පාතාලකාරයෙක් වාගේ.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ ඒ පවරා ගත්තු දේවල් අර ගත්තේ. ඒ නිවැරැදි තත්ත්වයයි ඇති කළේ. ඉතින් අපි පිළිගන්න ඕනැ. මේ යුද්ධය නිමා කිරීම පිටුපස ඒකේ ගෞරවය මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමාටවත්, සරත් ෆොන්සේකා මහත්මයාටවත් විතරක් නොවෙයි. එදා ඉඳලා ආපු සියලුම රාජ්‍ය නායකයන් මේක කළා. නමුත් අවසානය වුණේ මෙතැන. හරිම පුදුමයි මම දුක් වෙනවා මේ ආකාරයට - (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාගේ පක්ෂයේ කථා කරන්න අය හිටියේ නැහැ. අරුණ දීපාල් මන්ත්‍රීතුමාවත් බය කරලා කථා කෙරෙව්වා.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

මේක බොහොම කලින් ගෙනාපු යෝජනාවක්. කෙසේ වෙතත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, (බාධා කිරීම්) මේ දේවල් බලලා අපේ සියලුම මන්ත්‍රීතුමන්ලා (බාධා කිරීම්) රණවිරුවන් වෙනුවෙන් යමක් කරමු. මම නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාවේ විවාදය අවසන් වෙනවා. ඒ යෝජනාවට බෙදීමක් තිබෙනවාද?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එහෙමනම් ඉතින් මේ යෝජනාව සභාවේ සම්මත වූ යෝජනාවක් ලෙස තීරණය කරනවා.

# කල් තැබීම
# ADJOURNMENT

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

*"දැන් මම මෙම සභාව දැන් කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව පූ.භා. 01.37 ට, 2016 ජනවාරි මස 19 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 01.37 p.m. till 09.30 a.m, on 19.01.2016.*